ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත




විශ්වාසයේ වසර අළලා සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා විසින් නිකුත් කළ අනුශාසනා පත්‍රයෙන්....

**විශ්වාසයේ දොරටුව**

3 පිටුව



**150 සංවත්සරය සමරන ශුද්ධවූ පවුලේ නිකාය**

ශු. පවුලේ පැවිදි නිකායේ මෙතෙක් පැවති දූත කාර්යය පිළිබඳව කැරෙන ආවර්ජනයකි.

8-9 පිටුව



භෞතිකත්වය ඉක්මවා ගිය, පියවි දෙනුවණට ගෝචර නොවන සත්‍යයක් කරා ගමන් කරවිය යුතු තාරුණ්‍යය ගැනයි.

**සැබෑ තාරුණ්‍යයේ ශුද්ධාත්මයාණෝ**

12 පිටුව



2010 වසරේ හොඳම ආගමික පුවත්පත


# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජූනි 07





ක්‍රි.ව. 2012 ක් වූ ඔක්තෝබර් 07 ඉරිදා 147 වෙළුම 19 කලඹ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 QD/12/NEWS/2012 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.

## ඇක්වයිනස් උපාධි ප්‍රදානෝත්සවය

ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ප්‍රතිපත්තිය දියුණු නවීන ක්‍රම ඔස්සේ යළි සැකසිය යුතු අතර, උසස් අධ්‍යාපනයේ පවත්නා අර්බුදය සහ ශ්‍රී ලංකාවේ ජාතික උසස් අධ්‍යාපන ප්‍රතිපත්තියක් සැකසීමට විශ්වීය අත්දැකීම් උපයෝගී කරගත යුතු බැව් බොරැල්ල ඇක්වයිනස් සරසවි විද්‍යායතනයේ උප කුලපති ගරු ආචාර්ය ජ්ලැසිඩස් ද සිල්වා පියතුමා ඩිප්ලෝමා හා උපාධි ප්‍රදානෝත්සවයට සමගාමීව කළ වාර්ෂික වාර්තාවෙන් අවධාරණය කරයි. වැඩි විස්තර ලබන සතියේ

## ලෝක රදගුරු සංසදය ඔක්. 07 - 28 දක්වා

"ක්‍රිස්තියානි විශ්වාසයේ විකාශනය සඳහා නව ධර්මදානය" තේමාකරගත් ලෝක රදගුරු සංසදය ඔක්තෝබර් 07 සිට 28 දක්වා රෝමයේ දී පැවැත්වේ. මේ රදගුරු සංසදය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් බදුල්ල රදගුරු අති උතුම් වින්ස්ටන් ප්‍රනාන්දු දි.ස.නි. හිමිපාණෝ සහභාගී වෙති. ඒ අතර ආසියානු රදගුරු සම්මේලනයේ 40 වන සංවත්සරය වියට්නාමයේ දී පැවැත්වීමට නියමිතය.

## දෙවන වතිකාන කතිකාවේ 50 වන සංවත්සරය

ඔක්. 11 දින සෙඩෙක් ආයතනයේ පවත්වන 50 වන සංවත්සර උත්සවයේ දී ගොඩගේ කිතුනු පොත් ප්‍රකාශන කමිටුව මඟින් පොත් 2 ක් නිකුත් කිරීමට ද කටයුතු යොදා ඇත. එදින ගරු ඩී. ජේ. ඇන්තනි පියතුමා විසින් මුල්ම ලතින් පිටපත් සිංහලට පරිවර්තනය කොට ප්‍රකාශන 16 ක් සේ එළිදැක්වූ කතිකාවතේ සිංහල අනුවාදය සරළ පරිවර්තනයක් සේ නැවතත් එළි දැක්වීමට නියමිතයි.

## ගුවන් විදුලියෙන් නත්තල් බැති ගී තරගයක්

මේ වසරේ ද සිරිත් පරිදි ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් විවෘත නත්තල් බැති ගී තරගයක් සංවිධානය කරයි. ඔබ කණ්ඩායමත් ඊට සහභාගී වීමට කැමැති නම් ඔක්තෝබර් 19 වෙනිදාට පෙර අයදුම්පත් ලේකම්, කිතුනු උපදේශක සභාව, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව කොළඹ 07 ලිපිනයට එවන්න.




# විශ්වාසයේ වසරේ දී විශ්වාසය සවි ගැන්වීමට මුල්තැන

## කාදිනල් හිමිපාණන්ගේ චක්‍ර ලේඛනය දැනටමත් බලාත්මකයි

**අති උත්තම සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමන් විසින් ඔක්තෝබර් 11 වැනිදා ප්‍රකාශයට පත් කරන විශ්වාසයේ වසර කොළඹ අගරදගුරු වසම මුල්කර ගනිමින් දිවයිනේ සියලු රදගුරු වසම් හි ක්‍රියාත්මක කැරෙන බව ඥානාර්ථ ප්‍රදීපයට වාර්තාවේ.**

කොළඹ අගරදගුරු වසමේ ඔක්තෝබර් 07 ඉරිදා (අද) ප.ව. 6.00 ට කොටහේන සා. ලුසියා ආසන දෙව්මැඳුරේ දී විශ්වාසයේ වසර ගරු ගාම්භීරාකාරයෙන් ප්‍රකාශයට පත් කෙරේ. ඉදිරි වසර පුරා 2013 නොවැම්බර් 24 දින දක්වා විශ්වාසයේ වසර ක්‍රියාත්මක වේ. 15 පිටුවට ▶

## මීගමුවේ විනාශය අනාවරණ කරන්නට අගරදගුරු හිමිපාණෝ පෙරමුණ ගනිති

මීගමුවේ ඓතිහාසික වටිනාකම හා කිතුනු පුරාණය විනාශ කිරීමටත්, මීගමුව ආර්ථික දියුණුවට කතෝලිකකම නිසා බාධා පැමිණවීමත්, ධීවර ජනතා ප්‍රශ්නවලට විසඳුම් ලබා නොදීමත්, සංචාරක ව්‍යාපාරයේ මුවාවෙන් කඩොලාන විනාශ කරමින්, කලපුව ගොඩ කරමින් සිදුකරන පරිසර විනාශයත්, ළමා අපයෝජනය, ගණිකා ජාවාරම හා මත්කුඩු ජාවාරම ප්‍රචලිත කොට සදාචාරය බිඳ හෙළීමේ විවිධ බලවේගයන්හි වැයම් අනාවරණය කරමින් කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ මූලිකත්වයෙන් කලාපයේ පියතුමන්ගේ සහභාගිත්වයෙන් මාධ්‍ය හමුවක් පැවැත්විණි.

ඔක්තෝබර් 04 බ්‍රහස්පතින්දා මීගමුව තම්මිට කාදිනල් කුරේ ධර්මෝපදේශ මධ්‍යස්ථානයේ දී පෙරවරු 10.00 ට මේ මාධ්‍ය හමුව පැවැති අතර, කොළඹ අගරදගුරු පදවි මාධ්‍ය ප්‍රකාශක හා ජාතික කතෝලික ජනසන්නිවේදන අධ්‍යක්ෂ ගරු බෙනඩික් ජෝශප් පියතුමා ඇතුළු කලාපීය පියතුමන් විසින් සංවිධානය කර තිබිණි.

## සම්මත බයිබලය පමණක් පාසල්වලට



ශ්‍රී ලංකා බයිබල් සංගමය හා ශ්‍රී ලංකා කතෝලික රාජගුරු මණ්ඩලය විසින් අනුමත කරන ලද සිංහල හා දමිළ බයිබලය පමණක් පාසල් ළමුන් අතර පරිහරණය විය යුතු බව දන්වා ඇති අතර ඉහත අනුමැතිය නොමැතිව මුද්‍රණය වී ඇති බයිබල පාසල් දරුවන් අතර බෙදාහැරීමට කිසිදු අනුමැතියක් ශ්‍රී ලංකා බයිබල් සංගමය හෝ ශ්‍රී ලංකා කතෝලික රාජගුරු මණ්ඩලය ලබා දී නොමැති බව සියලු පාසල් ප්‍රධානීන් හට දන්වා යවා ඇත.

## සා. අන්තෝනි මුනි හෘද ධාතුව තැන්පත් මංජුසාව ශ්‍රී ලංකා මැණික් වලින් ඔප් නැංවේ

ශ්‍රී ලංකාව පුරා ප්‍රදර්ශනය කැරුණු සා. අන්තෝනි මුනි හෘද ධාතුව තැන්පත් මංජුසාව ශ්‍රී ලංකාවේ විවිධ පළාත් වලින් ත්‍යාග සේ ලැබුණු මැණික් වලින් සරසා ඉතාලියේ පාදුවා නගරයේ සා. අන්තෝනි බැසිලිකාවේ තැන්පත් කොට ඇත.



පසුගියදා එහිදී කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ දිව්‍ය පූජාව පවත්වා එම මංජුසාව ආසිරි ගැන්වූහ. පාදුවා බැසිලිකා සිද්ධස්ථානයේ පාලක ගරු එන්සොපොයියානා පියතුමා (වමේ) සහ ශ්‍රී ලංකා සංක්‍රමණිකයන්ගේ උපාධ්‍ය අතිගරු නෙවිල් ජෝ මාහිමිපාණෝ (දකුණේ) සමගින් ඉන් අනතුරුව ප්‍රදීප කැමරාවට පෙනී සිටි අයුරු...

## කුරුණෑගල කතෝලික රදගුරු වසමේ විශ්වාසයේ වසර ප්‍රකාශ කිරීම ඔක්තෝබර් 14 ඉරිදා

කුරුණෑගල රදගුරු වසමේ විශ්වාසයේ වසර ප්‍රකාශ කිරීම 2012 ඔක්තෝබර් 14 ඉරුදින මීසම් මට්ටමින් සංවිධානය කර ඇත. ඒ වෙනුවෙන් අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා රදගුරු හිමිපාණන්ගේ විශේෂ නිවේදනය පියතුමන් විසින් ඉරුදින දිව්‍ය පූජාවේදී කියවනු ලබනු ඇති අතර "විශ්වාසයේ වසර" අරබයා වැඩපිළිවෙලක් සහිත විශේෂ අනුශාසනා පත්‍රයක් ද එදින නිකුත් කැරේ. (සම්පූර්ණ නිවේදනය 14 පිටුවේ)

## අරාබිකරයේ සිංහල ධර්ම විවේකයක් මාසයක් පුරා

එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ වෙසෙන ශ්‍රී ලාංකික කතෝලික සංඝය සඳහා වාර්ෂිකව පවත්වන ධර්මවිවේකය ඔක්තෝබර් 07 සිට නොවැම්බර් 07 දක්වා දේශනාවාදී ගරු ශානිල් ජයවර්ධන නි.ම.නි. පියතුමන් විසින් සිදු කරනු ලැබේ.

ඔක්. 09 සිට 19 දක්වා සාජා සා. මයිකල්, ඔක්. 15 සිට 19 දක්වා අබුඩාබි සා. ජෝශප්, ඔක්. 23 සිට 26 දක්වා ඩුබායි සා. මරියා, ඔක්. 30 සිට නොවැ. 02 දක්වා ජබෙල් අලි සා. ප්‍රැන්සිස් අසීසි දෙව්මැඳුරුවල මෙය පැවැත්වෙන බැව් එරට උපාධ්‍ය ගරු වින්සන් විජේසූරිය පියතුමා ප්‍රදීපයට පැවසීය.

## කාදිනල් හිමිපාණන්ගෙන් ධර්මෝපදේශ සාකච්ඡා

විශ්වාසයේ වසර මුල්කොටගෙන ගිහි,ජනතාව අතර විශ්වාසයේ සරළ පැවැත්ම හා මූලික ධර්මෝපදේශය පිළිබඳව දැනුම්වත් කිරීමේ ප්‍රායෝගික වැඩපිළිවෙල කාදිනල් හිමිපාණන්ගේ මූලිකත්වයෙන් විවිධ මීසම් අතර ක්‍රියාවට නැංවීම ආරම්භ වී තිබේ.

ඒ අනුව ඔක්තෝබර් 21 වන ඉරිදා කොටහේන සා. ලුසියා ආසන දෙව්මැඳුරේදී ධර්මෝපදේශ සාකච්ඡාවක් සවස 6.00 ට පැවැත්වෙන අතර දෙසැ. 02 ඉරුදින දෙහිවල සා. මරියා දේවස්ථානයේ දී තවත් සාකච්ඡාවක් පැවැත්වේ.

## ගල්වැටිය 125 වන ජයන්ති සැමරුමේදී අලුත් නිවසක් පූජක අයිතියට

අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් ඔක්. 07 (අද) වත්තල ගල්වැටිය ජපමාල රාජේශ්වරියගේ දෙව්මැඳුරේ 125 වන මංගලෝත්සවයට සමගාමීව නව පූජක නිවස්නයක් විවෘත කිරීමට නියමිතය.

මේ පූජක නිවහනේ අවට පාසල්වල සේවයෙහි නියැලෙන කතෝලික පූජකතුමන් සයනමකට නේවාසික පහසුකම් සැලැසිය හැකි බව වත්තල මීසම් සේවක ගරු බැසිල් වික්‍රමසිංහ පියතුමා ප්‍රදීපයට පැවසීය.

**"දෙවියන් වහන්සේ එක් කළ අය, මනුෂ්‍යයා වෙන් නොකෙරේවා" (මාක් 10:2-16)**

පදවියෙන් පදවියට

# ඔබ කාටවත් කුරුසයක් වෙන්න එපා!

## සලාපුර රදගුරු හිමිපාණෝ මාරවිල කුරුස පල්ලියේදී පවසති

**ඔබ කාටවත් කුරුසයක් වන්න එපා. දෙමාපියන් දරුවන්ටත්, දරුවන් දෙමාපියන්ටත් අද කුරුස බවට පත්වී සිටිනවා. එසේම ඔබගේ ජීවිත ගමනේදී විශ්වාසය පෙරදැරිකරගෙන ගමන් කරන්න. දෙවිඳුන්ට කළ හැකි දේ බොහෝයැයි සලාපුර රදගුරු අතිඋතුම් වැලන්ස් මෙන්ඩිස් හිමි මෙසේ පැවසුයේ මාරවිල සිරිකුරුස ජාතික සිද්ධස්ථානයේ වාර්ෂික මංගල්‍යය දිනදීය.**

මෙදින රදගුරු හිමිපාණන් අතින් මාරවිල සිරි කුරුස සිද්ධස්ථානය නිලවශයෙන් ජාතික සිද්ධස්ථානයක් බවට ප්‍රකාශයට පත්කිරීමද සිදුකැරිණි. මෙවර මංගල්‍යය සඳහා සැදැහැවතුන් විශාල පිරිසක් එක්ව සිටියහ. සිද්ධස්ථාන පාලක ගරු අයිවන් පීටර් ප්‍රනාන්දු සහයක පියතුමන්ගේ අනුශාසකත්වයෙන් මංගල්‍ය කමිටුව හා එක්ව මෙවර මංගල්‍යය උත්කර්ෂවත්ව පැවැත්වුණි.

ගරු දිලංක නිර්මාන් පියතුමා

## දෙමිනිකාන නිකාය සේවා පුළුල් කරයි

ශුද්ධ වූ කැතරින් තුමියගේ දොමිනිකාන පැවදි සොහොයුරියෝ ළදරු හා ළමා අධ්‍යාපනය වෙනුවෙන් ද තරුණියන් සඳහා ස්වයං රැකියා වෙනුවෙන්ද මේ දිනවල සිය සේවාවන් මෙහෙයවමින් සිටිති.

ගාලු රදගුරු අතිඋතුම් රේමන් වික්‍රමසිංහ හිමිපාණන්ගේ මඟපෙන්වීම යටතේ වැලිගම කන්‍යාරාමය මුල් කොට ගනිමින් පාසල් හැර ගිය ගැහැනු ළමුන් සඳහා ජීවිත අවබෝධය හා ස්වයං රැකියා පුහුණු වැඩසටහනක් ගරු ජුලියට් ජයමාන්න සොහොයුරියගේ මූලිකත්වයෙන් දියත් කැරේ. මේ අතර පන්නිපිටිය මුල් කර ගෙන අතුරුගිරිය, මතුගම, නාගොඩ, ගුරුගල්ල, වැලිගම සහ මන්නාරම ප්‍රදේශ වල දොමිනිකාන කන්‍යාරාම මගින් ළදරු පාසල් අධ්‍යාපනය විධිමත්ව ක්‍රියාත්මක කෙරේ.

ක්‍රිස්ටෝපර් රණසිංහ

## මැල්වත්ත දියවර ගම්මානයේ ශුද්ධවූ මිඛායෙල් වාර්ෂික මංගල මෙහෙය



හලාවත පදවියේ හාල්දඬුවන මීසමට අයත් මැල්වත්ත දියවර ගම්මානයේ ශුද්ධවූ මිඛායෙල් අග්‍රදූත තුමන්ගේ දෙව්මැඳුරේ වාර්ෂික මංගල මෙහෙය කටුකෙන්ද දොන් බොස්කෝ දෙව්සත්හලේ ගරු මංජුල සැලේසියාන පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකැරිණ. ඉතා අලංකාර ලෙස සැරසූ ගමන් කරත්තයක අග්‍රදූතයාණන්ගේ ප්‍රතිමාව රැගත් පෙරහර ග්‍රාමය වටා ගමන් කිරීමට මොහොතකට පෙර හාල්දඬුවන මීසම් සේවක ගරු ප්‍රැන්සිස් ලාවුස් පියතුමා ප්‍රතිමාව ආසිරි ගන්වන අයුරු.

ජේ. බී. එච්. ලිවේරා



උතුරු කළුතර එකමුතු කිතුනු අවමංගල්‍යාධාර සමිතිය හා කළුතර ගෝල්ඩන් ජුබිලි සිංහ සමාජය ඒකාබද්ධව සංවිධානය කළ 'වෛද්‍ය සායනයක්' උතුරු කළුතර ගුරුළු ගෝමි විද්‍යාලයේදී පැවත්විණි. නොමිලේ ඇස් කන්ණාඩි ලබාදීම, දියවැඩියාව සඳහා රුධිර පරීක්ෂණ, අධි රුධිර පීඩන පරීක්ෂාව සහ බාහිර රෝගීන් සඳහා ප්‍රතිකාර සහ ඖෂධ නොමිලේ ලබාදීම සිදුවූ අතර, ප්‍රදේශ වාසී 800 ක් පමණ දෙනා ආගම් භේදයකින් තොරව මෙහි සේවාව ලබා ගත්හ.

අරුණ එමිල් ප්‍රනාන්දු

## සහයක රදගුරු හිමි පැරීසියේ ශ්‍රී ලාංකික කිතුනු සංඝය බැහැදකී



කොළඹ අගරදගුරු පදවියේ සහයක රදගුරු අතිඋතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණෝ ප්‍රංශයේ පැරිසියේ ශ්‍රී ලාංකික කිතුනු සංඝය බැහැදැකීමට පැමිණියහ. පැරිස් නගරයට ආසන්න ලෙවලුවා ප්‍රදේශයේ පිහිටි සා. බර්නදෙත් තුමියගේ දේවස්ථානයේ පැවැත් වූ මෙම දේව මෙහෙයට බැතිමතුන් විශාල පිරිසක් සහභාගි වූහ. ප්‍රථමවරට රදගුරු තුමකු මේ සංඝය බැහැදැකීමට පැමිණීමත්, පූජක පුතුන් හත් දෙනෙකු සමඟ පැවැත් වූ දේව මෙහෙයත් පැරිසියේ වෙසෙන කතෝලික ජනතාවගේ සදා මතකයේ රැඳෙනු නොඅනුමානය. මේ අවස්ථාවට සංඝයේ එඬේරාණන් වන ගරු රෝයි ක්ලැරන්ස් පියතුමන් හා පැරිස් සංඝයට පසුගිය වසර හතර පුරා මහඟු සේවාවක් ඉටු කළ ගරු ක්ලෝඩ් නෝනිස් පියතුමන් සමඟ හලාවත පදවියේ සිට පැමිණි පියතුමන් තිදෙනෙක් ද, කුරුණෑගල පදවියෙන් පියතුමකු හා අනුරාධපුර පදවියේ පියතුමකු ද සහභාගි වීම විශේෂ සිදුවීමකි. දේව මෙහෙයෙන් පසුව පැමිණ සිටි සැමදෙන සමඟ සුහදශීලිව කතා බස් කරමින් එතුමන් පැරිසියේ ශ්‍රී ලාංකීය කිතුනු සංඝයට සුබාසිංසන ගෙන එන ලදි.



කඳාන සා. සෙබස්තියන් මුනි සිද්ධස්ථානයේ වාර්ෂික සත්ප්‍රසාද මංගල්‍ය ඉකුත්දා පැවැත්වුනි. කඳාන සිද්ධස්ථාන පාලක ගරු නිහාල් අයිවන් පියතුමාගේ මෙහෙයවීමෙන් පැවැති මෙම අත්‍යලංකාර දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යයට සහායක ගරු හේමන්ත ප්‍රනාන්දු, මහේෂ් පියතුමන්ද, ගරු අමිල පියතුමා සත්ප්‍රසාද වහන්සේ රැගත් අලංකාර රථය සමඟ වීදි සංචාරය කළ අයුරු.

ඩබ්. ඇම්. ලෙස්ලි පෙරේරා



ගොඩැල්ල මීසමේ අභිවෘධිආලේපය ලැබීමට සූදානම් කරන දරුවන් හා එම දෙමාපියන් සඳහා විවිධ පැතිකඩ ඔස්සේ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්වීමට මීසම් සේවක ගරු මොරිස් ඇන්ඩර්සන් පියතුමා කටයුතු යෙදීය. එම වැඩ සටහනේ දෙවන සම්මන්ත්‍රණය උදේ කාලයේ දරුවන් සඳහාත්, සවස් කාලයේ දෙමාපියන් සඳහාත් ගොඩැල්ල සා. සෙබස්තියන් දෙව් මැඳුරේදී පැවැත්විණ. ගොඩැල්ල ග්‍රාමයේ පුතකු වූ ශ්‍රී ලංකා කතෝලික ගිහි කොමිසමේ ලේකම් විශ්‍රාමික වෛද්‍ය විශේෂඥ මැක්ෂි ප්‍රනාන්දු පුල්ලේ මහතා මෙදින වැඩ සටහන මෙහෙයවිය.

එච්. ඒ. සිරිල් පෙරේරා



නව මීසමක් බවට පත්වූ බලගල සදාසරණ දෙව්මැඳුරේ වාර්ෂික මංගලෝත්සවය කොළඹ සා. ඇලෝසියස් දෙව්සත්හලේ අධ්‍යක්ෂ ගරු ලලිත් ෆීලික්ස් පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරින. මීසම් සේවක ගරු ජූඩ් රාජ් ප්‍රනාන්දු පියතුමා, ගරු ලලිත් ෆීලික්ස් හා සන්ධ්‍යා මෙහෙය පැවැත්වූ ගරු එච්. ඩී. ඇන්තනි පියතුමන්ව පිළිගෙන දෙව්මැඳුර කරා කැඳවාගෙන ගිය අවස්ථාව.

සේයා - නිමල් පෙරේරා

## පොදු එකමුතුවෙන් දහම් පාසල් ශ්‍රමදානයක්

දෙහියාගාත වැඩිහිටි නිවාස ගොඩනැගිල්ලේ (කලින් දෙහියාගාත රෝ. ක. පිරිමි විදුහල) වල්බිහිවෙමින් තිබූ පරිශ්‍රය සුද්ධ පවිත්‍ර කිරීමේ ශ්‍රමදානයක් ප්‍රාදේශීය පොදු එකමුතුවේ මෙහෙයැවීමෙන් පැවැත්විය.

මෙම ගොඩනැගිල්ලේ ළදරු පාසලක් හා සති අන්තයේ දහම් පාසල් පංතිද, විවිධ සමිති සමාගම්වල රැස්වීම්ද පැවැත්වේ.

ඇල්ප්‍රඩ් නෙල්සන්

## යහපත් එඬේරා ගිහි සාමාජික දිවුරුම් දීම

යහපත් එඬේරා පැවිදි නිකාය හා බැඳුනු ගිහි දූතික සංඝයේ සාමාජික සාමාජික සාමාජිකාවන් 42 ගේ පොරොන්දු දීමේ උත්සවය පසුගියදා හැදල නායකකන්ද යහපත් එඬේරා නිකා මුලස්ථානයේදී පැවැත්විණි.

යාච්ඤාවේ භාවනාව තුළ දූතික කාර්යය තේරුම් ගෙන ඒ සඳහා මනා අවබෝධයක් ලබාදුනි. ශ්‍රේෂ්ඨාධිපතිනි ගරු රෝහිණී මෙන්ඩිස් පැවිදි සොහොයුරියගේ ප්‍රධානත්වයෙන් සහ සෙසු පැවිදි සොයුරියන්ගේ සහභාගිත්වයෙන් පැවත්විණි.

රංජිත් නෝනිස්



කොළඹ අගරදගුරු පදවි ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරය සංවිධානය කළ ලොතරැයියේ දිනුම් ඇදීම උපාධ්‍ය ගරු රීඩ් ෂෙල්ටන් ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකැරිණ. පදවි සභාපති ජෙරාඩ් ඩයස් හා භාණ්ඩාගාරික මයිකල් පීරිස් මහත්වරු දෙපස වෙති.



කිඳිගොඩ ශු. මරිය ගොරෙට්ටි මුනි දෙව්මැඳුරේ වාර්ෂික මංගල මෙහෙය වත්තල මීසම් සේවක ගරු බැසිල් වික්‍රමසිංහ පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය. 'බෝට්ටු මංගල්ලය' යැයි විරුදාවලි ලත් මේ මංගල්ලයේ සන්ධ්‍යා මෙහෙය සුබෝධි ආයතයේ ගරු චින්තක පෙරේරා පියතුමා පැවැත්විය. මංගල දිව්‍ය යාගයෙන් පසු ශු. මරිය ගොරෙට්ටි මුනිවරියගේ ප්‍රතිමාව රැගත් බෝට්ටු පෙරහර දැඬුගම් ඔයේ ගමන් කළ අතර බෝට්ටු ආසිරි ගැන්වීමද සිදුවිය. දෙහියාගාත මීසම් සේවක ගරු හිෂාන්ත පෙරේරා, සහයක ගරු ටෙරන්ස් ප්‍රනාන්දු පියවරුන්ගේ මඟපෙන්වීම යටතේ කිඳිගොඩ දෙව්මැඳුරු සංඝය විසින් මෙය සංවිධානය කරන ලදි.

ජේ. බී. එච්. ලිවේරා

ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk

ක්‍රිස්තු වර්ෂ 2012 ඔක්තෝබර් 07 ඉරිදා

# ශු. පවුලේ පැවදි නිකාය

විශ්වාසයේ වසර ආරම්භ වනවාත් සමඟම ශ්‍රී ලංකාවේ ශු. පවුලේ පැවදි නිකායද සිය 150 වෙනි සංවත්සරය සමරන්නට සූදානම් වන බව ආරංචි මාර්ග හෙළි කරයි. අද ප්‍රදීපය පුවත්පතද ඒ සංවත්සරය වෙනුවෙන් මැද පිටුව තිළිණයක් සේ ඔවුන් වෙනුවෙන් පුද කොට ඇත. ශු. පවුලේ පැවදි නිකායේ සොහොයුරියන්ගේ සේවාව පිළිබඳවත්, පුළුල්ව ව්‍යාප්ත වී ඇති විවිධ වූ සේවා කාර්ය අංශ පිළිබඳවත් මනා අවබෝධයක් මෙරට කතෝලික ජනයා අතර පමණක් නොව කතෝලික නොවන ජනතාව අතරද උපරිමයෙන්ම පවතී. ඒ අනුව ශු. පවුලේ සොහොයුරියන්ගේ කරිස්මාව නිතරම කාලයේ සළකුණු හා සමඟ බැඳෙමින් සමානුපාතිකව ගමන් කරන්නක් බව ඉතා පැහැදිලියි.

ශු. පවුලේ නිකායේ නිර්මාතෘ ගරු පීටර් බියෙන්වෙනු නොආයි පියතුමන්ගේ අප්‍රතිහත ධෛර්යය හා දුර දක්නා ස්ථානෝචිත ප්‍රඥාවේ ආභාෂය මෙතුවක් ශ්‍රී ලංකාව තුළ මෙම සොහොයුරියන්ගේ ගමන් මඟ තිව්‍ර කොට ඇති බව ඉතා පැහැදිළියි. එතුමන්ගේ මුවින්ම වදාළ වදන් වූයේ ශු. පවුලේ සොහොයුරියන් කාන්තාරයේද, ප්‍රපාත අද්දරද නෂ්ටාවශේෂ හා සොහොන් කොත් පාමුලද හට ගන්නා පුෂ්පයන්ට සමාන කළ හැකි බවයි. මෙතුවක් ශ්‍රී ලංකාව තුළ ඉටු කොට ඇති සේවා දැක්ම පිළිබඳව යම් සමාලෝචනයක යෙදුනහොත් ඉහත සඳහන් අනාගත වැකියන් බඳු වූ එතුමන්ගේ වදන් කෙතරම් සත්‍යතාවයන්ගෙන් හෙබි වූයේද යන්න මනාව වැටහේ. ශ්‍රී ලංකා දේශයට එම සොහොයුරියන්ගේ සේවාව ලබාගැනීමට ඉඩ ප්‍රස්ථා සැලසුනේ එවකට උතුරු ප්‍රදේශයෙහි කතෝලික සසුන භාරව කටයුතු කළ අති උතුම් සැමෙරියා රදගුරු හිම්පාණන්ගේ මැදිහත් වීම කරන කොට ගෙනයි. ඒ අනුව දිවයිනට පැමිණි මෙම පැවදි සොහොයුරියන් ඉතා උසස් මට්ටමේ ඉංග්‍රීසි පාඨශාලා උතුරෙහි පමණක් නොව අන් ප්‍රදේශ වලටද ව්‍යාප්ත කරන්නට උත්සුක වූ නිසා කුරුණෑගල, අනුරාධපුරය. හලාවත, බම්බලපිටිය, වෙන්නප්පුව, දෙහිවල, කළුතර හා නුගේගොඩ වැනි ප්‍රදේශ වලටද ඔවුනගේ සේවාව උපරිමයෙන්ම ලැබුණි.

මේ 150 සංවත්සර මොහොතේදී අතීතය එලෙස කෙටියෙන් ආවර්ජනය කරන අතරම අධ්‍යාපන තලයෙන් ඔබ්බට විහිද ගිය ඔවුනගේ සේවාව මතක් කිරීමද විය යුත්තක් බව හැඟේ. පුරා 150 වසරක කාල පරිච්ඡේදයේ ඒ ඒ වකවානුවල ඔවුන්ගේ සේවාව විවිධ හැඩතල ගෙන වෙනස් වී ඇති බවත් පැහැදිලියි. ඒ මන්ද අතීතයේ පැවති දේශපාලන බල අධිකාරිත්වයේ බලපෑම් මත පාසල් අධ්‍යාපනයේ ඉටු කළ සේවාව හා රෝහල්වල සාත්තු සේවාව අහිමි කරවීමට ක්‍රියා කළද එයින් නොසැලුනු මේ සොහොයුරියෝ තවත් නව කඩඉම් සොයා පියමං කර ඇති බවට නූතන වර්තමානය දෙස් දෙති. එහිදී අති දුෂ්කර ප්‍රදේශ වල වතු කම්කරු ජීවිතයට සමීප වෙමින් දිවි පෙවෙත හුරු පුරුදු කර ගන්නට වෙහෙස වූවෝ අපමණ වූහ. ධීවර හා ගොවි ජනතාවගේ ජීවිත පැවැත්මට සමීප වෙමින් ඒ ජිවන සුවඳ තුළ සේවා දැක්ම විහිද හරින්නට කැප වූවෝ අපමණ වූහ. ඒ පමණක් නොව ආධ්‍යාත්මික හඬ ශබ්දයේ ගැඹුරු අභියෝග වටහා ගෙන කතෝලික නොවන ප්‍රදේශවල තර්ජන ගර්ජන මධ්‍යයේ වුවද සේවාව මුදා හැරීමට පසුබට නොවී ක්‍රියා කර ඇති බවත්, තවමත් ක්‍රියා කරන බවත් ඒ දිවි ගමන් මඟ සුපහන් සිතින් පිරික්සීමේදී පෙනී යයි.

යුක්තිය, සාමය හා සාධාරණත්වය වෙනුවෙන් දෙපා ඔසවන්නට මෙම ශු. පවුලේ සොහොයුරියන් කටයුතු කොට ඇති බවත් මනාව පෙනී යයි. පුරා 30 වසරක් තුළ දිග හැරුණු යුද්ධයක් නිසා අපමණ වේදනා ගොන්නකට මැදිවූ ජනතාව සොයා පියමං ලන්නටද මෙම සොහොයුරියන් පසුබට වුයේ නැත. යුධ සමය තුළ උපරිමයෙන්ම සේවය මුදා හල ඔවුන් පශ්චාත් යුධ සමය තුළත් විවිධ කඳවුරු තුළ ජීවත් වෙමින් දුෂ්කරතා මායිම් නොකර සිය දුත සේවාව උපරිමයෙන්ම ඉටු කළ අයුරු ප්‍රශංසාත්මක මුවින්ම කතා කළ යුතුයි.

යාච්ඤාව ජීවිතයේ අවිය බවට පත්කර ගත් සොහොයුරියන්ගේ ආරාමද දිවයින තුළ දැකිය හැකියි. කැපවූ ජීවිතය අන් අය ශක්තිමත් කරන්නට යොමු කරන නිසා ඒ යාච්ඤාවෙන් ශක්තිමත් වන දහසක් දෙනා තුළ ඇති වන සංයමය හා සැනසුම ඉමහත් බවද සඳහන් කළ යුතුයි. මෙම නිසාම ධ්‍යානපර සොහොයුරියන්ගේ ආරාම කරා පා නඟන තරුණියන්ගේ සංඛ්‍යාවද අද වැඩිවෙමින් පවති.

ජන ජීවිතයට තදින්ම ඒකාබද්ධ වෙමින් ක්‍රියාකාරි සේවා දැක්ම අර්ථවත් කරමින් එය අධ්‍යාත්මික ශක්තියෙන් බැඳ තබන්නට ගන්නා උත්සාහය නිසා අද ශු. පවුලේ සංගමය ගිහි, පැවදි. පූජක සැමටද විවෘතව පැවතීම යුගයේ අභියෝගයක් ජය ගත්තා වැනියි.

අපෝස්තලික පැවදි කණ්ඩායම, ධ්‍යාන පර පැවදි කණ්ඩායම, කැපවු ගිහි කණ්ඩායම. පූජක කණ්ඩායම, ගිහි සමාජ සාමාජිකාවන් හා තරුණ, ළමා කණ්ඩායම අද සාර්ථකව මෙම ශු. පවුලේ සමාජිකත්වය තුළ ඒකාබද්ධ ගමනක් ආරම්භ කර ඇති බව සේවා දැක්මේ විවිධ දිශානතීන් තුළ ඒ සියල්ල ඉටු කරන කාර්ය භාරය කදිමට දෙස් දෙයි. පූජක කණ්ඩායම පදවි භේදයකින් තොරව එකමුතුව සිය ආධ්‍යාත්මික පන්නරය මුවහත් කර ගනිමින් උතුර - දකුණ එක්තැන් කරන්නට සිය වැඩමුළු පූර්ණ වශයෙන් කැප කොට ඇති බවක් ඉටු කරන කාර්යය භාරයන් කදිමට සාක්ෂි දරයි.

150 සංවත්සරයට ලඟි ලඟියේ සූදානම් වන ශු. පවුලේ සොහොයුරියනට ඔවුනගේ සේවාව වෙනුවෙන් තුති මල් මිටක් පුදන්නට මෙහිදි ප්‍රදීපය සියළු සැදැහැවතුනට ආරාධනා කරන්නේ සේවය ඇගයීම හා කෘතගුණ වචනයක් මුදා හැරීම දෙවිඳු කාර්යය භාරයේදී මිනිස් හදවත් වලට අත්‍යවශ්‍ය අංගයක් බවද සිහිපත් කරමිනි.

**විශ්වාසයේ වසර**

**දහම් චින්තා 1**

# විශ්වාසයේ දොරටුව

## (අති උත්තම සොලොස්වන බෙනඩික් සසුන් පියගේ අපෝස්තලික සංදේශය)

01. ‘විශ්වාසයේ දොරටුව’ (ක්‍රියා 14:27), දෙවියන් වහන්සේ සමඟ සහභාගිත්වයේ ජීවිතයක් වෙත අප කැඳවාගෙන යමින් ද උන්වහන්සේගේ සභාවට ඇතුළු වීමට මඟ පාදමින් ද අප වෙනුවෙන් නිතරම විවෘතව තිබේ. දේව වචනය ප්‍රකාශ කරන විට දී සහ පරිවර්තනාත්මක වරප්‍රසාද මගින් එයට හැඩගැසෙන්නට හදවත ඉඩ සලසන විටදී ද, එම එළිපත්ත තරණය කිරීමට හැකිවෙයි. එම දොරටුව තුළින් ඇතුළු වීම යනු ජීවිත කාලයක් පුරා සිදුවන ගමනක් ආරම්භ කිරීමකි. දෙවියන් වහන්සේට පියාණන් ලෙස ආමන්ත්‍රණය කිරීමට අපට හැකියාව ලබා දෙන බව්තිස්ම ස්නාපනයෙන් (රෝම 6:4 බලන්න) එය ආරම්භ වෙයි.
එය නිමාවන්නේ ජේසුස් ස්වාමින් වහන්සේගේ උත්ථානයේ ඵලය වන මරණයෙනි. සදාකාලික ජීවිතය වෙත යන ගමනිණි. තමන් වහන්සේ තුළ විශ්වාස කරන්නන්ව ශුද්ධාත්මයාණන් වහන්සේ මගින් තමන් වහන්සේගේම තේජශ්‍රීය වෙත ඇද ගැනීම ජේසුස් ස්වාමින් වහන්සේගේ කැමැත්ත වෙයි (ජොහාන් 17:22). ශුද්ධ වූ ත්‍රිත්වය - පියාණන් වහන්සේ, පුත්‍රයාණන් වහන්සේ සහ ශුද්ධාත්මයාණන් වහන්සේ - තුළ විශ්වාසය ප්‍රකාශ කිරීම වනාහී ප්‍රේමය වන එකම දෙවියන් වහන්සේ; (1 ජොහාන් 4:8) එනම් කාලය සම්පූර්ණ වූ කල තමන් වහන්සේගේ පුත්‍රයාණන්ව අපගේ ගැලවීම වෙනුවෙන් එව්වාවූ පියාණන් වහන්සේ; තමන් වහන්සේගේ මරණයේ සහ උත්ථානයේ අභිරහස තුළ ලෝකය ගලවාගත් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ; ස්වාමින් වහන්සේගේ මහිමාන්විත පුනරාගමනය බලාපොරොත්තුවෙන් අප රැඳී සිටින ශතවර්ෂ ගණනාවක් පුරා සාන්ත සභාවට මඟ දක්වන ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ විශ්වාස කිරීමයි.

02. ක්‍රිස්තුන් වහන්සේ සම්මුඛ වීමේ ප්‍රීතිය සහ නැවත ශක්තිමත් කරනු ලැබූ උද්‍යෝගය මත වඩාත්ම පැහැදිලි ආලෝකයක් වස්වාලනු සඳහා විශ්වාසයේ ගමන යළි අනාවරණය කර ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව පේදුරු තුමන්ගේ අනුප්‍රාප්තිකයාණන් ලෙස පත්වූ මොහොතේ සිටම මම කථා කොට ඇත්තෙමි. ශුද්ධෝත්තම පිය ධූරයට මා පත්වූ අවස්ථාවේ පැවති දිව්‍ය පූජා යාගයේ දී මා කළ දේශනයේ දී මෙසේ ප්‍රකාශ කළෙමි: ‘ක්‍රිස්තුන් වහන්සේ මෙන්ම, සමස්තයක් ලෙස සාන්ත සභාව සහ ඇයගේ එඬේරු කාන්තාරයෙන් පිටතට පැමිණ ජීවනයේ ස්ථානය වෙත, දේව පුත්‍රයාණන් සමඟ මිත්‍රත්වය වෙත, අපට ජීවනය දෙන තැනැන් වහන්සේ වෙත, සමෘද්ධියෙන් පිරි ජීවිතය වෙත, යාමට ජනතාවට මඟ දැක්විය යුත්තාහ.’(1) ක්‍රිස්තියානි ජනතාව තම කැපවීමෙහි සමාජයීය.




සංස්කෘතික සහ දේශපාලනික ප්‍රතිවිපාක පිළිබඳව වඩා සැලකිලිමත් වීම බොහෝ විට සිදු වෙයි. ඔවුහු විශ්වාසය සමාජ ජීවිතයේ ස්වයං ප්‍රත්‍යක්ෂ පූර්ව කල්පනයක් ලෙස දිගටම සිතති. යථාර්ථයේ දී මෙම පූර්ව කල්පනය තව දුරටත් වලංගු යැයි පිලිගැනීමට නො හැකිවා පමණක් නොව, බොහෝ විට එය විවෘතවම ප්‍රතික්ෂේප කෙරේ.(2) අතීතයේ දී විශ්වාසයේ අන්තර්ගතයට සහ ඒ මඟින් අනුභාවිත වටිනාකම්වලට එහි ඇති ආකර්ෂණය තුළ පුළුල් ලෙස පිළිගැනීමට ලක් වූ ඒකීය සංස්කෘතික අච්චුවක් හඳුනා ගැනීමේ හැකියාව තිබුව ද, බොහෝ මිනිසුන්ට බලපා ඇති විශ්වාසය පිළිබඳ දැඩි අර්බුදය නිසා සමාජයේ විශාල තීරයක් තුළ අද මෙය තව දුරටත් යථාර්ථයක් නොවන සෙයක් පෙනී යයි.

03. ලුණු, ලුණු රස නොවීම හෝ පහන සඟවා තැබීම හෝ අපට පිළිගත නොහැකිය (මතෙව් 5:13-16). තමන් වහන්සේ තුළ විශ්වාස කිරීමට සහ තමන්වහන්සේ තුළින් ගලා එන ජීවනදායක ජල උල්පතින් දිය ඇද ගැනීමට (ජොහාන් 4:14) අපට ඇරියුම් කරන ජේසුන් වහන්සේට සවන් දීම සඳහා සමරිතාන ස්ත්‍රිය සේ, ලිඳ වෙත යාමේ අවශ්‍යතාවය තවමත් වත්මන් ජනතාවට අත්දැකිය හැකිය. සාන්ත සභාව විසින් විශ්වාසවන්තව පවරනු ලැබූ දේව වචනය සහ තමන් වහන්සේගේ ශ්‍රාවකයන් සඳහා පෝෂණය ලෙස පිළිගන්වනු ලැබූ ජීවනයේ භෝජනය මත අපව පෝෂණය කර ගැනීම (ජොහාන් 6:51) සඳහා වන රසයක් යළි අනාවරණය කරගත යුතු වෙමු. ඇත්ත වශයෙන්ම ජේසුස් වහන්සේගේ ඉගැන්වීම එම බලයෙන්ම යුතුව වර්තමානයේදීත් නින්නාද වෙයි: ‘නැතිවී යන ආහාරය සඳහා නොව, සදාතන ජීවනයට ඉවහල් වන ආහාරය සඳහා වීර්ය වඩන්න’ (ජොහාන් 6:27), උන්වහන්සේට සවන් දී සිටියවුන් නැඟු ප්‍රශ්නය අද අප අසන ප්‍රශ්නයමය: ‘දෙවියන් වහන්සේගේ අභිප්‍රාය අනුව වැඩ කරන පිණිස අප කුමක් කටයුතු ද?’ (ජොහාන් 6:28) ජේසුස් වහන්සේ දුන් පිළිතුර අපි දනිමු. ‘දෙවියන් වහන්සේගේ අභිප්‍රාය වනුයේ උන්වහන්සේ එවා වදාළ තැනැන්තාණන් ඔබ විසින් අදහා ගැනීමය’ (ජොහාන් 6:29). එසේ නම්, ගැලවීම කරා නිසැකවම ළඟා වීමේ මාර්ගය වන්නේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළ විශ්වාසයයි.

04. මේ සැම දෙයකම ආලෝකයෙන් විශ්වාසයේ වර්ෂයක් ප්‍රකාශයට පත් කිරීමට මම තීරණය කර ඇත්තෙමි. එය දෙවන වතිකාන කතිකාවත ආරම්භ කිරීමේ පනස්වන සාංවත්සරය වන 2012 ඔක්තෝබර් 11 දින ආරම්භ වී විශ්වයීය රජාණන් ද, අප ස්වාමීන් ද වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ මංගල්‍යය යෙදෙන 2013 නොවැම්බර් 24 දින නිමාවට පත් වනු ඇත. ආරම්භක දිනය වන 2012 ඔක්තෝබර් 11, විශ්වාසයේ බලය සහ අලංකාරය සියලු සැදැහැවතුන් සඳහා පැහැදිලි කිරීමේ අරමුණ සහිතව, මාගේ පූර්ව ගාමිකයාණන් වන භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියාණන්(3) ප්‍රකාශයට පත් කළ ග්‍රන්ථය වන කතෝලික සභාවේ ධර්මෝපදේශය ප්‍රකාශයට පත් කිරීමේ විසිවන සාංවත්සරය සනිටුහන් කෙරෙන දිනය ද වෙයි. දෙවන වතිකාන කතිකාවතේ අව්‍යාජ ඵලයක් වන මෙම ලේඛණය ධර්මෝපදේශයේ සේවය වෙනුවෙන් කැපවූ මෙවළමක් ලෙස, 1985 දී පැවති රදගුරු හිම්වරුන්ගේ අති විශේෂ සමුළුව විසින් ඉල්ලා සිටි ලේඛණයකි.(4) එසේම එය ලියැවුනේ කතෝලික සභාවේ සියලුම රදගුරු හිම්වරුන්ගේ සහභාගිත්වයෙනි. ඊටත් වඩා, 2012 ඔක්තෝබර් මාසයේ දී මා කැඳවා ඇති රදගුරු හිම්වරුන්ගේ සමුළුවේ පොදු රැස්වීමේ තේමාව වන්නේ ‘ක්‍රිස්තියානි විශ්වාසය පතුරුවා හැරිම සඳහා නව ධර්මදානය’යි. මෙය. විශ්වාසය යළි අනාවරණය කර ගැනීමේ සහ විශේෂ මෙනෙහි කිරීමේ කාලයක් තුළට සමස්ත සාන්ත සභාවම රැගෙන යාමේ හොඳ අවස්ථාවක් වනු ඇත. විශ්වාසයේ වර්ෂයක් සැමරීමට සාන්ත සභාව කැඳවනු ලැබූ පළමු අවස්ථාව මෙය නොවේ. ශුද්ධවූ පේදුරු සහ පාවුලු මුනිවරුන්ගේ සාක්ෂි දැරීමේ උත්තරීතර ක්‍රියාවේ 19 වන ශත සාංවත්සරයේ දී එතුමන්ගේ ප්‍රාණපරිත්‍යාග වරය සැමරීම සඳහා මාගේ ගෞරවාන්විත පූර්වගාමිකයාණන් වූ, දේව සේවක VI වන පාවුලු ශුද්ධෝත්තම පියතුමා 1967 දී විශ්වාසයේ වර්ෂයක් ප්‍රකාශයට පත් කළේය. එතුමන් ඒ පිළිබඳව සිතුයේ ‘එම විශ්වාසයේම අව්‍යාජ සහ අවංක ප්‍රකාශනයක්’ කිරීමට සමස්ත සාන්ත සභාවටම ලැබී ඇති ගාම්භීර මොහොතක් ලෙසය; ඊටත් වඩා ‘පෞද්ගලික සහ සාමුහික, නිදහස් සහ සවිඥානක, අන්තර්නම්‍ය සහ පිටස්තර, නිහතමානී සහ අවංක’(5) ආකාරයකින් එය ස්ථිරත්වයට පත් කිරීමට එතුමන්ට අවශ්‍ය විය. ‘විශ්වාසය නැවත ප්‍රාණවත් කිරිම, පිරිසිදු කිරීම. ස්ථිර කිරීම සහ ප්‍රකාශ කිරීම පිණිස විශ්වාසය පිළිබඳ නිරවද්‍ය දැනුම නැවත අත්පත් කර ගැනීමට’(6) මේ මාර්ගයෙන් හැකියාව ලැබෙන බව එතුමෝ සිතුහ. එම වසරේ ශ්‍රේෂ්ඨ පෙරළි, මෙයාකාරයේ සැමරුම් සඳහා වන අවශ්‍යතාවය වඩා ප්‍රත්‍යක්ෂ කළේය. එම වසර නිමාවට පත් වුයේ දේව ජනතාවගේ විශ්වාස ලක්ෂණය සමඟිනි.(7) අතීතයට වඩා අඛණ්ඩව බොහෝ වෙනස් ඓතිහාසික තත්ත්වයන් තුළ දිගටම සාක්ෂි දැරීම පිණිස, ශත වර්ෂ ගණනාවක් පුරා සියලු විශ්වාසිකයින්ගේ උරුමය හැඩගැස්වූ අත්‍යවශ්‍ය අන්තර්ගතය, නවතාවයකින් යුතුව ස්ථිර කිරීම, තේරුම් ගැනීම සහ ගවේෂණය කිරීම කෙතරම් අවශ්‍ය වන්නේ දැයි පෙන්වා දීම එහි අරමුණයි.

ඉදිරියට.... »

## කැමිලස්ගේ — තිත්ත ඇත්ත



මීසමෙන් මීසමට

## පැරඩයිස් මංගල්‍යය මහත් හරසරින්



අද අප උත්සවශ්‍රියෙන් සමරණ ශුද්ධවූ ආනා මුනිතුමිය පිළිබඳව සුපුවතේ සඳහනක් වන්නේ නැහැ. ඒවගෙම අප දේව අම්මාවූ මරියතුමි පිළිබඳවත් සඳහන් වන්නේ සුවිශේෂ අවස්ථා කිහිපයක පමණයි. එහෙත් එතුමියන් ජීවිතාදර්ශයෙන් කිතුනු ජීවිත පැවැත්මට කර ඇත්තේ සුවිශේෂ මෙහෙවරක් යැයි රත්නපුර මීසමේ කුරුවිට පැරඩයිස් හි සාන්ත ආනා දෙව්මැඳුරේ වාර්ෂික මංගල උත්සවය පවත්වමින් රත්නපුර මීසම් පූජක පුතනුවකු වු ගරු රසික ලක්මාල් පෙරේරා පියතුමා පැවසීය.

රත්නපුර මීසම් සේවක ගරු රන්ජන් මාල් මොරායස් හා සහයක ගරු ගේබ්‍රියෙල් නික්ලස් යන පියවරුන්ගේ සහභාගිත්වයෙන් මංගල දේව මෙහෙය පැවැත්විණ.

තියබෝල්ඩ් සමරතුංග

# කිතුනු දෙමාපිය වගකීම පිළිබඳව දැනුවත් කිරීමක්!

**විවිධාකාර විසමතා පවතින සමාජයක ජීවත් වන කිතුනු දරුවන් යාච්ඤාවේ ජීවිතයක් කරා යොමු කරමින් නිසි ආගමික පසුබිමක් සකස් කිරීමේ මූලික වගකීම දෙමාපියන්ට පැවරී ඇතැයි පන්නිපිටිය ක්‍රිස්තු රජාණන්ගේ දෙව්මැඳුරට අයත් දෙමාපියන් සඳහා ක්‍රිස්තුරාජ විද්‍යාලීය ශාලාවේ පැවති ධර්ම විවේකයේදි දිව්‍ය ගැලවුම් කාරයාණන්ගේ නිකායික ගරු විමල් තිරිමාන්න පියතුමා පැවසීය.**

ක්‍රිස්තු රජාණන්ගේ දෙව්මැඳුරේ රජත ජයන්තිය වෙනුවෙන් සංවිධානය වන ආගමික වැඩ සටහන් මාලාව යටතේ පැවති මේ එක්දින ධර්ම විවේකයට දෙමාපියන් 200 ක් සහභාගි වූහ. වර්තමාන සමාජයට 'කිතුනු ජීවිතය' සකස් කර ගන්නා ආකාරය හා පවුල් ජීවිතය තුළ පවතින්නා වූ ගැටලු සඳහා කිතුනු පසුබිමක විසඳුම් ලබා ගන්නා ආකාරය ගැන මෙහිදි පුළුල් දැනුවත් කිරීමක් සිදුවිය.

කිතුනු දරුවන්ව විනයානුකූල පසුබිමක් කරා යොමු කිරීමේ වැදගත්කම ගරු පියතුමන් විසින් දැනුවත් කරන ලදි. දෙමාපියන් විසින් යොමු කරන ලද විවිධ ගැටලු වලට ධර්ම විවේකයේදී ගරු තිරිමාන්න සහ ගරු රූපස් පියවරුන් විසින් පිළිතුරු ලබා දෙන ලදී. මීසම් සේවක ගරු බ්ලේස් කුරේ පියතුමාගේ මඟපෙන්වීම යටතේ සහයක ගරු රුවන්ත කුමාර පියතුමා සමඟ දෙව්මැඳුරේ ක්‍රියාකාරි කමිටුව විසින් ධර්ම විවේකය සංවිධානය කරන ලදී.

ක්‍රිස්ටෝපර් රණසිංහ

## කංජුක්කුලිය මීසමට පුටු පරිත්‍යාගයක්

හලාවත කංජුක්කුලිය සා. බෙනඩික් දෙව්මැඳුරේදී මීසම් සේවක ගරු රොහාන්ගයිස් පියතුමාට පුත්තලම් දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රි නිරෝෂන් පෙරේරා මහතා ප්ලාස්ටික් පුටු 60 ක් පරිත්‍යාග කළේය.

ප්ලාස්ටික් පුටු 20 බැගින් කංජුක්කුලිය. උර්යන්දළුව, රඹේපිටිය යන දේවස්ථාන දහම් පාසල් හි ප්‍රයෝජනයට යොදා ගැනේ.

ඇම්. ඩබ්. අනුර ශාන්ත පීරිස්

## ඇතුළාන්ත අලංකාරය ගැන වඩාත් සිතන්න

නූතන සමාජයේ ඇතැම් මිනිසුන් සිය ජීවිතයේ පිටත ඔප කරන්නට, සැප ලබා දෙන්නට යම් යම් දේ කළද ඇතුලාන්තය එවැනි දේවලින් සරසා අලංකාර කරන්නේ නැහැ. ජීවිතයක් වඩා ලස්සනවන්නේ ඇතුලාන්තය ලස්සනට සැරසී තිබීමෙන් පමණක් නිසා ඔබ ජීවිත අභ්‍යන්තරය පොහොණි කරගත යුතු යැයි ගරු ශිරාන් කැරව්ගොඩ පියතුමා ප්‍රකාශ කළේය.

ගරු පියතුමා එසේ ප්‍රකාශ කළේ හේකිත්ත ශුද්ධ වූ ලාසරස් මුනිඳුන් දේවස්ථානයේ වාර්ෂික මංගල දිව්‍ය මෙහෙයේදීය.

මීසම් වාසීන්ගේ සහයෝගය මත මංගල කටයුතු පල්ලියවත්ත මීසම් සේවක ගරු ෆීලික්ස් මැල්ලව ආරච්චි පියතුමන් විසින් මෙහෙයවන ලදී.

ඒ. ඩී. සුනිල්

## මෙතෝදිස්ත 125 ජයන්තියට කතෝලික පියතුමාගෙන් සුවසේවා

කුරණ මෙතෝදිස්ත දෙව්මැඳුරේ 125 ජයන්ති මහෝත්සවයට සමගාමීව මිදෙල්ලවිට මීසම් සේවක ගරු ටෙරන්ස් කිත්සිරි පෙරේරා පියතුමා සුවයේ යැදුම් මෙහෙයක් පැවැත්විය. ගරු ජගත් මාරසිංහ දේවගැති තුමාගේ ඇරියුමෙන් ගරු පියතුමා ඊට සහභාගි විය.

නෙවිල් ජෝශප් සිල්වා



මීගමුව කලාපීය තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරයට 80 හා 90 දශකයේදී සාමාජිකයින්ව සිටි පිරිසගේ පවුල් වල සුහද හමුවක් පසුගියදා මීගමුව තම්මිට කාදිනල් කුරේ මධ්‍යස්ථානයේදී ගරු ක්‍රිස්පින් ලියෝ, ගරු ජූඩ් බර්නාඩ්, ජූඩ් ක්‍රිෂාන්ත යන පියතුමන්ලා දෙසුම් පැවැත්වූ අතර දරුවන් සඳහා ක්‍රියාකාරකම් පැවැත්වුණි. පැමිණි සිටි පිරිස ප්‍රදීප ඡායාරූපයකට පෙනී සිටි අයුරු.

සමන් සී. පෙරේරා

# දේව ආදරයෙන් ජීවිත වෙනසක් ඇතිකර ගනිමු



දේව ආදරය තුළ කිතු තුමන් අත්දැකීමට නම් සැබෑ කරුණාව, ප්‍රේමය, තිබිය යුතුය. කුඩා කල සිට අප සිත් යහපත් ගුණාංගයන්ට යොමුකර වීමෙන් දෙවියන් වෙතට වඩාත් ලංවීමට හැකියාව ලැබෙනවා. අද සමාජයේ, පාසල් දරුවන් කොපමණ හොඳින් යහපත් කල්ක්‍රියාවෙන් යුතුව, තම ජීවිතය පවත්වා ගෙන යාමට වෙර දැරුවත්. ඇතැම් විට මිතුරන්ගේ අයහපත් ක්‍රියා කලාපයන් නිසා මත්කුඩු ආදියට ඇබ්බැහිවී තම වටිනා ජීවිත අකාලයේ විනාශ කර ගන්නවා. යහපත් සමාජයක් බිහිවන්නේ, යහපත් පුරවැසියන් තුළිනුයි. යහපත් ගුණාංග වලට ජීවිතය හුරුපුරුදු වන්නටත්, ඒ තුළින් දේව ආදරය අත්දකිමින් ආදර්ශවත් වන්නට සිතට ගත යුතුයැයි නිමල මරිය නිකායේ ගරු ඇන්ටන් ශිවන්ත වාස් පියතුමා පැවසීය.

එතුමා එසේ පැවසුවේ මග්ගොන සාන්ත විසෙන්ති ද පාවුලා මුනිඳුන්ගේ දෙව්මැඳුරේ වාර්ෂික මංගල දේව මෙහෙයේදීය. පසුගියදා පූජක වරම් ලැබූ, ගරු සමීර දමිත් ෆොන්සේකා, ශේන් වින්ස්ටන් ද රොසයිරෝ, රොෂාන් ජනප්‍රිය වාස්, ඇන්ටන් ශිවන්ත වාස්, යන නි.ම.නි පියවරුන්ගේ ප්‍රධානත්වයෙන් සන්ධ්‍යා මෙහෙය සහ මංගල දේව මෙහෙය සිදුකරන ලදි. සාන්ත විසෙන්ති නිවාසයේ අධ්‍යක්ෂ ගරු ශ්‍රියාන් රණසිංහ නි.ම.නි පියතුමන්ගේ මූලිකත්වයෙන් එම නිවාසයේ ගරු පියවරුන් හා සහෝදරතුමන්ගේ සහයෝගයෙන් මෙම මංගල උලෙළ අර්ථවත් අන්දමින් පැවත්විණි.

ඩී. ඇන්සලම් ප්‍රනාන්දු

## ගල්වැටිය ශු. ජපමාල රාජේශ්වරි දෙව්මැඳුරේ 125 ජයන්ති උලෙළ අදයි



වත්තල කැළණි ගං නිම්නය අසබඩ පිහිටි ගල්වැටිය ගම් පියසේ ජපමාල රාජේශ්වරියට කැප කරන ලද දෙව්මැඳුරේ වසර 125 සැපිරීමේ ජයන්ති මංගල්‍යය ඔක්තෝබර් 06 හා 07 දිනවල උත්සවශ්‍රීයෙන් පැවැත්වීමට සියළු විධිවිධාන යොදා ඇත.

වත්තල මීසම් සේවක ගරු බැසිල් වික්‍රමසිංහ පියතුමා මීසම් සහයක ගරු ක්‍රිෂාන් ජයශාන්ත පියතුමා ප්‍රමුඛ මීසම් ධර්ම සේවා සභාව, ජුබිලි කමිටුව, වත්තල, ගල්වැටිය කතෝලික සංගමය හා ශු. ජපමාල සංගමයේ සහය ඇතිව ජුබිලි මංගල්‍යය සංවිධානය කෙරේ.

දෙව් අසිරියෙන් ජීවනාලෝකයක් ලබා සතුටින් ජීවත්වන ජනතාව දැකීම සතුටට කරුණකි. මෙම දෙව්මැඳුරට පැමිණෙන්නන් දෙව් මව් සමඟින් දෙව් පියාණන් වහන්සේට තුති ප්‍රශංසා කිරීමට ඉතා සුදුසු යාච්ඤා ගෘහයක් ලෙසින් මෙම ඉපැරණි දෙව්මැඳුර සුපතළය. ධර්මදූත සේවය සඳහා අප ශ්‍රී ලංකා දිවයිනට සපැමිණි භාග්‍යවන්ත ජුසේ වාස් පියතුමන්ගේ පාද ස්පර්ශය ලද මෙම භූමියේ පිහිටා ඇති පැරණි දෙව්මැඳුර පෘතුගීසි සමයේදී ශු. සන්තියාගු මුනිඳුන්ට කැප කර තිබු බවද, පසු කලෙක එම ප්‍රතිමාව මෝදරට ගෙන ගිය බවද, ජනවහරේ සඳහන්ව ඇත. කාලානුරූපිව මෙම දෙව්මැඳුර පරම්පරා ගණනාවක්ම ඔවුන් තුළ තිබූ අචල විශ්වාසය නිසාම අපගේ ගැලවුම්කාරයාණන්ගේ මාතාවන් වන ශු. ජපමාල රාජේශ්වරියට කැපකර එදා මෙදා තුර දිනෙන් දින දෙව්මව්න්ගේ රැකවරණය හා මධ්‍යස්ථකම තුළ දෙව්පියාණන් වහන්සේට ප්‍රිය මනාපවූ යාච්ඤාවේ ගෘහයක් බවට පත්වී ඇත.

ශ්‍රී ලංකාවේ අවසාන රජුවන ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා අපරටින් පිටුවහල් කිරීම සඳහා රුවල් නැවකට ගොඩනැග්ගේද කැළණි ගංඉවුරේ තිබූ ගල්වැටිය අසලින් බව ඉතිහාසයේ සඳහන් වෙයි.

සී. ආර්. ඩික්සන් ඇන්ටනි

## දුනකදෙනිය මරිය හමුද වජ්‍ර ජයන්ති සංවත්සර උලෙළ ද......




කුරුණෑගල රදගුරු වසමේ දුනකදෙණිය මීසමේ මරිය හමුදාව අරඹා 60 වසරක් සපිරීම නිමිත්තෙන් වජ්‍ර ජයන්ති තුතිදීම් මංගල දේව මෙහෙය කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් දුනකදෙණිය සා. අන්තෝනි දෙව්මැඳුරේදී පැවැත්විණ. පදවි මරිය හමුදා අධ්‍යක්ෂ ගරු ලයනල් ප්‍රනාන්දු පියතුමාගේ මඟ පෙන්වීම යටතේ ජයන්තිය නිමිත්තෙන් වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කළේය.

ටී. එම්. පී. සන්ධ්‍යා කුමාරි

## යක්කඩුවට විවිධ සේවා සඳහා නව ගොඩනැගිල්ලක්!



යක්කඩුව කතෝලික සංඝයට මෙතෙක් අඩුපාඩුවක්ව තිබූ දහම් පාසල් ආදි විවිධ සේවා පැවැත්වීම සඳහා අලංකාර ගොඩනැගිල්ලක් ෆැමිලි ස්මෙල්ඩිං ඔෆ් නෙදර්ලන්ඩ් ආයතනය ලබාදී ඇත. දැනට මාස කීපයකට පෙර ගොඩනැගීම ආරම්භ කළ අතර එහි වැඩ අවසන්කර පසුගිය දා නිලවශයෙන් සභාවට භාරදීම සිදුකරන ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු ටෙරන්ස් කිත්සිරි පෙරේරා පියතුමා යක්කඩුව වැනි නොදියුණු පෙදෙසක දරුවන්ට මෙය මහගු සම්පතක් බවත් එහි පරිගණක මධ්‍යස්ථානයක් වැනි ස්වයං රැකියා මධ්‍යස්ථානයක් පිහිටුවීමට අදහස් කරන බවත් පැවසීය. මෙම මධ්‍යස්ථානයට කොම්පියුටර් 02 ක් පරිත්‍යාග කිරීමටද ඔවුන් පොරොන්දු විය.

ආර්. එල්. හෙක්ටර් ජයතිලක

තොඩුවාව, සුසාන භූමියේ ශ්‍රී කුරුසියේ දෙව්මැඳුරේ රජත ජයන්තිය හා සා. අන්තෝනි දෙව්මැඳුරට අයත් දිව්‍ය හෘදය සමිතියේ ස්වර්ණ ජයන්තිය දා මීසම් සේවක ගරු ඉයුජින්ද සිල්වා පියතුමන් සමඟ දිව්‍ය හෘදය සමිති සාමාජිකාවෝ සේයාරුවකට මුහුණ දුන් අයුරු.

මයිකල් රූද්‍රිගු



# ජපමාලයේ ඇසූ පිරූ තැන්



**මානසික ඔසුවක් මෙන්ම යාච්ඤාවේ හා භාවනාවේ මුසුවක් බඳු ජපමාල ධ්‍යානය කතෝලික වත් පිළිවෙතක් ලෙස වසර 1200 ක් පැරැණිය.**

මෙහි මූලාරම්භය නව වන සියවස දක්වා දිවයන බවට ද මත තිබේ. එම වකවානුවේ දී තාපස දිවි පෙවෙතක් ගත කළ අයිරිෂ් ජාතික කතෝලික පැවදි සහෝදරවරු පිරිසක් බයිබලයේ ස්තෝත්‍ර ගීතිකා 150 ක් එක දිගට රිද්මයානුකූලව යැදුමට පුරුදු පුහුණු වී සිටියහ. දිනපතා සවස් යාමයේ වූ එම යැදුම් මෙහෙය ඒ තාපසාරාමය අවට වූ ජනතාවගේ සිත් ඇද බැඳගත්හ. ඒ අනුව ඔවුන්ද එකී යැදුම් මෙහෙයට සහභාගි වූහ.

එනමුත් ඔවුනට එම දීර්ඝ ස්තෝත්‍ර යැදුම් මතකයේ රඳවා ගැනීම අසීරු වීම හේතුවෙන් කල්යත්ම ඒ කෙරෙහි වූ උනන්දුව පිරිහෙන්නට විය. ඒ බව වටහාගත් තාපස සහෝදරවරු ඒ වෙනුවට එකල ජනතාවට හුරු පුරුදු පරමණ්ඩල ආරාධනා යාච්ඤාව 150 වාරයක් උච්චාරණය කිරීමට යෝජනා කරන ලදි.

ජනතාව යැදුම් මෙහෙයේ දී එම පිළිවෙත අනුගමනය කළේය. ඒ අතරම ඔවුන් දැන සිටි අනෙකුත් යාච්ඤා ද සතුටින් ඇදාගන්නා ලදි. ඒ සමඟ එම යැදුම් ගණන නිශ්චිතව ගණනය කරගැනීම සඳහා කුඩා රවුම් බොරළු කැට 150 ක් උපයෝගී කරගත් අතර ඒවා සම් වලින් සැදූ කුඩා මලුවල දමා රැගෙන ආහ. තවත් සමහරු දිග සිහින් ලණු වල මදක් ඈත්ව පිහිටන සේ එම ලණුවෙන්ම ගැට 50 ක් යොදා එය මාරුවෙන් මාරුවට තුන්වරක් භාවිතයට ගන්නා ලදි. පසු කලෙක සිහින් ලණුවල කුඩා ලී කැට අමුණා එය යාවත්කාලීන කරන ලදි.

මෙම තාපස සහෝදරතුමන් විසින් විටින් විට සිදුකරන ලද යුරෝපා රටවල ගමන් බිමන් හේතුවෙන් එම රටවල ද මෙම යැදුම් පිළිවෙත පැතිරෙන්නට විය. 12 වන සියවසේ දී සමහර යුරෝපීය රටවල කෙටි යාච්ඤාවක් වූ දේව දූත මංගලම් යාච්ඤාවේ මුල් පදය වන "නමෝ මරියනි, ප්‍රියප්‍රසාද පූර්ණවන්තියනි" යන කෙටි වදන පරමණ්ඩල ආරාධනාවත් සමඟ යෙදීම ආරම්භ වුණි.

ලොවේ දුරාතීතයේ මෙන්ම ක්‍රිස්තු පූර්ව සමයේ දීත් එදා පැවති සම්ප්‍රදායන් අනුව භාවනානුයෝගීව නිරන්තරව එකදිගට එකම යැදුම යදින පිළිවෙතක් හා ඒ සඳහා යැදුම් ඇට" භාවිතය පැවතුණි. මධ්‍යකාලීන සමයේ දී මෙම යැදුම් ඇට උපයෝගී කරගනිමින් පරමණ්ඩල ආරාධනාව හා නමෝ මරිය යැදුමක් උච්චාරණය කිරීම සිදුවිය. එය "පාට පෝස්ටර්ස්" නම් ලතින් වදනින් හැඳින්වුණි. එහි සිංහල අරුත වන්නේ "අපගේ පියාණෙනි" යන්නය.

සම්ප්‍රදායානුකූල මතය අනුව 13 වන සියවසේ එනම් වසර 1214 දී මරි මව් තුමිය විසින් ජපමාලය සාන්ත දොමිනික් තුමා වෙත පවෙල්ලි දෙව්මැඳුරේ දී ලබා දුන් බව සඳහන් වේ. මෙම සිද්ධිය සමරනු වස් "ජපමාලයේ අප ස්වාමිදුව" යන නාමයෙන් එතුමිය හඳුන්වාදෙනු ලැබීය.

තවද එම ජපමාලය ලබාදීමේ දී එතුමිය සාන්ත දොමිනික් තුමාට එම ජපමාල ධ්‍යානය ජනතාව අතර පතළ කරන ලෙසත් එම හේතුවෙන් දොමිනික් තුමාගේ නිකාය මහත් දියුණුවක් අත්කර ගන්නා බවත් පවසා ඇතැයි විශ්වාසයක් පවතී. මේ අනුව එතුමා ඇල්බිජන්සියන් ජනතාව අතර ධර්මදූත කටයුතු කරමින් ජපමාල යැදුම පිළිබඳව ඔවුන් දැනුම්වත් කර ප්‍රචලිත කරන ලදි.

13 වන සියවසේ දී මධ්‍ය කාලීන දේවධර්මාචාර්යවරුන් විසින් ඉදිරිපත් කරන ලද මතය වූයේ අදාළ මූලික බයිබලීය ස්තෝත්‍ර ගීතිකා මඟින් අඟවන්නේ ජේසු ස්වාමිදරුවන්ගේ ජීවිතය, මරණය, උත්පත්තියේ අභිරහස් බවයි. එබැවින් ඔවුන් විසින් මෙම එක් එක් ස්තෝත්‍ර ගීත වලට අමතරව ජේසු ස්වාමිදරුවන් වෙනුවෙන් ප්‍රශංසා ගීතිකාවන් ද ලිවීම ආරම්භ කළහ. තවද ඒ සමඟ මරි මවුන්ට ද ඒ හා සමාන ප්‍රශංසා ගීතිකාවන් නිර්මාණය කෙරිණි. මෙම ගීතිකා හා අනෙකුත් යැදුම් සියල්ලගෙන් සමන්විත ජපමාලය කොටස් 50 බැගින් වූ කාණ්ඩ වෙන්කර "රොසේරියම්" නමින් නම් කරන ලදි. එය ඉංග්‍රීසි භාෂාවෙන් "රෝසරි කියා හඳුන්වයි. "රොසේරියම්" යන වදනේ අරුත "රෝස මල් උයන"යි. එය "රෝසමල් කලඹ" යනුවෙන් කා අතරත් ප්‍රචලිතව පවතී. රෝස මල් දේව මෑණියන් වෙත දක්වන විශේෂ පූජෝපහාර සංකේතයක් වේ. ගුවාඩලූපේ හි අප ස්වාමිදුවගේ හා "රෝසා මිස්ටිකා" නම් වූ රෝස කුසුම මෑණියන්ගේ චිත්‍ර හා කතා මඟින් ඒ බව පසක් කරයි.

කල්යෑමේ දී ස්තෝත්‍ර ගීත ලිඛිත ගීත බවට අර්ථ දැක්වීමත් සමඟ සෑම ජපමාල ඇටයකට විශේෂ වූ භාවනාත්මක සිතුවිල්ලක් ඇතුළත් වුණි. මෙම නවාංගය ඇතුළත් ජපමාලය දොමිනිකානු නිකායේ භාග්‍යවත් ඇලන්ඩි ලා රෝච් තුමා විසින් ජනතාව අතර ජනප්‍රිය කරන ලදි. එය වසර 100 කට පමණ පෙර සාන්ත දොමිනික් තුමා ලද මව්ගේ වරම අනුව පවත්වාගෙන ගිය ජපමාල සංඝයේ ක්‍රියා පිළිවෙතට ලබා දුන් නව ප්‍රවණතාවයි. ඒ අනුව



රොසේරියම් නම් වූ ජපමාල දැහැනට අඩංගු වූ යැදුම් කොටස් 10 කට බෙදා ජපමාල පංති ලෙස හඳුන්වා දෙනු ලැබීය.

**ලබන සතියට....**

**සිරිල් පෙරේරා**
ඇතුගල්පුර නින්නාද සංසදය

## ජපමාල මෑණියනී

නමෝ මරියනි, ප්‍රසාද පූර්ණ වන්තිනී
සැම වනිතාවන් අතරින් ආසිරි ලද්දිනී
ජේසු කුමරු කුසයෙ දැරූ භාග්‍යවන්තිනි
සමිඳුන් ශ්‍රී හස්තයෙ රැකවරණ ලද්දිනී

පාපිවූ සැම ගලවා ගැනුමට රිසි වෙමිනී
මනුලොව සිට සගලොව වෙත ඉණිමඟ ලෙසිනි
ඔබ අප හට දුන් මාලය තිළිණ විලසිනී
අමිලවූ ජපමාලය නම් වේ මැයි මෑණි

ජපමල් මාසය සපුරා අප කැප වෙමිනී
බලගතු ජපමාලය යදිනෙමු බැති සිතිනී
සැම නපුරෙන් මුදවාගෙන රක්ෂ කරමිනි
මරණ මොහොතෙ අප වෙනුවෙන් යදිනුව මෑණි

**පද්මා ප්‍රනාන්දු - දුම්මලදෙනිය**

## ජපමාලය යදිමු නිතිදින බැතිවු

සෝදුක් කඳුලැලි මෙදියත මකලා
දහම් අමා රසයෙන් ඔපලා
නමො නමො මෑණියේ කියලා
ජපමාලය රන් දම් ගොතලා

ලොව පාපයේ රුදු බව දැකලා
මෑණියේ ඔබ ලේ කඳුලින් තෙමිලා
නමො නමො මරියනි කියලා
යදිනට ජපමාලය මුල්තැන දීලා

ජපමාලයෙ මාසය ඔබ හට කැපවූ
ගැලවුම තිර විශ්වාසය කැටි වූ
මිහිමත යදිනට දෝතට තිළිණය වූ
ජපමාලය යදිමු නිතිදින බැති වූ

**ඇග්නස් සියඹලාපිටිය - කටුවපිටිය**

## දේව ඇරයුමට සවන් දී...



බාල වියේ සිට
හදවත තුළ සැඟවී ඇති සිහිනය.....
කැඳවීමේ බලාපොරොත්තුව...
මාගේ මුළු ආත්මයේ ම
පැතිරී ගොස් ඇත
දේව ඇරයුමට සවන් දී...
මම දැන් පැමිණ සිටින්නෙමි
ඔබතුමන්ගේ නිවහනට....
එකමුතුකමේ දොරගුළු ඇරුනා සේ
පැවිදි සොහොයුරියන්ගේ
මුහුණේ සිනහව අතරේ....
ඔබතුමන්ගේ ආදරය
අත් දැක්කෙමි...
මා කිතු සමිඳේ!

**නිරූපා මධු කුමාරි**
පූර්ව ආධුනික සොහොයුරිය, ගොළු බිහිරි අය සඳහා වන දේව සංරක්ෂණයේ දියණියෝ - පළගතුරය

## සභා පියවරු 46 කොටස

**මහාචාර්ය ඇන්ටන් මීමන විසිනි**

## අපෝස්තුළුවරු දොළොස් දෙනාගේ ඉගැන්වීම හෙවත් ඩිඩාකේ - 4

**පසුගිය සතිය හා සබැඳේ....**

"දෙවියන් වහන්සේගෙන් තොරව කිසිම දෙයක් සිදුනොවන්නේ ය" යන අවබෝධය තුළ ඔබට සිදුවන සෑම දෙයක්ම යහපතක් ලෙස බාර ගන්න.

මාගෙ දරුව, දිවා සහ රාත්‍රියේ "දෙවියන් වහන්සේගේ වචනය ඔබ වෙත ගෙනා ඔබගේ නායකයන් සිහි කරන්න." (හෙබ්‍රෙව් 13:7). ස්වාමින් වහන්සේට ගරු කරන්නාක් මෙන් ඔවුන්ට ගරු කරන්න. ස්වාමින් වහන්සේගේ ස්වභාවය සාකච්ඡා කරන්නේ කොතැනද, උන්වහන්සේ එතැන වැඩ සිටින සේක.

සාන්තුවරයන්ගේ සුවදායක සතුටු සාමිචිය භුක්ති විඳින පිණිස ඔවුන්ගේ මිත්‍රත්වය දිනපතාම සොයා යන්න. සභා භේද භින්න වීමක් නුඹ විසින් ආරම්භ නොකළ යුතුයි. ඒ වෙනුවට ගැටුම් ඇති අය සමඟ සමාදාන විය යුතුයි. නුඹගේ විනිශ්චයන් සාධාරණ විය යුතුයි.

පුද්ගලයන්ගේ වැරදි පෙන්වා දෙන විට, සැම දෙනාටම එක හා සමානව සලකන්න. එහිදී අනිසි පක්ෂපාතිත්වයක් නොපෙන්වන්න. එවැනි තීරණයකදී දෙගිඩියාවෙන් පසු නොවන්න.

දේවල් ලබා ගැනීමට පමණක් අත දිගු කරන, නමුත් යමක් දානය කිරීමට අවශ්‍ය වූ විට අත හකුළා ගන්නා කෙනෙක් නොවන්න. නුඹගේ ශ්‍රමය නුඹට ආදායමක් ගෙන දී ඇත්නම්, එයින් නුඹගේ පව් සඳහා වන්දියක් ගෙවන්න. දීමට දෙගිඩියාවෙන් පසු නොවන්න. දෙන විට නරක සිතින් නොදෙන්න. එවිට නුඹ නුඹට නැවත ඉතා යහපත් වරප්‍රසාදයක් සහිතව ත්‍යාගයක් දෙන තැනැත්තා කවුද කියා සොයා ගන්නේ ය.

උවමනාවන් පෙළෙන පුද්ගලයන්ව ප්‍රතික්ෂේප නොකරන්න. සෑම දෙයක්ම නුඹගේ අසල්වැසියා සමඟ බෙදා ගන්න. කිසිම දෙයක් නුඹ අයිති නොවන බව පවසන්න. සදාකාලික දේවල් අප පොදුවේ තබා ගනිත් නම්, වෙනස් වන තාවකාලික දේවල් අප කොතරම් දුරට පොදුවේ තබා ගත යුත්තේ ද?

නුඹගේ පුතාට හෝ දුවට නුඹගේ වගකීම පැහැර නොහරින්න. ඔවුන්ගේ තරුණ කාලයේ සිටම දෙවියන් වහන්සේට ගරු කිරීමට නුඹ ඔවුන්ට උගැන්විය යුතුවේ. නුඹගේ සේවකයන්ට සහ සේවිකාවන්ට නියෝග දීමේ දී රළු පරුෂ නොවන්න. නුඹ බලාපොරොත්තු තබා ගෙන තිබෙන දෙවියන් වහන්සේ තුළ ඔවුන්ද තම බලාපොරොත්තුව තබාගෙන ඇත. එහි ප්‍රතිඵලය විය හැක්කේ ඔවුන් නුඹලා නිසා දෙවියන් වහන්සේට ගරු කිරීම නවතා දැමිය හැකි වීමයි.

දෙවියන් වහන්සේ අපව කැඳවන විට අපගේ තරාතිරම නොසලකන සේක. උන්වහන්සේ ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් සූදානම් කර ඇති අයව කැඳවන සේක. සේවකයෙනි, දෙවියන් වහන්සේව නියෝජනය කරන්නා සේ නුඹලාගේ ස්වාමිවරුන්ට ගෞරවය සහ යටහත්කම සහිතව කීකරු වන්න.

සියලුම ආකාරයේ කුහකකම් සහ දෙවියන් වහන්සේව ප්‍රසන්න කිරීමට අසමත් වන සෑම දෙයක්ම නුඹ බැහැර කළ යුතු වේ. නුඹ ස්වාමින් වහන්සේගේ අණ පනත් අතහැර දැමිය යුතු නොවේ. නුඹට ලබා දී ඇති අණ පනත් වලට "අමතර වචනයක් එකතු නොකර, ඒවායින් කිසිවක් අඩු නොකර" (ද්වීතිය නීති සංග්‍රහය 4:2 ) ඒවා පිළිපැදිය යුතු වේ.

දේවස්ථානය තුළ හමුවන විට, නුඹගේ පව් නුඹ නොසඟවා ප්‍රකාශ කළ යුතුය. සදොස් හෘදය සාක්ෂියක් සහිතව නුඹ යාච්ඤාවට පිවිසිය යුතු නැත. ජීවිතයේ මාර්ගය මෙය වේ.

**ලබන සතියට....**

ජන වන්දනාව

# යාම යැදුමට සහ පොදු යැදුමට අත්වැලක් ලෙසින්

## පළමු සතිය සෙනසුරාදා උදා යාම යැදුම 119 වැනි ගීය

**පසුගිය සතිය හා සබැඳේ**
ඔබ ළඟා වී සිටින සේක :

පුරාණ ගිවිසුමේ විවිධ තත්ත්ව සහ අභියෝග මැද දේව ජනතාව ලද විශේෂතම අත්දැකීමක් වූයේ දෙවි සමිඳාණන් හා සමීප සබැඳියාවයි. එය උන්වහන්සේගේ ව්‍යවස්ථාව (හෙබ්‍රෙව් බසින් "ටෝරා") තේරුම් ගැනීම සඳහා අවැසි "සවන් දීමේ" ආකල්පය විදහා දක්වන්නේ ය (ද්වීතිය 4:7, ගීතා 34:18, 69:18).

### යැදුම

දෙවි සමිඳාණන් වහන්සේ, ඔබවහන්සේගේ ව්‍යවස්ථාව සැබවින්ම අපගේ ජීවිත මාවතට පහනක් ය. ඔබවහන්සේ නිරතුරු අපට යහ මඟ පෙන්වමින් දක්වන පීතෘක සෙනෙහසට හද පුරා තුති පැසසුම් දෙමු. අපගේ ජීවිතයේ විවිධ අවස්ථාවල දී ඔබවහන්සේගේ කැමැත්ත හඳුනා ගනිමින් පලබර ලෙස දිවි ගෙවන්නට අපට වරම් දුන මැනව. ආමෙන්

## පළමු සතිය සෙනසුරාදා උදා යැදුම 117 වැනි ගීය

ගීතාවලිය ග්‍රන්ථයේ ඇති ගී එකතුවේ කෙටිම ගීය වශයෙන් මෙය හඳුන්වා දිය හැකිය. එය පද දෙකකින් පමණක් සමන්විත වූවකි. එහෙත් එහි ඇති සාහිත්‍යමය ගුණාංගයක් ආධ්‍යාත්මික අන්තර්ගතයත් සලකා බැලීමේ දී එහි ඇති දේව ධාර්මික වටිනාකම සුළු කොට තැකිය නොහැකිය. ශු. පාවුලු තුමා රෝමවරුනට ලියන ලද ලිපියෙහි මෙම ගීයේ මුල් පදය අන්‍ය ජාතින් වෙත යොමු වූ දෙවියන් වහන්සේගේ විශ්ව ගැලවීමේ ක්‍රියාවලිය විස්තර කිරීම සඳහා භාවිත කිරීම ඊට හොඳ නිදසුනකි (රෝම 15:11).

මෙම 117 වැනි ගීය අයත් වන්නේ ප්‍රශස්ති ගී කාණ්ඩයටයි. දේව ප්‍රශංසාව සඳහා ආරාධනයත් ඊට පාදක වන හේතුවත් දක්වමින් මෙම ගීය ප්‍රශංසා ගීයක හැඩතලය සංක්ෂිප්ත කොට දක්වයි. ඊශ්‍රායෙල් ජනතාව පුරාණ ගිවිසුම් සමයේ ජෙරුසලෙමට වන්දනා ගමන් ගිය අවස්ථාවන්හි මේ ගීය භාවිත වූ බව විශාරදයෙහි පෙන්වා දෙති.

**ලේඛන සැලැස්ම :**

වගන්ති 1 : දෙවි සමිඳාණන් වහන්සේ පැසසීම සඳහා සියලු ජාතින් වෙත කෙරෙන ආරාධනය.

වගන්ති 2 : පැසසුම් ආරාධනයට මූලිකවූ කරුණ.




ශුද්ධ ලියැවිලි වසර

**(30)**
**ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා**

### විග්‍රහය සහ අරුත:

සකල ජාතිනි : හෙබ්‍රෙව් බසින් යෙදෙන "ගොයීම්" වදන බොහෝ විට යෙදුනේ අන්‍ය ජාතික ගෝත්‍ර නැතහොත් ජන කොටස් හඳුන්වා දීමයි (උත්. 25:16, ගණන් 25:15). එය ගීය තුළ අවධාරණාත්මක ලෙස යොදා තිබීම තුළින් ප්‍රශංසාව සඳහා වූ ඇරැයුමේ විශ්වීය බව ඉස්මතු වේ.

ප්‍රශංසා කරන්න: හෙබ්‍රෙව් බසින් යෙදෙන "හලල්" ක්‍රියා පදය යාච්ඤාවේ ආකල්පයක් මෙන්ම ඇදහිල්ලේ ප්‍රකාශ වීමක් ද හඟවයි. අන්‍යජාතින් හට දෙවියන් වහන්සේ පිළිබඳ පූර්ණ අනාවරණය ලැබී නැතත් ඔවුන් අත්දකින දේ තුළින් ගැලවීමේ තිළිණය වෙනුවෙන් දෙවිඳුන්ට පැසසුම් දිය හැකිය.

ප්‍රේමය - විශ්වාසවන්තකම: දෙවියන් වහන්සේ හා මිනිසා අතර ගිවිසුම් පැවැත්ම තුළ දෙවියන් වහන්සේ අනන්‍යතාව ප්‍රකාශ වූයේ උන්වහන්සේගේ ගුණාංග සඳහන් කිරීමෙනි. "ස්ථිර ප්‍රේමය" (හෙබ්‍රෙව් බසින් "හෙසෙද්") හා "විශ්වාසවන්තකම" (හෙබ්‍රෙව් බසින් "එමෙන්") දේව ජනතාව නිරන්තරයෙන් දෙවි සමිඳාණන් ගැන මෙනෙහි කිරීමට තුඩු දුන් දේව ගුණාංග වේ. ඒවා තෝරාගත් ජනතාවට ද අන්‍ය ජාතින්ට ද පිරිනැමෙන දෙවි සමිඳුන්ගේ කොන්දේසි විරහිත ආදරය හා ගැලවීමේ තිළිණය ප්‍රබල ලෙස විදහා දක්වන්නේ ය.

### යැදුම

සකල විශ්වයේ නිර්මාතෘවරයාණන් වන දෙවි පියාණනි, ඔබවහන්සේ කිතුනු අප වෙත ද සියලු ජාතින් වෙත ද දක්වන අසීමිත දයා කරුණාව වෙනුවෙන් අපගේ හෘදයාංගම ස්තුතිය හා ප්‍රශංසාවද පුද කර සිටිමු. මිනිස් සමාජයේ විවිධ අත්දැකීම් හා ප්‍රවණතා මැද ඔබවහන්සේ කෙරෙහි ගැඹුරු විශ්වාසයෙන් ජීවත් වීමට අපව ශක්තිමත් කර වදාළ මැනව.

ලබන සතියට

**ගරු හෙන්රි සිල්වා පියතුමා** **54**

# පුරාණ ගිවිසුම තුළ දිවැසිවරු




පසුගිය සතිය හා සබැඳේ

පස්වන වගන්තිය :
යුක්තිය හා විශ්වාසවන්තකම මත ඔවුන් වහන්සේගේ රාජ්‍යය පදනම් වේ. විශ්වාසවන්තකම යන්න ගිවිසුම ආශ්‍රිතව ප්‍රකාශ වන ඔවුන් වහන්සේගේ නිරන්තර ප්‍රේමය සම්බන්ධ වචනයකි. යුක්තිය යනු කෙනෙකුගේ සාධාරණ අයිතිවාසිකම් ලබා දීමයි.

6-9 දක්වා වගන්ති -
මිනිසා සහ සත්ත්වයා අතරද සත්ත්වයන් එකිනෙකා අතරද සාමකාමීත්වය රජ කරයි. මෙය, උත්. 1/29-30 හා සමාන්තර වෙයි. එබැවින් මෙම දෘශ්‍යමය විස්තරය, මෙසියානික රාජ්‍යය තුළ පවතින සාමකාමීත්වය පිළිබඳ විස්තරයක් වෙයි. (යෙසායා 2, 4 )

### මීකා 5/1-4

පළමුවන වගන්තිය -
මෙය, යුක්තිය හා ධර්මිෂ්ඨකම ප්‍රගුණ කිරීම නමැති තම යුතුකම පසක දැමූ ඉශ්‍රායෙල් නායකයන් මත දැඩි විනිශ්චය ක්‍රියාත්මක වන බව පැවසෙන වගන්තියකි. ඉශ්‍රායෙල් හි රාජ්‍ය පාලනය, දෙවියන් වහන්සේගේ රාජ්‍ය පාලනය ලෙස අවබෝධ කොට ගැණුනු අතර, රජතුමා මිහිපිට දේව නියෝජිතයකු ලෙස හඳුනා ගැනිණි. එබැවින් ඔහු ආලේප කරනු ලැබ, දෙවියන් වහන්සේගේ හදා ගත් පුත්‍රයා ලෙස නම්කරනු ලැබීය. (ගීතා 2, 7). මෙම භූමිකාව සතුටුදායක ලෙස රඟපෑම ඉශ්‍රායෙල් රජවරුන් අතින් සිදු නොවිය. එනිසා, දෙවියන් වහන්සේගේ දැඩි විනිශ්චය රජවරුන් මත මෙන්ම අනෙකුත් පාලකයන් මත ද පතිත විය. මෙම වගන්තිය නිරූපණය කරනුයේ, සතුරු රජවරුන්, ඉශ්‍රායෙල් රජතුමන් පරාජය කොට. ඔහුට කෙවිටකින් පහර දෙන බවය. මෙය එසකියෙල් 34/11-19 හා සමාන්තර වෙයි.

දෙවන වගන්තිය -
"එම්බා බෙත්ලෙහෙම් එප්‍රාතා". දිවැස්වැකිය මඟින් අමතනු ලබන්නේ බෙත්ලෙහෙමේ උප ගෝත්‍රයකි. දාවිත් රජතුමා පැමිණියේ එම පෙළපතෙනි. එමනිසා, දාවිත්ගේ පෙළපත හා සම්බන්ධ මෙසියානිකත්වය පිළිබඳව දිවැසිවරයා වක්‍රව කථා කරන බව පෙනේ. "ඉශ්‍රායෙල්හි අධිපතියා වීමට කෙනෙක් තී කෙරෙන් නැඟී එන්නේය". මෙය, දාවිත්ගේ පෙළපතෙන් පැමිණෙන මෙසියානික රජතුමා පිළිබඳ සෘජු ප්‍රකාශනයකි."එතුමන්ගේ පෙළපතේ මුල දුරාතීතයෙන්ද, පැරණි යුගයෙන්ද එන්නකි." මෙම ප්‍රකාශනය, 2 සාමුවෙල් 7, 10-17 වෙත යළි අප ගෙන යයි. එය, දාවිත්ගේ පෙළපතෙන් මතු අනාගතයේදී පැමිණීමට නියමිත මෙසියානික රජතුමා පිළිබඳව නාතාන් දිවැසිවරයා විසින් දාවිත් රජතුමාට පවසන ලද දිවැසි වැකියයි.

තුන්වන වගන්තිය :
"ගැබ්ගෙන සිටින ස්ත්‍රිය දරුවකු බිහි කරන තෙක්". මෙය මෙසියානික රජතුමාගේ උපත සම්බන්ධ වගන්තියකි.
"සමිඳාණන් වහන්සේ සිය සෙනඟ සතුරන්ට පාවා දෙන සේක". මෙය, ඉශ්‍රායෙල් ජනතාව පීඩාවට පත්වීම හා විප්‍රවාසගතවීම පිළිබඳ සඳහනකි.
"ඔවුන්ගේ සහෝදරයන් ගෙන් ඉතිරි කුඩා පිරිස ඔවුන්ගේ සෙනඟ සමඟ එක් වන්නෝය." මෙය ඉශ්‍රායෙල් ජනතාව යළි ඒකරාශි වීම පිළිබඳවය. විසිර ගොස් සිටින ජනතාව ඒකරාශී කිරීම මෙසියස් තුමාගේ කාර්යයක් වෙයි.

හතර වන වගන්තිය -
" සිය සෙනග පෝෂණය කරනු ඇත." මෙසියානික රජතුමා, තම සෙනඟ සම්බන්ධ යහ්වේ දෙවියන් වහන්සේගේ කාර්යභාරයවූ එඬේරික කාර්යය ක්‍රියාත්මක කරයි. එසකි. 34 පරිච්ජේදය, ගීතාවලිය 23.
"එතුමන්ගේ සෙනඟ ආරක්ෂා සහිතව සිටින්නෝය." මෙය පෙන්නුම් කරන්නේ, මෙසියානික යුගයේ ආගමනයත් සමඟ උදාවන සාමයේ කාල පරිච්ජේදයයි.
"පොළෝතලවැසියන්සියලුදෙනාඑතුමන්ගේපාලනය පිළිගන්නබැවින්..."මෙය,මෙසියානිකරාජ්‍යයේවිශ්වියභානිත්‍ය ස්වභාවය මෙන්ම ස්ථාවරත්වයද පෙන්නුම් කරයි. එය සදාතනික වන දේව රාජ්‍යයයි.

### සෙකරියා 9/9-10

නමවන වගන්තිය
ජෙරුසලෙම ආමන්ත්‍රණය කරමින් පැවසෙන දිවැස්වැකියකි. එය, මෙසියානික රජතුමාගේ පැමිණීම සම්බන්ධව කථා කරයි. ජෙරුසලෙමේ රජතුමා දාවිත්ගේ පෙළපතෙන් පැමිණෙන්නකු විය. එබැවින් මෙසියස් තුමා පැමිණෙන්නේද දාවිත්ගේ පෙළපතෙනි."කොටළුවකු පිට නැග" මෙය පෙන්නුම් කරන්නේ සාමයේ කාලපරිච්ජේදයකි. යුද්ධයක් පවතින විට රජවරුන් සාමාන්‍යයෙන් ගමන් කළේ අශ්වයන් පිට ය.

දහවන වගන්තිය :
උතුරු රාජධානියෙන් (එප්‍රායිම්) මෙන්ම දකුණු රාජධානියෙන්ද (ජෙරුසලෙම) යුද්ධෝපකරණ සියල්ල පහ කර දමනු ලැබේ. "ඔවුන් වහන්සේ ජාතීන්ට සමාදානය ප්‍රකාශ කරන සේක." මෙය, යුද්ධය නොමැතිවීම හේතු කොට ගෙන ඇතිවන ප්‍රතිඵලයක් පමණක් නොව යුද්ධයට දායකවූ සියල්ලම නිෂ්ප්‍රභා කර දැමීමේ ද ප්‍රතිඵලයකි. "ඔවුන් වහන්සේගේ ආණ්ඩුව මුහුදෙන් මුහුදටත්, පොළොවේ සීමා දක්වාත් වන්නේය".. මෙය මෙසියානික රාජධානිය සතු විශ්විය ස්වභාවය සම්බන්ධ ප්‍රකාශනයකි. එලෙසම එය සදාතනික රාජ්‍යයක්ද වේ.

ලබන සතියට....




# "පියා ද මව ද අතහැර... "

## ඔක්තෝබර් 07 - සාමාන්‍ය සමයේ විසිහත්වන ඉරුදින

*විවාහය නමැති උතුම් දේව කැඳවීම ලබන සැමට හිමිවන ආශිර්වාදලත් තත්වය අදට නියමිත දේව ප්‍රකාශන වලින් විස්තර කෙරේ. "ඔබේ බිරිඳ ඔබ නිවස තුළ මිදිවැලක් මෙන් පල දරන්නටත් දරුවන් ඔබේ මේසය වටා ඔලිව් පැළ මෙන් වර්ධනය වන්නටත්" යන්නෙන් කුමක් අදහස් කෙරේ ද? ගීතාවලියේ 128 තෙහිලි ගීය දේව සැලැස්ම ඉදිරියට ගෙන යන්නට කැඳවා ඇති ස්වාමිපුරුෂයන් වෙත කෙරෙන ඇරැයුමක් වැන්න. මගේ පවුල බිරිඳ වෙත මගේ සිහින සැබෑ කරන්නේ කෙසේ ද කියමින් සිටින සැමියකුට දෙවියන් වහන්සේ දෙන බලාපොරොත්තුවේ වදන් සමූහයක් මෙම තෙහිලි ගීතයේ හමුවේ. පුරුෂ මූලික සමාජයේ බිරිඳ සහ දරුවන් තමා සතු වටිනා වස්තුවක් ලෙස සලකන මෙම සැමියාට ස්වාමින් වහන්සේගේ මාර්ගයේ ගමන් කරන්නට ඇරැයුම් කෙරේ. ස්වාමින් වහන්සේ හමුවන එම මාර්ගය තුළ ඔහු සිය පවුලේ අය සමඟ තනිවම නොව උන්වහන්සේ සමඟ ගමන් කරන්නේ ය. ඔහුගේ සිතුම් පැතුම්, වචන, සැලසුම්, තීරණ, හැසිරීම් රටා, ආකල්ප මෙලෙස ස්වාමින් වහන්සේට ප්‍රසන්න වේ.*

*මිදිවැල හා ඔලිව් පැළ යනු පොරොන්දු දේශයේ සමෘද්ධිමත් බව ඉඟි කෙරෙන සංකේත වේ. මිනිසෙක් තම බිරිඳ හා දරුවන් සමඟ වාසනාවන්ත පවුල් දිවියක් ගත කිරීමෙන් ලබන සතුට දෙවියන් වහන්සේගේ ආදරයේ ගැඹුර හඳුනා ගැනීමට මඟක් බව පෙන්වන්නට ගීතිකාකරු උත්සාහ දරන්නේ ය.*

### පියා ද මව ද අතහැර :

ස්වභාවික පවුල් බැම්මෙන් එතී සිටින පුද්ගලයකුට ඉන් මිදී පසු කාලයක හඳුනා ගත් ස්ත්‍රීයකට ප්‍රේමය පිදීමට ගන්නා තීරණය පහසු දෙයක් නොවේ. නමුත් එය කැප නොකර මිනිස් දිවියේ සම්පූර්ණත්වය කරා යන ගමන යා නොහැකිය. මැවුම්කාරයාණන් මිනිසා නිර්මාණය කර සැලසුම් කර ඇත්තේ තව තවත් වර්ධනය වන්නටය. "අත් හැර ඇළුම් වන්නේය" මෙය විවාහයේ අඛණ්ඩතාවය ඉස්මතු කරන්නකි. උපතේ සිට දීර්ඝ ගමනක් පැමිණ පවුල් දිවිය තුළ දරුවෙක් ලෙස පෝෂණය වී හැදී වැඩී එවැනිම දරුවන් පෝෂණය කර හදා වඩා සමාජයට තිළිණ කරන්නට යන මෙම ගමනට නව ආරම්භයක් දෙමින් පවුල් දිවිය අරඹන්නේ ය. එම ගමන මරණය දක්වා දිව යන්නකි. මෙසේ උපතේ සිට මරණය දක්වා ඇති දීර්ඝ කාලයේ විශේෂ සංධිස්ථානය විවාහයයි. මුලින් පෝෂණය වී පසුව අන් අය පෝෂණය කරන්නට මෙය සුවිශේෂ කැඳවීමකි. එමෙන්ම එය පූර්ණ පරිත්‍යාගයේ සංකේතයකි.

### දෙවියන් වහන්සේ ස්ත්‍රිය හා පුරුෂයා ලෙස ඔවුන් මැවූ සේක.

මිනිස් දිවියේ නිර්මාතෘ දෙවියන් වහන්සේ ය. එය උතුම් පරමාර්ථයක් සඳහා මවා ඇත. එය මිනිස් ඥානය පරයා යන දෙවියන් වහන්සේගේ ප්‍රඥා සැලැස්මේ එක් අංගයක් පමණි. ස්වභාව ධර්මයේ මිහිර හා චමත්කාරය දකින අපි කොතරම් ඒ ගැන සතුටු වෙමුද? එලෙසම විවාහය එම සැලැස්මේ කොටසක් ලෙස දකිමුද? පුද්ගලයකු මෙලොවට උපදින විට ස්ත්‍රී පුරුෂ භාවය තීරණය කරන්නේ දෙවියන් වහන්සේ ය. මිනිසාගේ පැත්තෙන් එම තීරණය පිළිගැනීමට අනිවාර්යයෙන් සිදුවේ. අපට ආදරය කරන දේව තාත්තාගේ කැමැත්ත බාරගත යුත්තක් මිස එයට අභියෝග කිරීමට අපට නුපුළුවන.

### දික්කසාද කිරීම නීතියට අනුකූල ද?

මෙය ජේසුස් වහන්සේ පරික්ෂා කිරීමට මෙන්ම නීති රීති වල හිඩැස් තැන් වලින් ප්‍රයෝජන ගැනීමට මාන බලන ආත්මාර්ථකාමී චේතනා ඉටු කර ගැනීමට අසනු ලැබූ ප්‍රශ්නයකි. දේව කැමැත්ත මිනිසා පවුල් හැටියට එකතු කිරීම මිස වෙන් කිරීම නොවේ. මෙලොව හමුවන සමහර විට දරන්නට බැරි ප්‍රශ්න ඉදිරියේ නොසැලී සිටින්නට ශක්තිය මා සතු නොවේ. අන් අයගේ සහය අනිවාර්යයෙන්ම ලබා ගැනීමට ජේසුස් වහන්සේ ගන්නා උත්සාහය පැහැදිලිය. මිනිසාගේ සැබෑ යථාර්ථය මුළුමනින්ම දන්නේ දෙවියන් වහන්සේ පමණි.

මරණය දක්වා අපගේ ජීවිත සමහර විට අභිරහසකි. හෙට දවස කෙසේ ද කියා කිසිවකුට සීයයට සියයක්ම අනාවරණය කරගත නොහැකිය. මිනිසාගේ දුර්වල මිනිස් ස්වභාවයේ ගැඹුර දන්නේ උන්වහන්සේ පමණි. උන්වහන්සේගේ ආදරණීය සැලැස්ම තුළ අපට කරන්නට ඇති එකම දෙය වන්නේ ඒ ආදරයේ ගැඹුර හා තරම හඳුනා ගැනීමට උත්සාහ දැරීම පමණි.

විවාහය ඉතා පූජනීය තිළිණයක් ලෙස මිනිසාට ප්‍රදානය කරනු ලබන තර එහි පූජනීය තත්ත්වය එදිනෙදා දිවියේ දී අත් දකින්නට ඔවුන් තුළ විශේෂ කැපවීමක්, උද්යෝගයක්, සැලැස්මක් හා ඕනෑකමක් නිසැකවම තිබිය යුතුවේ. කිතුනු අපට විවාහය නමැති සක්‍රමේන්තුව ශුද්ධවත් දෙයක් ලෙස භාර ගත යුතු බවට නිතර නිතර සභා මාතාව මතක් කරන්නීය.

### සිතන්න:

1. විවාහයේ අඛණ්ඩභාවය හා ඒකීයභාවය ගැන අද මට කුමක් ස්වාමින් වහන්සේ පවසන්නේ ද? 2. විවාහය තුළ කොපමණ අවධානයකින් හා සැලකිල්ලකින් ඒ දෙස මම බලන්නේ ද? එහි උතුම්කම සුරැකීමටත් සුරැකීමෙන් ලොවට ආදර්ශයක් දීමටත් ලබා ඇති කැඳවීමට මම කොතරම් අවනතව කටයුතු කරන්නෙම්ද?

ගරු උපුල් සිල්වා පියතුමා

# ශ්‍රී ලාංකික වැඩිහිටියා කොයිබටද ?

**කතුතුමනි,**

ශ්‍රී ලංකාව තුළ වැඩිහිටියකු වශයෙන් ගණිනු ලබන්නේ අවුරුදු හැට සම්පූර්ණවූ විටය. වසර හැට ඉකුත්වූ හැම කෙනෙක්ම රට තුළ නිෂ්ක්‍රිය පුද්ගලයන් ගණයට ඉබේම වැටෙනු ඇත. දැන් ඉතින් පිනක් දහමක් කරමින් එක්තරා ක්‍රියාකාරි බවේ සීමාවන් පනවමින් පසුවිය යුතු කාලය එළඹී ඇති තැනට වැඩිහිටියා තල්ලු කර දමයි.

රාජ්‍ය සේවය සම්පූර්ණයෙන්ම ඔහු අක්‍රිය පුද්ගලයකුසේ විශ්‍රාම යවා ඔහුගෙන් සේවා ලබා ගැනීම හෝ උපදෙස් පැතීම වුවද සීමා කරයි. ශ්‍රී ලාංකීය කම්කරුවා, ගොවියා හා පෞද්ගලික වෘත්තීන්හි යෙදුනු පුද්ගලයා වසර හැත්තෑව පමණ වන තෙක් හොඳ සේවයක නිරතවෙයි. වියපත් ශ්‍රී ලාංකීක දෙටු පුරවැසියාට රට තුළ පිළිගැන්මක් තිබේද? කුමන තරාතිරමක කුමන වෘත්තියක පෙනී සිටියද වියපත් බවට පත්වූ දෙටු පුරවැසියා ඇසූ පිරූ තැන් ඇති ප්‍රබුද්ධ පුද්ගලයෙකි. ඔහුගේ පරිනත බව අප්‍රමාණය, අනන්තය, අමිලය. බොහෝ විට වැඩිහිටියෝ මාතෘත්වය, පිතෘත්වය දරමින් රටට දූ පුතුන් දායාද කර ඇත්තාහ. ඒ දූ පුතුන් අද රටේ සංවර්ධනයේ නියමුවන් එසේ නැතිනම් නායකත්වයේ නියමුවන් වී සිටිති.

එසේ වුවද ඒ වැඩි හිටියා අද සමාජය තුළ බොහෝවිට පසු බෑමකට ලක් වී ඇති බවක් දක්නට ලැබේ. ශ්‍රී ලාංකීය දේශපාලනයේදී ද වැඩිහිටි ඇමතිවරුන්ට සිය කාර්ය නියමයකින් තොරව ජ්‍යෙෂ්ඨ ඇමති පදවි නිර්මාණය කර දී ඇත. රජය හැටවෙනි වසර ඉක්ම ගිය පසු ඔහුව කිසිත් බැරි නොහැකි (මහළු) ගොඩට ඇද දැමීමක් කර ඇතැයි සිතමි. මෙයින් ද ගම්‍ය වන්නේ ජ්‍යෙෂ්ඨ පුරවැසියා ජ්‍යෙෂ්ඨත්වයට පත්වන විට මන්දගාමි වන බව නොවේද? එසේම තරුණ නායකත්වය රටට අවශ්‍ය බව පෙන්වමින් ඔවුන් එක්තැන් කර තැබීම නොවේද?

රජය වැඩිහිටියා නඩත්තු කරන්න යොදා ගෙන ඇති ක්‍රියාපිළිවෙළ කුමක්ද? ඉතාම සුළු පිං පඩියක් ලබාදීමයි. එය සාමාන්‍ය දෙටු පුරවැසියකුට මාසයට බුලත් විට පාවිච්චි කිරීමටත් මදිය. මේ වන විට දරුවන් අතහැර දමා කිසිදු ආදායම් මාර්ගයක් නොමැතිව තම පැල්පතට වී කුසගින්නේ පසුවන වැඩි හිටියෝ අප රට තුළ කොතෙකුත් පසුවෙති. එහෙත් ඒ අය ගැන සොයා බලන්න වැඩ පිළිවෙළක් රට තුළ ඇද්ද? අද රජය වැඩි උනන්දුවකින් ගම් තුළ වැඩිහිටි සමිති නිර්මාණය කරමින් පසුවෙයි. ඒ සමිති ද දේශපාලන අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට රැකුලක් වනසේ සකස් වූ ඒවා බවට සැක නැත. සම්ප්‍රදායි සමිති ක්‍රමවේදය අනුගමනය කරමින් දීර්ඝ දැක්මකින් තොරව වැඩිහිටියාගේ අවශ්‍යතා හරිහැටි තේරුම් නොගෙන අඳුරේ අතපත ගාමින් යන වැඩිහිටි සමිති කෙතරම් අර්ථවත්ද? වැඩදායකද කියා සොයා බැලිය යුතුය.

ලෝකයේ දියුණු රටවල් හා සසඳා බලන කල වැඩිහිටියා රටේ පූජනීයම පුද්ගලයා ලෙස පිළිගෙන ඔහුට ජීවිත කාලයටම යැපෙන්නට අවශ්‍ය සියලුම පහසුකම් ඒ රටවල සපයාදී තිබේ. ඔහුගේ පරිණත බුද්ධිය රටේ අභිවෘද්ධියට නිතරම දායක කර ගනියි. අවුරුදු අනූව පසුකරමින් පවා ඒ දියුණු රටවල සංවර්ධනයේ අවශ්‍යතා ඉටුකරන වැඩිහිටියා රටට සම්පතක් සේ මෙම දියුණු රටවල් අපේක්ෂා කරයි. එහෙත් ශ්‍රී ලංකාව අද කටයුතු කරන්නේ වැඩිහිටියා රටට බරක්සේය. ඔහු උපයන්නෙක් නොව යැපෙන්නෙකුසේ සලකයි බොහෝවිට රට තුළ යම් ක්‍රියාකාරි අවශ්‍යතාවන්හිද තම අවශ්‍යතා සපුරා ගැනීමේදී වැඩිහිටියාට පසු බහින්න සිදුවී තිබේ. මෙයට ප්‍රධාන හේතුව ලාංකීය සමාජය තුළ වැඩිහිටියා පිළිබඳ ඇති වැරදි ආකල්පයයි. එයින් සමාජ පරිහානියක් දිස්වෙයි. ආගමික සාරධර්ම වලින් පිරිපුන් සමාජ පසුබිමක් තුළ වැඩිහිටියා පූජනීය තැනක තබා කටයුතු කිරීමට නොහැකිවී ඇත්තේ සමාජ ආර්ථික ප්‍රවනතාවම මිස අනෙකක් නොවේ.

වැඩිහිටියා නොසලකා කටයුතු කරන සමාජයක් තුළ සියලුම දේ පිරිහීමකට ලක්වීම අමුතුවෙන් කිව යුතු නොවේ. ශ්‍රී ලංකාව තුළ ග්‍රාමීය සංවර්ධනයේ සිට රටේ මහා පරිමාණයේ සංවර්ධන ක්‍රියාවලියට ජ්‍යෙෂ්ඨ පුරවැසියා දායක කරගත යුතුය. ශ්‍රෙෂ්ඨ ප්‍රබුද්ධ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෘත්තිකයන් වශයෙන් නොව ස්වෙච්ඡා පදනමක් මත ඔවුන් තම ප්‍රදේශ තුළ ක්‍රියාකාරි කළ යුතුය. රජය තුළ හඬක් නගන්නට මේ හොඳම කාලයයි. අද දියුණු යයි සම්මත හැම රටක්ම ජ්‍යෙෂ්ඨ පුරවැසියා පෙරටු කර ගෙන සමාජ ආර්ථික සංවර්ධනයේ පෙරමුණට ගමන් කරන අයුරු රටවල් ගවේෂනය කරන්නකුට හොඳ හැටි වැටහේ. රටක විනය ගරුක බව දකින්නට වැඩිහිටියාට සැලකීම ඉතාම හොඳ ගුණ ධර්මයකි. ශ්‍රී ලාංකීය ඉතිහාසයේ ප්‍රෞඪත්වය හෝ බුදු දහම, කිතු දහම, හින්දු මුස්ලිම් දහමේ අග්‍ර පුරෝහිතයන් යයි වහසි බස් දෙඩීම තුළින් වැඩිහිටියාට වන ලාබයක් නැත. කෙතෙක් උදේ පහන්වීමට පෙර බුදු බණ ඇසුවත්, බෞද්ධ රටක් වුවත් සමහර දරුවෝ තම මහලු දෙමාපියන් තමන්ගේ ජීවන ගමනට බාධාවක්සේ සලකා මහලු මඩමට තල්ලු කර දමති. තව සමහරු මහලු මඩම ලඟ වයසක මවව අතරමං කරදමා යති. දහම හරියට අදහන රටක මෙවන් දේ සිදුවිය හැකිද? උපන්දා සිට හරි හම්බ කර ගෙවල් දොරවල් වස්තු සම්භාරය දූ පුතුන්ට දී අනුන්ගේ නිවෙස් වල බැල මෙහෙකරන අවාසනාවන්ත වැඩිහිටියෝ අප රටේ කොතෙකුත් සිටිති. යුද්ධය නිසා අනාථව වැඩිහිටියන් කොතෙක් සිටිත්ද? රෝහල්වල ප්‍රතිකාර ලැබීමෙන් පසු නැවත නිවසට කැඳවාගෙන නොයන වැඩිහිටියන් මානසික රෝහල වැනි ස්ථානවල දරුවන් එනතෙක් බලා සිටිති.

**ඩබ්. එල්. බැසිල් ප්‍රනාන්දු**
වීරහේන

# විවිධ ප්‍රශ්න වලින් බැටකන අයට සහන කමිටු

**කතුතුමනි,**

ගෘහස්ත ප්‍රචණ්ඩත්වය, දරුවන්ගේ ප්‍රශ්න, අඹු - සැමි ප්‍රශ්න, ළමා අපචාර, බේබදුකම්, සමලිංගික ප්‍රශ්න, ආර්ථික සහ රැකියා ප්‍රශ්න ආදී විවිධ ප්‍රශ්න හමුවේ හෙම්බත්ව කල් ගෙවන කතෝලිකයිනට 'පාපෝච්චාරණය' උපදේශනය වෙතින් යම්කිසි මානසික සුවයක් අත්වේ. ඉන් ඔබ්බට ගොස් බියට පත්ව, මිරිකී සිටින සියළුම සැදැහැවතුනට ඇවැසි උපදෙස්, මගපෙන්වීම් හා විසඳුම් ලබාදෙනු වස් පදවි මට්ටමින් ගරු පියතුමකු පැවදි සොයුරියක සහ විශ්‍රාමික නීතිඥයකුගෙන් සමන්විත සහන කමිටු පත්කොට, එමගින් විවිධ ප්‍රශ්න හමුවේ හෙම්බත්වන ජනතාව, මීසම් මට්ටමින්, මීසම් සේවක පියවරුන්ගේ නිර්දේශ මත එම කමිටු හමුවට ගෙන්වා ඔවුන්ගේ ප්‍රශ්න, දුක්ගැනවිලි සාකච්ඡාවට බඳුන් කොට, පෞද්ගලික හා පොදුවේ පැනනැගෙන විවිධ ප්‍රශ්නයන් හමුවේ පීඩා විඳින කිතුනුවනට මානසිකව මෙන්ම ආධ්‍යාත්මිකවද සහන ලබාදිය හැකිය.

එදා පුදසුන අබියස දී දෙවියන් ඉදිරිපිටම දෙදෙනෙකු වශයෙන් පිවිස එකෙකු වශයෙන් දිවි ගෙවනට පොරොන්දු දී 'දෙවියන් විසින් එක්කළ දේ මනුෂයා විසින් වෙන් නොකෙරේවා' යන අවසන් වදනට කන යොමා අත්වැල් එකට පටලවාගෙන දේවස්ථානයෙන් පිටතට පැමිණි යුවළ විවාහවී කෙටි කලකින්ම එක් වහලක් යටදී වසර ගණන් ගොළුවන් මෙන් කතා බහ නොමැතිව කාමර දෙකකය. බේබදු පියාගෙන් පහර කන තම අම්මා බේරා ගැනීමට පියාට තඩිබාන පුතුන්, වසර ගණන් තාත්තා සමඟ කතා නැත. දුව අම්මා සමඟ කතා නැත. පියා විදෙස් රටක සිටියදී තවත් නරුමයකුගෙන් සිය ලිංගික පිපාසය සංසිඳවා ගන්නා මව සිය එකම දියණියද එම නරුමයාට බිළිදෙන රටක අද අපි දිවි ගෙවමින් සිටිමු. ගුවන් විදුලියෙන්, රූපවාහිනියෙන් හිමිදිරියේ සිටම අපට ඇහෙන්නේ පෙනෙන්නේ බණය, අවවාද අනුශාසනාය, උපදෙස්ය. එනමුදු එම වැඩ සටහන් අවසන්වනවාත් සමගම ඒ කියූ සියළුම දේ මිනිසාට අමතකය. දේවස්ථානයක දේව මෙහෙයකට දැහැන් ගතව සුවිශේෂ කියවීම්, දේශනා වලට සවන් දී ගීතිකා මුමුණා සැමට සාමය පතා සැදැහැ සිතින් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබගෙන 'යන්න සාමය රැගෙන යන්න' කන දරාගෙන දෙව් මැඳුරින් පිටව පල්ලියේ මහ දොරින් පිටවූ විගස නැවත පෙර ප්‍රශ්න හමුවේ ඇවෙන්නන්ට මෙබඳු විසඳුම් සහිත 'සහන කමිටු' මගින් නොමිලේ සහන ලබාදිය හැකි නම් එය අන්‍යාගමිකයනට මහගු ආදර්ශයකි.

**එම්. ජෝ. පාරිස්**
වැලිවිට

# ළමා අපචාර වලින් හරි අඩකට දෙමාපියන් වගකිව යුතුයි !

**කතුතුමනි,**

දැනට හිස හරවන හරවන පැත්තෙන් දකින්නේත් ඇසෙන්නේත් ළමා අපචාර ගැන විස්තර සහ සිදුවීම්ය. දෙමාපියන් ද, උගතුන් සහ වියතුන් ද, ගුරුභවතුන් ද, දේශපාලකයන් ද, පූජ්‍ය පක්ෂය ද, කොටින්ම සැමදෙනාම පාහේ ළමා අපචාර ළමා අපචාර කිය කියා බෙරිහන් දෙමින් ළමා අපචාර වලට විරුද්ධව උද්ඝෝෂණ සහ පිකටින් ව්‍යාපාර හතු පිපෙන්නාක් මෙන් දියත් කරති. නමුත් ඒවා හිරු දුටු පිණි සේ මැකී යයි.

මේවාට වැඩිපුරම අසුවී චෝදනාවලට ලක්වී සිටිනුයේ මත්කුඩුවලට ඇබ්බැහි වූවන් සහ නිතර සුරාමතින් සිටින්නන් ද, කුඩා දරුවන්ගේ ළඟම නෑයන් ද, අපට සහ අප රටට යහපත ඉටුකිරීමට පොරොන්දු දුන් දේශපාලකයන් ද, අසහනකාරී තරුණ පිරිස් ද, මෙවැනි දේ වලින් වැලකී සිටීමට අපට ඔවදන් දුන් ගුරුභවතුන් අතර සිටින සමහර ගුරුභවතුන් ද, ජීවිතයේ අවසන් භාගයේ සැඳෑ සමයේ සිටින වයස 65-70 වේ සිටින අයද, බිරියන් රට රැකියාවලට ගොස් සිටින සැමියන් ද වෙති. මේ සියල්ලන්ටම වඩා අදහා ගැනීමට බැරි සිදුවීම් ද ඇත. එනම් තමාගේම ජාතක දියණිය විනාශ කරන පියවරුන්ය.

විවාහ වූ දින සිට ළමා ලපටින් ලැබෙන තුරුත් තම සැමියා සමඟ බිරිඳ ජීවත් වුණා නේද? එම කාලයතුළ තම සැමියාව තේරුම් ගැනීමට අමතක වුණාද? මේ බිරිඳය.... මේ දියණියය.... කියා හඳුනාගැනීමට බැරිව දඟලන හැටි අම්මා නොදන්නවාද? එසේ තිබියදී නරියාට කුකුළන් බාර දෙන ලෙස බාල සහ තරුණ දියණිවරුන්ව තාත්තාට බාර දී අම්මා විදෙස් රැකියාවට ගියවිට සිදුවන්නේ කුමක්ද?

ගමන් බිමන් යාමේදී බාල සහ තරුණ දියණියන් සමහරවිට අම්මලාත් අඩ නිරුවත් ඇඳුමින් සැරසී සහ සරසාගෙන අම්මලා මොන උජාරුවකින් පාරේ ගමන් කරනවාද? මේවා දකින සමහර අයට සිතා ගන්නට වන්නේ මේ හැට්ටය නැතිනම් සාය හෝ ගවුම තවම මසා නිම නොකළ එකක් ලෙසය.

මොන්ටිසෝරියට ගිය තම කුඩා දරුවාව රැගෙන ඒමට පියා ගෙදර නැත. ඔහු විදෙස්ගතව රැකියාව කරයි. මව ළමයාව ගෙදර කැඳවාගෙන යාමට පාපැදියක හෝ යතුරු පැදියක එන්නේ අඩ නිරුවතිනි. දරුවන්ව ඒ අඩ නිරුවත් ඇඳුම් වලින් සරසා ගෙන ඉරිදා පූජාවට ද කැඳවාගෙන එයි. එවිට බාල, තරුණ, මහළු සැමගේ සීලය බිඳීමට එය හොඳටම සමත්ය.

පාසල් යන දරුවන්ට ජංගම දුරකථන ද ලබා දී ඇත. ළමුන් මේවා වැඩිහරියක් ප්‍රයෝජනයට ගන්නේ ප්‍රේම පාරාදීසයේ වැඩවලටය. මේවාට කාඩ් ලබාදෙන්නේ හෝ බිල්ගෙවන්නේ දහඩිය පෙරාගෙන මහන්සියෙන් රැකියාව කරන දෙමාපියන්ය. මා දන්නා තරමින්, සිතන තරමින් ළමා අපචාර වලට හේතුවනුයේ දෙමාපියන්ගේ නොසැලකිල්ලයි.

**ඩබ්. ඒ. ඩී. ඩේවිඩ් අප්පුහාමි**
තල්විල

# සක්‍රමේන්තු අගයමු දැනුවත්වෙමු



**කතුතුමනි,**

'සක්‍රමේන්තු ප්‍රදානය හෑල්ලුවට පත් නොකරන්න' මැයෙන් වූ බී. සී. රුද්‍රිගු මහතාගේ ලිපියත්, 'හරි හැටි තොරතුරු දැන නිවැරදිව ලියමු' ලෙස දක්වා ලියෝ සැම්සන් මහතා ලියන ලද ලිපියත් කියවූ මට මෙසේ ලියන්නට සිත්විය.

සක්‍රමේන්තු ප්‍රදානය ගැන ලියන අතර සක්‍රමේන්තු පිළිබඳව විස්තරයක යෙදෙන රුද්‍රිගු මයා ජීවිතයේ එක් වරක් ලැබිය හැකි සක්‍රමේන්තුවක් ලෙස රෝගීන්ගේ ආලේපය නම් කර ඇත. මෙය කොතෙක් දුරට නිවැරදිද සාධාරණද? 'සක්‍රමේන්තු' යන්න පුළුල් මාතෘකාවකි. එහෙයින් මේ පිළිබඳව විස්තර කිරීමට අදහස් නොකරමි.

එහෙත් අප සභා ඉගැන්වීම් අනුව නම් කිසියම් වූ රෝගී තත්ත්වයකින් පසුවන්නකුට තම අවශ්‍යතාවය මත මෙම සක්‍රමේන්තුව දෙතුන් වතාවක් හෝ ලබා ගැනීමට අවකාශ ඇත. තවද එක් වරක් පමණක් ලැබිය හැකි සක්‍රමේන්තුවක් ලෙස නම් කර තිබෙන ආශිර්වාදකාර බන්ධනය වුවද, පිළිගත හැකි වූද, යුක්ති සහගත වූද, සත්‍ය තොරතුරු සනාථ කිරීමකින් නැවත වරක් ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථාවක් ඇත. එහෙයින් කිතුනු අපගේ ජීවිතයට ශක්තියක් වන සක්‍රමේන්තු අගයමු. දැනුවත්වෙමු.

**ජූඩ් සේනාධීර**
මට්ටක්කුලිය



## පැදිනදියට නිර්මාණ එවන ඔබටයි!

පැදි නදිය සඳහා නිර්මාණ එවීමේදී කරුණාකර තමන්ගේ නිර්මාණ පමණක් එවන්න. සෑම නිර්මාණයක් සමඟම නම, ලිපිනය, දුරකතන අංකය ලියා එය තමන්ගේම නිර්මාණයක් බවට සහතික කර එවිය යුතුය. විශේෂයෙන් අන්‍යයන්ගේ නිර්මාණ උපුටාගෙන හෝ සොරකම් කරගෙන තමන්ගේ නමින් එවීමෙන් නිර්මාණ හැකියාව වැඩි දියුණු කර ගත නොහැකි අතර අන්‍යයන්ගේ නිර්මාණ තමන්ගේ නමින් පළකර ගැනීමට යෑමෙන් වංචාකාරයකු/ වංචාකාරියක යන අවමානය මිස කිසිදු සෙතක් අත් නොවන බැව් කරුණාවෙන් සලකන්න.

## මගේ රන් පුතාට

මට කලිසමක් නැත පුතේ ඔබට කලිසමක් මැසුවෙමි
මට කමිසයක් නැත පුතේ ඔබට කමිසයක් මැසුවෙමි
මට පාවහන් නැත පුතේ ඔබට පාවහන් පැළඳුවෙමි
මම වයසයි පුතේ ඔබ තරුණයි කියා සිතුවෙමි

ඔබ ඉල්ලන තරම් වස්තුව මට දෙන්නට නෑ පුතේ
ඔබ ඉල්ලන තරම් දෑ මට දෙන්නට නෑ පුතේ
ඔබ ඉල්ලන අංගනාවී අපට දෙන්නට බෑ පුතේ
ඔබ ඉල්ලන දේ දෙන්ට බැරිකොට මම ඉකිබිඳිනවා පුතේ

සූරා සොඬෙකු වන්නට එපා මගේ රන්පුතේ
නූරා සළෙලෙකු වන්නට එපා මගේ රන්පුතේ
සොරාගෙන කන්නට එපා මගේ රන් පුතේ
පතා ආ පැතුම් ඉටුවෙයන් මගේ රන්පුතේ

**ක්‍රිස්ටෝපර් ජාන්ස**
රාජකඳළුව

## මවකගේ ආදරය!

පාසල් ගොසින් ලැබගන්නට සිප් සතර
මල්ලී හවස යළි ගෙදරට එන අතර
හසුවී වැස්සකට නොවෙනා ලෙස නිතර
ආවේ දිවගෙනය මග නොවෙමින් නතර

ඇයි මෝඩයෝ වැස්සේ තෙමුනේ මෙහෙම
අක්කා ඇගට ගොඩවුණි තරහින් බොහොම
තිබුනේ නැතිද එන්නට පායපුවාම
ඇසුවේ දැක දැකය දිය බේරෙණු තාම

මේ හඬ ඇසී අයියා එතැනට පැමිණි
මහ මෝඩයෙක් යැයි මල්ලිට බැන වැදුණි
කුඩයක් රැගෙන ගොස් තිබුණනම් මෙවැනි
කිසිවක් නොවන බව හඬ දෙනවා ඇසුණි

අම්මා මෙවිට හනිකට එහි නැගුව පිය
හිස පිස දමා තුරුළට ගෙන පුතුව සිය
පුදමින් ආදරය පුතුවෙත පිරුණු ළය
බැන්නේ මෝඩ ලෙස වැටුණු වැස්සටය

**පස්කල් ජයමාන්න**
උස්වැටකෙයියාව

## පන්හිඳක ඉකි බිඳුම

පන්හිඳ තබා රජ මැති ඇමතියන් ළග
ලද සම්මාන කුමටද ගොස් වැරදි මග
හොර බොරු පෙතිගසන පන්හිඳ තියුණු කග
වේනම් දඬුවමත් කිරුළකි දිලෙන රග

මේ මස අපේ සාහිත මාසයයි කියා
වෙසෙමුද ලැබෙන තුරු මොකවත් දෙනෙත අයා
ඩහදිය කඳුළු දැක සිත හිස කෙළින් තියා
නිසි මග දිනූ පන්හිඳ පුදසුනට ගියා

දිනක් මසක් දී පන්හිඳ සැමරීම
හොඳයි යසයි ගැදි පැදි වැල් පැසසීම
වැලි ගල් නොවේ මිණි මුතු කර පැළඳීම
පළඳන්නන්ගෙ තේරීමයි වැටහීම

පන්හිඳ පමණි මට හිමි උරුමය සැමදා
මා හා බැඳී ආවේ රජ සැප හැරදා
පුපුරා පවුරු පදනම් ගනඳුර පරදා
දුන් - දෙන එළිය විඳ විඳ වැජඹෙමි 'නොනිදා'

**පිටිපන - මා. ජයවීර**



## දැන් ඔක්කොම වෙනස් වෙලා

පොල් පිත්තේ ඔළුව පැත්තෙ
පොල් කටු අං දෙකයි ඇත්තෙ
කුඤ්ඤවල ඒ දෙපැත්තෙ
කොහු ලණු ගැට ගසා ගත්තෙ
ගොන් නාම්බ තමයි කියා

ඒ වගෙ ගොන් ගොඩක් හදන්
ජග් පිට මහ් කියා වදන්
අපි ඔක්කොම උන්ව ඇදන්
සෙල්ලම් කර එකට ඉඳන්
ගෙව්වෙමු පොඩි කාලේ එදා

කෙළින් අතට ඉරටු දෙකයි
ඉරටුවකින් පිට රවුමයි
කුරුම්බැට්ටියේ ගැසුවයි
මැසිම වගේ කරකැවු වයි
ඉරටු කැලි හරහට දා

අර පොල්පිති ගොන්නුත් නෑ
කුරුම්බැට්ටි මැසිමුත් නෑ
ළමයි එකතු වෙන්නෙත් නෑ
ඒ සෙල්ලම් දන්නෙත් නෑ
දැන් ඔක්කොම වෙනස් වෙලා

**වෙන්නප්පුවේ පයස් ප්‍රනාන්දු**
කෑගල්ල

## පෙම්බර අම්මේ, ඔබත් තනිවෙලා!

දුටු දුටු අය, ඇසූ ඇසූ සවන්
වඳිනවා දෙදණ තබා - මගේ අම්මා දිහා බලා
එනමුත් ඔය පින්බර නෙත් යොමා දරුවන් දෙස
තවමත් හිඳින්නේ කුමක් කියන්නටදෝ
නිල් සයුරත්, වැලි තලාවත් හඬගා කියන්නේ
පව් මගහැර එන්නට කියාදෝ - මගේ අම්මා වෙතට

අසරණ දරුවන්ගේ ඉල්ලීම් දිහා බලන්
අම්මේ දුක තිවුණේ ළෙන්ගතුකම නිසාමයි ඔය දෑතේ
මරිමවුන්ගේ පෙරවන් තාරකාවෙනි, මා මව්නි දැන්දැන්
මාත් තනිවී ඇතැයි හැගේ මගේ වරදින්



හැඟුමට, මුදලට, බලයට, ආදරය විකිණීලා
ඔබ සෙවණේ රැඳී සිටි දරු පරපුරත් මං වගේම
දිවයයි හැල්මේ අනේ අම්මේ පාප මග බලා
මංගල දිනට පමණක් සුවසේ පවෙන් තොර වෙන්නේ
ඉන්පසු ගොසින් ඈණ කොටා ගහ මරාගන්නේ

**ඩබ්. සයුරි මදුෂානි ප්‍රනාන්දු**
වයඹ ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය
බිංගිරිය

## එදා සහ අද

කොස් කොළ
තොප්පිය දාගෙන
සෙල්ලම් ගෙයි රජවෙන්නට
කොළපත් ගොටුවත් අරගෙන
ලන්දේ කජු අහුලන්නට
තල්කොළ ගොටුවෙන් දෙනියේ
කුඹුකෙ ළිඳේ දිය නාන්ට
ආයෙත් කවදා ලැබේද?
ළමා ලොවේ සැරි සරන්න

**එස්. පී. වසන්ත මාලා**
කොටරෑපේ

## ඔබට ඇසේද?

කතුරු මු.......වා....ත්
පිහිය මු.....වා....ත්
හිරමණ තල ගානවා.......
දවසෙ කැගසන හඬවල්....

පොල් කඩනවා
තැඹිලි බානවා
ගස් කපනවා
දවසෙ කැගසන හඬවල්.....

සපත්තු මහනවා
සෙරෙප්පු මහනවා
බෑග් මහනවා
දවසේ කැගසන හඬවල්.....

තවත් ජීවිත රැකගන්න......
අව්-වැසි- නොබලා......
තෙරපිලි සිතුවිලි මැදින්.....
නැගෙන හඬ...
ඔබට ඇසේද?

**ආර්. ජෝශප් ප්‍රිය**
කොටිකාවත්ත

## චූටි දුවට

අම්මාගෙන් කිරිඉල්ලා අඬන
මගේ චූටි දුවේ
ලොකු වුනාම ඉස්කෝලේ
යන්න හදන චූටි දුවේ
සමාජයේ කාමාතුරයෝ ගිල
ගනිවි චූටි දුවේ
අපිව බලාගන්න කියල දෙවිඳු
යදිමු චූටි දුවේ....

**ටයිටස් සපරමාදු**
බෝපිටිය

## චූටි නගේ...

සියුමැලි පා යුග
රිදුම් දේවී නගේ ඔබේ,
අතැගිලි තුඩු වල
දිය බුබුළු ඇවිත් නගේ,
ඉකිබිඳිනවා ඔබ රහසේ
බංගලාවේ මුල්ලට වී....

මතකද මගේ පුංචි නගේ
ගමේ එදා අපි ඔක්කොම
නිදියා ගත්තා තුන්හිරියා
පන් පැදුරේ......
පුස් කෑ මැටි බිත්තිය
අහස පෙනෙන අපේ සෙවන
කවදද යළි ගොඩ
නැගෙන්නේ

මැටි පොළවේ බිම ඉඳගෙන
'සල්මල්' කැඩුවේ අපි
කුප්පි ලාම්පුව වටේ ඉඳගෙන

**එම්. ශානුක මධුරංග ඕබ්‍රිස්**
සීමාවෙලිය - පුත්තලම

## දෙව්ඳුට තුතිවේවා!

මගෙ මුලු ජීවිතයම ඔබවේ
මා අසලින් ඔබ වැඩසිටියේ
මගේ පැතුම් පොදි ඉටුවන්නේ
දෙවිඳුනි ඔබගේ ආශිර්වාදේ
දෙවිඳුගෙ බලයම මේ ලෝකේ
දින දින බැබලේවා

**ජී. ඒ. එන්. කුමාරි වික්‍රමසිංහ**
පමුණුගම

## මෙහෙකාර දැරියකගේ යැදුම

දවසක මෙහෙවර - නිමවන මොහොතේ
දැනුනත් විඩාව - වෙහෙසුන සිරුරේ
සෙව්වා වෙලාව - ආදර සමිඳේ
ඔබ අමතන්නට - පාලු මේ රැයේ
පල්ලි නොආවට - මේ ඉරු දිනයේ
තරහ වෙන්නෙපා - මා හා සමිඳේ
කන්දක් වැඩ මට - තිබුනා එදිනේ
කොහොමද සමිඳුනි - ඔබ වෙත එන්නේ
නෝනලා බේබිලා - ඇද පළඳින්නේ
ඉරිදට එක් වී - ඔබ වෙත යන්නේ
සිත තුළ ඇති මුත් එන්නට එලෙසේ
කොහොමද සමිඳුනි එලෙසින් එන්නේ

**ඩී. ඩබ්. එස්. එල්. ජයසේකර**
ගිරිතලේ

## ජුසේවාස් පියෙනි !

භාරත දේසේ - ගෝවේ නගරේ
මෙලොව දිනා - පූජක වරම ලබා
මවු පියො - නෑසියො - හැමදෙන හැරදා
දෙව් අබි මත විලසින් මෙහි වැසියේ

පැණසර - යතිවරු - ගෝවෙන් කැඳවා
හෙළ සාහිත හා සකල කලාවේ
කිතු සළකුණෙ අභිමානය රඳවා
කඩ ඉමක් - රන් අකුරින් ලියැවූ

ගල්ගමු - වෑ උඩ - මැටියගෙනයද
ඔබ පා යුග පහසින් - පිවිතුරුවී
බැබලෙන දම්කෙත වයඹ දනව්වේ
අපගේ උරුමය - මේයැයි පවසයි

තුන්සිය වසරක් - තුඩ තුඩ රැව් දෙන
නාමය රඳවා - යුග යුග ගණනක
ඔබකළ මේවර - සමරා සැමදින
පතමුව සුදුවර මහිමාලෝකේ

**ජසින්තා සපරමාදු**
කුඩාගල්ගමුව

## ජපමාලය

සැඳෑ අඳුර පැතිරෙන හිරු ගිලෙන පැයේ
සඳවත තුරු හිසින් එබිකම් කරන දියේ
දෙව්මැඳුරේද හඬ නංවා සීනු වැයේ
නමෝ මරිය වැලකින් ජපමාල ගැයේ

මරිමව් සෙනෙහෙසම හදවත තුළ රැන්දු
පවුලේ සැමදෙනා එක තැනකට කැන්දු
පෙර ඒ නිවස සමගිය සාමය බැන්දු
කෝ අද හැමම අසනව ටී. වී. සින්දු

ඔක්තෝබරය - මැයි මාසය කැප කෙරුව
ජපමාලයට නොවැ පැටි කල කළ හුරුව
සුරලොව යන්න අප මරිමව් අත දැරුව
ජපමාලය නොවෙද මඟ පෙන්වන තරුව

නිවා දමන ලෙස රෝබිය නැගෙන ගතින්
ලොව දුක් අඳුරු පළවා හැර දැමුණු සිතින්
නැවතත් ගනිමු අප හැම ජපමාල අතින්
දෙව් පුද වරය ලද මව් වෙත පුදමු බැතින්

**ලයනල් වර්ණකුල**
දළුගම

## අමතක කළ හැකිද?

**සොයුර,**
මව් ලයේ බැඳි සෙනේ
රුහිර කිරි කළ ඇයව
පිය හදේ තත් ලෙසේ
අදර සැප හළ ඔහුව,
අඩ අඳුර සිප් කිරෙන්
පහන් කළ ගුරු උතුම
නුවණැසින් ගිලිහේද?

**ඉඳින්,**
ප්‍රේමයේ මහිමයෙන්
මිනිසකුව, තවත් මිනිසකුට
අහර වූ සදාතන
සුදෝ සුදු ජේසුව
ආදරේ උණුසුමින්
මනුෂ්‍යත්වයේ නාමයෙන්
අමතක කළ හැකිද ?

**මිරියම් රුවන්ති තිසේරා**
බටහිර කොළින්ජාඩිය

බැසිල් ෆොන්සේකා විසිනි

# මානසික රෝගි කිතුනු දැරියගේ ඇප මත නිදහස යැදුම් ජයකි

කුරාන් ග්‍රන්ථයේ පිටු කීපයකට ගිනි තැබූ බවට කැරුණු බොරු චෝදනාව මත සිරභාරයට ගැණුනු පාකිස්තානයේ රිම්ෂා මෂි නම් මානසික රෝගි දැරිය සැප්තැම්බර් මස 10 වෙනිදා, ඇප මත නිදහස් කැරුණේ ලෝක ජනතාවගේ විරෝධතාවයන් හා කිතුනුවන්ගේ නොතිත් යැදුම් හමුවේය. මෙම අධිකරණ තීන්දුව පාකිස්තානයේ පවත්නා ඒකපාක්ෂික ආගම් පරිභව නීතිය අරබයා සංධිස්ථානයක් වන බැව් ද නීති විශාරදයෝ ප්‍රකාශ කරති. මෙම දැරිය විසින් කුරාන් පිටු ගිනි තැබුවාය යන බොරුව ගොතා ඇති ෂෆී මොහොමඩ් කහලිද් චිස්ති නැමැත්තා ද සිරභාරයට ගෙන ඇත. ඇපමත නිදහස් කැරුණු මානසික රෝගි දැරියගේ ජීවිතය කෙරෙහි තවදුරටත් මරණ තර්ජන පවත්නා හෙයින්, තීන්දුවට පසු දිනැම, ඇ හෙලිකොප්ටරයකින් රහස් ස්ථානයකට ගෙනගොස් ඇත.

"අධිකරණය විසින් රිම්ෂා දැරිය ඇප මත නිදහස් කැරුමට දුන් තීන්දුව ඒකපාක්ෂික ආගම් පරිභව නීතිය සම්බන්ධයෙන් වැදගත් සංධිස්ථානයකි. මෙම තීරණය. මෙවන් ඉදිරි තීරණ කෙරෙහිද අනිවාර්යයෙන්ම බලපාන පූර්වාදර්ශයක් වනු ඇත. පාකිස්තානයේ මෙන්ම ලෝකවාසි කිතුනු හා අන්‍ය ආගමික ජනතාවන්ගේ සහය සහ යැදුම් ඈ කෙරෙහි යොමුවූ නිසාවෙන් ඈ මෙලෙස නිදහස ලැබුවාය." මේ අයුරින් ප්‍රකාශ කරන ලැබුවේ, කරච්චියේ ජෝශප් කූට්ස් අගරදගුරු හිමිපාණන් විසිනි. යුක්තිය හා සාමය පිළිබඳ පාකිස්තාන කොමිෂන් සභාවේ සභාපති පීටර් ජේකොබ් විසින් ද මෙලෙසින් පවසනු ලැබීය. "අධිකරණය විසින් රිම්ෂා දැරිය ඇපමත වූවත් නිදහස් කිරීම ගැන අප ලෝක ජනතාව සමඟ අමන්දානන්දයට පත් වෙනවා. ඈ මුළුමණින්මැ නිදහස් කරනු ලැබීමට අවකාශය තිබුණත් එසේ නොකරන ලද්දේ තවමත් පවත්නා අන්තවාදීන්ගේ විරෝධතාවයන් නිසා යයි ගිනිය හැක. තවද පවුම් 6500 ක් වැනි විශාල මුදලක් ඇප වශයෙන් නියම කිරීම ද රිම්ෂාගේ දිළිඳු දෙමාපියන් කෙරෙහි අසීරු බරක් විය. රිම්ෂාගේ නිදහස බලා සිටි පිරිසක් විසින් එම ඇප මුදල් ලබා නොදෙන්නට, ඈට තවදුරටත් සිරභාරයේ



සිටින්නට සිදුවෙනවා ඇත.

රේමන් මලික් නම් අභ්‍යන්තර කටයුතු පිළිබඳ ඇමැති වරයා විසින් ද පවසා ඇත්තේ, දැරියට විරුද්ධව චෝදනා ගෙනෙන ලද දිනය පුරාවට ඈ නිවසින් බැහැර වී නොමැති හෙයින් කරුති චෝදනා සත්‍ය නොවන බැව් හෙළි වී ඇති බවයි. පාකිස්තාන ජනපති අෂිෆ් අල් ෂල්දාරි විසින් ද අවධාරණය කරනු ලැබ ඇත්තේ ආගම් පරිභව නීතිය පෞද්ගලික ඕනෑ එපා කම් මත යොදා ගැනීමට අවකාශ නොදෙනා බවය.

# මොහොමද් තුමාට පරිභව කැරෙන චිත්‍රපටය කතෝලිකයෝ හෙළා දකිති

පාකිස්තානයේ කතෝලිකයෝ සහ අන් සියළු කිතුනු නායකයෝ ෆයිසාල් බාත් නගරයට රැස්ව මුස්ලිම් ලෝකය කෝපාවිෂ්ට කරුති මොහොමද් තුමා අපහාසයට පාත්‍ර කොට ඇති චිත්‍රපටයට එරෙහි ව මහා හඬ නැඟූහ.

තවද, සමයාන්තර කතිකාව පිළිබඳ පදවි කොමිෂන් සභාව විසින් ද එම චිත්‍ර පටයට එරෙහිව ප්‍රකාශනයක් නිකුත් කර තිබිණි. 'මෙම අනර්ථකාමි සහ ද්වේෂ සහගත චිත්‍ර පටය විසින් ඉස්ලාම් බැතිමතුන්ගේ මෙන්ම කිතුනුවන්ගේ ද ආධ්‍යාත්මික හා පූජනීය චින්තනයන්ට පහර එල්ල කොට ඇත. මෙම දීන හීන ක්‍රියාව තුළින් ලෝක සාමයට හා ආගමික සංහිඳියාවට අභියෝග රැසක් එල්ල වී ඇත. ප්‍රකාශනයෙහි එලෙසින් ද දක්වා ඇත. එම මුසාවාදී චිත්‍ර පටය නිෂ්පාදනය කරුති සෑම් බෙසිල් සහ ජෙරි ජෝනිස් යන දෙදෙනා ඇමෙරිකාව විසින් නීතියේ ග්‍රහණයට ගෙන උපරිම දඬුවම් පැමිණිවිය යුතු බැව් ද අවධාරණය කරති. 'ශුද්ධවූ මොහොමද් තුමාට පරිභව කැරෙන අයුරින් නිපදවා ඇති ඊනියා චිත්‍ර පටය අපි තරයේ හෙළා දකිමු' යන පාඨය සහිත දැවැන්ත බැනරයක් සාන්ත පීතර හා පාවුළු බැසිලිකා භූමියේ ප්‍රදර්ශනය කර තිබිණි. තවද පසුගිය සිකුරාදා දිනැ ඉස්ලාම් බැතිමතුන්ගේ යැදුමෙන් පසු පැවැති ඒ ඒ දැවැන්ත විරෝධතාවයන්ට කිතුනුවෝ ද එක්වූහ.

මොහොමද් තුමාට එරෙහි එම දුර්දාන්ත චිත්‍ර පටය පිළිබඳ දැඩි විරෝධතාවයක් පැන නැගුනේ පාකිස්තානයේ ඒක පාක්ෂික ආගම් පරිභව නීතිය පිළිබඳ ව්‍යාප්ත කතා බහක් ඉස්මතුව ඇති කාල වකවානුව තුළදීය. එම නීතිය යටතේ කුරාන් ග්‍රන්ථයේ පිටපත් කීපයක් ගිනි බත් කළාය යන බොරු චෝදනාවකට ලක් කැරුණු මානසික රෝගි රිම්ෂා දැරිය ඇපමත නිදහස් කරනු ලැබීය. ඒ පිළිබඳ අධිකරණ තීන්දුව කිතුනුවන්ට මහත් සහනදායි බවක් උදා කළේය. ඒ පිළිබඳව පාකිස්තානයේ වසර 34 ක් සේවය කළ රොබට් මැකුලොක් පියතුමා මෙලෙසින් පවසයි. 'රිම්ෂා දැරිය ලද තීන්දුව කිතුනුවන් තුළ බලාපොරොත්තු ඇති කරවන්නකි. අදාළ නීතිය පිළිබඳව රාජ්‍ය නිළධාරීන් හා සාකච්ඡා කිරිමට කාලය උදා වී තිබේ. ජනපති තුමා ද ඉස්ලාම් නායකයින් ද විසින් ඉදිරියේදී ඒකාබද්ධ සංහිඳියා පැවැත්මකට අවකාශයන් සැළැසීමේ මොහොතක් ද එළඹ ඇත. 'පියතුමා විසින් එලෙස පවසා ඇති නමුත් මොහොමද් තුමාට එරෙහි එම ඇමෙරිකාන චිත්‍ර පටය එළිදැක්වීමත් සමඟ සංහිඳියාව කතිකාවන් කරා යා හැකි ද යන්න ලෙහෙසි පහසු නොවනු ඇතැයි කිතුනු පුවත් පෙන්වා දෙයි.



# පදක්කමට වඩා ජපමාලය අගනේ යයි පැරලිම්පික් ක්‍රීඩිකාව පවසයි

එංගලන්තයේ පැවැති පැරලිම්පික් ක්‍රීඩා උලෙළේදී මීටර් 1500 තරගයෙන් ලෝකඩ ත්‍යාගය දිනාගත් ඉතාලි ජාතික අන්ධ ක්‍රීඩිකා අන්නාලිසා වීනේති මාධ්‍ය වෙත පවසා සිටියේ, කිසිදා තිළිණයකට වඩා, ඈ ජපමාලය අගය කරනා බවයි. ඇගේ සුරතේ රඳවාගෙන සිටිනා ජපමාලය කිසිදු අවස්ථාවකදී වූවත් පිටතට නොගන්නා බැව් ඈ තවදුරටත් ප්‍රකාශ කළාය. "මෙම ජපමාලය මාගේ ජිවිත පදක්කමයි; එය සැමදා මා සමඟයි." යනුවෙන් ද පැවැසුවාය.

තවද ඈ මෙලෙසින්ද කීවාය. 'ඇදහිල්ල තුළ සියළු වේදනාවන් දරාගත හැකියි. නම් කළ නොහැකි වේදනාවන් ද අප තුළ විය හැක. දෙවි සමිඳුන් කෙරෙහි පමණක් ඇදැහිල්ල පවත්නා විට එවන් වේදනාවන් මට පමණක් දැයි සිතෙන්නේ නැත. එබඳු ඇදැහිල්ල ජීවිතයේ ලොකුම ජයග්‍රහණයයි." අන්නාලිසා විවාහක කාන්තාවකි. ඈ එක් දරුවකුගේ මවකි. ඉතාලිය පුරා ඈ ප්‍රසිද්ධව සිටින්නේ ක්‍රීඩිකාවක් මෙන්ම ගායිකාවක් ද වශයෙනි.

වර්ෂ 1970 දෙසැම්බර් මස 27 වැනිදා උපන් ඈ කුඩා කල සිටම ප්‍රසිද්ධියට පත් වූයේ



ගායිකාවක් ලෙසටයි. වයසින් වැඩෙත්ම ඇගේ දෑසේ රෝගය උග්‍ර වන්නට විය. ඈ 20 වෙනි වියට පත්වෙද්දීමැ මුළුමණින්ම අන්ධ භාවයට පත්වූවාය. වර්ෂ 1998 දී. ඉතාලියේ පැවැති ලෝ ප්‍රකට 'සන්රෙමෝ' ගී ප්‍රසංග යේදී ඈ ප්‍රථම ස්ථානය දිනා ගත්තාය. 'ජේසුස් වහන්සේ නිරන්තරයෙන් මා සමගයි. මීටර් 1500 තරගයට සහභාගි වෙද්දි, එතුමාණෝ මා සමඟ සිටිනා බැව් මට සැබැවින්ම දැනී ගියා. එපමණක්ද නොවේ. එම අත්දැකීම ද මගේ ජීවිතය පුරා පවතිනවා.' අන්නාලිසා එලෙසින් ද ජාත්‍යන්තර පුවත් සේවයට පැවැසුවාය.

# එක්දරු ප්‍රතිපත්තියට විරුද්ධ වන්නැයි ඇපල් සමාගමෙන් ඉල්ලයි

චීනයේ පවත්නා අමානුෂික එක්දරු ප්‍රතිපත්තියට එරෙහි වන්නැයි චීනයේ පරිඝණක කර්මාන්තයේ මහා ඉහළින් නිරතව සිටිනා ඇපල් පරිඝනක සමාගමෙන් ඉල්ලා සිටින්නේ ලෝ පූජිත ජීවිතසුරැකීමේ ක්‍රියාකරු වන දෑස් අන්ධ චෙන් ගුආන්ග්චෙන් නීතිඥයා විසිනි. තමාට එල්ල වූ සියළු තර්ජන ගර්ජන ඔස්සේ චෙන් විසින් චීනයේ එම අමානුෂික එක්දරු ප්‍රතිපත්තියට එරෙහිව මහා සටනක් ගෙන ගියේය. ඔහු හා ක්‍රියාකළ විශාල පිරිසක් හා කණ්ඩායම් ගණනාවක් ද විය.

එම ක්‍රියාකාරිත්වය නොඉවසූ රාජ්‍ය නිළධාරින් විසින් ඔහු නිවාස අඩස්සියේ තබන ලදී. එහෙත් අපූරු ආකාරයෙන්, එම නිවාස අඩස්සියෙන් පමණක් නොව චීනයෙන් ද මිදී ඔහු දැන් ඇමෙරිකාවේ ජීවත් වේ. ඔහු වෙත තවමත් මරණ තර්ජන පවතිද්දී වුවද, චීනයේ දැවැන්ත පරිඝනක නිෂ්පාදනයේ නිරතව සිටිනා ඇපල් සමාගමෙන් ඔහු විවෘත ආයාචනයක් කර ඇත්තේ, ඔවුන් යටතේ සේවයෙහි නිරත දහස් සංඛ්‍යාත චීන ජාතික සේවකයන්ගේ සහ පොදු ජනතාවගේ සුවසෙත හා ස්වාධීනත්වය වෙනුවෙන් සමාජ මෙහෙවරක් ලෙසින් එම එක්දරු පිළිවෙත ඉවත් කරගන්නා ලෙසට චීන බලධාරින්ට බලපෑම් කරනා ලෙසටයි.

ඔහු විසින් යළි යළිත් පෙන්වා දෙනු ලබන්නේ එක්දරු ප්‍රතිපත්තිය හා ආනුශංගිකව පවත්නා ගබ්සාව විසින් ද දහස් සංඛ්‍යාත දරු දැරියන්ට උපතේ අයිතිය ප්‍රතික්ෂේප කැරෙනා බවයි.

චීනයේ ඇති වන්නාවූ ස්වාභාවික ආපදාවන් හේතුකොට ගෙන පවුලක එකම දරුවා පවා දිවියෙන් සමුගැනීමෙන් දහස් සංඛ්‍යාත මව්පියන් විසින් පීඩා විඳීමේ ප්‍රත්‍යක්ෂ සළකුන පවා සැළකිල්ලට නොගන්නා චීන බලධාරින්ට ඇපල් කොම්පියුටර් සමාගම වැනි ලෝ විශාලතම සමාගම මගින් බලපෑම් කිරීමේ කාලය දැන් උදාවී ඇතැයි ද ඔහු විසින් අවධාරණය කරනු ලැබීය.

# චීනයේ ගමක දෙව් මැඳුරක් ගිනිබත් කැරේ



සැප්තැම්බර් මස 14 වෙනිදා චීනයේ කයිබාන් නම් ගමේ පිහිටි දෙව් මැඳුර රාත්‍රි කාලයේදී ගිනි තබා විනාශ කොට තිබේ. පසුදා පහන් වෙද්දී එතනට රැස්වූ කතෝලික පිරිස ආගමික නිදහස ඉල්ලා හඬා වැළපෙමින් දෙවිඳුන්ට යැදුමෙන් කෑ මොර දුන්හ. විනාශ කරනු ලැබූ දෙව් මැඳුර අවශ්‍ය පරිදි රජයේ ලියාපදිංචි කරුත. එම නිසාවෙන් රජයේ නිළධාරින් වෙත ගිය කතෝලික පිරිස තමන්ගේ නිදහස් ඇදැහිල්ලේ අයිතිය තහවුරු කරනා මෙන් ඉල්ලා සිටියෝය. තවද මෙම සිද්ධිය දැනගත් රටපුරා වෙසෙන කතෝලිකයෝ එම දීන හීන ක්‍රියාව හෙළා දකිමින් අන්තර් ජාලය ඔස්සේ ලොවටම ප්‍රකාශ කරන්නට වූහ. ගිනි තැබූ දෙව් මැඳුරේ සෝචනිය දැක්ම ද හඬා වැළපෙන කතෝලිකයන්ගේ විලාපයන් ද අන්තර් ජාලයන් ඔස්සේ විදහා දක්වන ලදි. මෙම අපරාධය කළ ත්‍රස්තයන් ගැන කිසිදු ක්‍රියාමාර්ගයක් පොලීසිය විසින් එතෙක් ගෙන නොමැති යයි ද දෙව් මැඳුරු පාලක ෂාන්ග් පියතුමා විසින් මාධ්‍යයන්ට පවසා තිබිණි.

ගිනි තබන ලද දෙව් මැඳුර තනනු ලැබුවේ වර්ෂ 1993 දීය.එ ම භූමියේ ඉපැරණි දෙව් මැඳුරක් තුබූ අතර එය, 1954 වර්ෂයේදී මාඕ පාලන සමයේදී, විනාශ කර තිබිණි. මෙම ප්‍රදේශයේ ජීවත් වන ගොවීන් වෙනස් ස්ථානයන් කරා ගෙන යාමේ ක්‍රියා දාමයක් රජය විසින් දියත් කරුති බැව් ද වාර්තා වේ. ඒ අනුව දෙව් මැඳුර ද විනාශ කරන්නට ඇතැයි සැක පහළ වී ඇත.

# දරු උපත ගබ්සාවට වඩා වනිතා ආරක්ෂාව සළසයි

දරු උපතට වඩා ගබ්සාව ආරක්ෂාකාරි යයි ගබ්සාව උළුප්පාලන්නෝ ලොවට ප්‍රකාශ කරති. එහෙත් සති දෙකකට ඉහතදී ඩෙන්මාර්කයේ විශේෂඥයන් පිරිසක් විසින් හෙළිදක්වා ඇති සමීක්ෂණයකින් ප්‍රකාශ කොට ඇත්තේ මුලදී හෝ ප්‍රමාද වී හෝ කැරෙන ගබ්සාවන් නිසාවෙන් ඇතිවන මරණ හානි, දරු උපත් හා සංසන්දනය කරද්දී අතිශය ඉහළ මට්ටමක පවත්නා බවයි. වනිතාවන් 50,000 කට අධික සංඛ්‍යාවක් අදාළ සමීක්ෂණයට පාත්‍ර කරනු ලැබීය. දරු උපත අරභයා ගබ්සාවට පාත්‍ර කරුති හා කර නොමැති වනිතාවන් පිළිබඳ වෛද්‍ය හා පෞද්ගලික සාක්ෂි ද අනුව නූතන වෛද්‍ය ක්‍රමවේදයන් යොදා ගනිමින් එම පරීක්ෂණය කරුත. එවැනිම පරීක්ෂණ දෙකක්, වෛද්‍යවරු කණ්ඩායම් විසින් චිලි සහ අයර්ලන්ත දේශයන් හීද කරුත. එම සමීක්ෂණය වාර්තා මඟින් ද හෙළි දක්වා ඇත්තේ මොනයම් ගැබ්බර කාලයක් තුළ වුවද, ගබ්සාව දරු උපතට වඩා අනතුරු දායක වන බවයි.

චිලි දේශයේ, ගබ්සාව නීති ගතකොට තුබූ කාල වකවානුවක් පැවැතිනි. එනමුත් එරටේ ගබ්සාව තහනම් කිරීමත් සමඟ පසුගිය වසර කීපය පුරා මාතෘ මරණ සංඛ්‍යාව 70% කින් අඩුවී ගොස් ඇතැයි ද පෙන්වා දී ඇත. තවද, ගබ්සාව නීති විරෝධි වන අයර්ලන්තයේ මාතෘ මරණ සංඛ්‍යාව ගබ්සාව නීති ගතකොට ඇති එංගලන්තයේ හා ස්කෝට් ලන්තයේ මාතෘ මරණ සංඛ්‍යාවට වඩා පහල මට්ටමක පවත්නා බැව් ද පෙන්වා දී තිබේ. එබැවින් දරු උපතට එරෙහි ව ගබ්සාව වඩා ආරක්ෂා සහිත වේයයි යන්න මිත්‍යා මතයක් යැයි එම සමීක්ෂණ විසින් තහවුරු කෙරෙනා බැව් ද වාර්තා වේ.

## යොවුන් සංග්‍රහය



# පුත්තලම් දිසා කතෝලික තරුණ දිනය

හලාවත පදවි තරුණ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ ගරු සුසන්ත බෙනට් රත්නසිංහ පියතුමාගේ ප්‍රධානත්වයෙන් පුත්තලම් දිසා තරුණ තරුණියන් සඳහා විශේෂ වැඩමුළුවක් මංගලඑළිය දෙව් මැඳුර පරිශ්‍රයේ දී දවස පුරා පැවැත්විණි. පුත්තලම් දිසාවේ නියෝජිත තරුණ තරුණියෝ සියයකට ආසන්න පිරිසක් මීට එක්වූහ.

නීතිඥ කළනි මැදගොඩ මෙනවිය පැමිණි පිරිස අමතා තාරුණ්‍යය සමාජගත වීමේ දී මුහුණ පාන ගැටලු පිළිබඳ නීතිමය දැනුවත් කිරීමක් ද, නීතිගරුක සමාජයක් උදෙසා තරුණයා වැය විය යුතු ආකාරය පිළිබඳ තරුණ පිරිස් දැනුවත් කළහ.

එසේම තරුණ වියේ දී සෞඛ්‍යමය පැවැත්ම හා අනාගතයට ඔරොත්තු දෙන ආකාරයට නිරෝගී ජීවිතයක් සඳහා සෞඛ්‍යය සමබරව තබා ගැනීම හා තමා අවට මානව සමාජයේ යහපත උදෙසා කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ දැනුවත් කිරීමේ දේශනයක් ද විය.

මෙම විශේෂ වැඩමුළුවට සහභාගි වූ තරුණ තරුණියන් සඳහා දවස පුරා ආහාර පානමය සත්කාරය "වර්ල්ඩ් විෂන්" ලංකා ආයතනයේ දායකත්වයෙන් සැපයිණි.

✍ ඩැමසස් වර්ණකුල

# තොඩුවාවේ තරුණ තරුණියෝ යොවුන් ඉරුදින සමරති

තොඩුවාව ජෝෂප් තරුණ සමිතිය විසින් යොවුන් තරුණ දිනය නිමිතිකොට ගෙන යොවුන් ඉරුදින සමරමින් දිව්‍ය පූජාව සංවිධානය කළේය.

ගරු ඇලෙක්ස් නිලන්ත පියතුමාගේ මූලිකත්වයෙන් ආධ්‍යාත්මික වැඩසටහනක් පැවැති අතර සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් විනෝද ක්‍රීඩා රැසක්ද පැවැතිණි. මීසම් සහයක ගරු දුෂාන්ත පෙරේරා සා.බෙ.නි. පියතුමා, ගරු ඇලෙක්සියා පැවදි සොයුරිය හා චමිලා තුෂාරි මහත්මියගේ අනුශාසකත්වයෙන් මෙදින වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණි.

✍ ඉෂාරා සෙව්වන්දි ප්‍රනාන්දු - තොඩුවාව

## බලා හිඳිමි....



පිච්ච මලේ සුදු පැහැයයි
රෝස මලේ සුවඳ ගොඩයි
පුළුන් රොදක සිනිදු බවයි
එකට රැගෙන දෝතට ගෙන
දෙවිඳු පෙමින් නවමු රුවක්
සියුමැලි පොඩි නව දිවියක්
මා කුස තුළ ජනිත කළා...
අම්මා යන වදනෙ අරුත
ඒ වදනේ සෙනෙහෙ ගැඹුර
කෙමෙන් කෙමෙන් මගේ හදට
දැනෙනා බව රහසක් නොව...
බලා හිඳිමි නෙතු දල්වා
දෝතට ඔබ වඩිනා තුරා
උතුරා යන සෙනෙහෙ පහස
දෙන්නට ඔබෙ ජීවිතයට
ඒ ආදරයෙන් නිරතුරු
සරසන්නට පුංචි ඔබව....

**ලසිතා ප්‍රසංගි සිල්වා**
ලන්ඩන් නුවර සිට



# සැබෑ තාරුණ්‍යයේ ශුද්ධාත්මයාණෝ

**තාරුණ්‍යය ලෙසින් අදහස් කරන්නේ නැවුම් හැඟුමන් පිබිදෙන, චමත්කාර ජනක, සතුට, ආදරය අත්වැල් බැඳගත් සුවිශේෂ අංගයකි. මෙය මෙලොව වෙසෙන සෑම ජීවයකට පොදු වූවකි. ගස් වැල්, සත්ත්වයන් දෙස බැලුවද ඉහත අදහස අපට ගම්‍ය වේ. එපමණක් නොව තාරුණ්‍යය අවදි කරන ක්ෂේත්‍රයන් අතර ජනසන්නිවේදන මාධ්‍යයන් වලට අත් වන්නේ සුවිශාල ස්ථානයකි. වාණිජත්වයේ රැල්ලට එක් වූ තුරුණු අවධිය පන්නරය ලැබීමට භෞතිකත්වය ඉක්මවා ගිය පියවි දෙනුවනට ගෝචර නොවන සත්‍යයක් කරා පියවර තැබිය යුතුය.**

මෙය සත්‍යයක් ලෙසින් බිහි වී ඉන් අනතුරුව යථාර්ථයක් කරා පියාසර කළ යුතු අභ්‍යවකාශ යානයක් වැන්න. සඳ තරණය කිරීමට ගමන් අරඹන යානයක් සිය කක්ෂයෙන් (ගමන් මාර්ග යෙන්) ඔබ්බට යන විට ශක්තිය ලබා ගත යුතුය. පිපිරීමක් ඒ සඳහා සිදුවිය යුතුය. සැබෑ තාරුණ්‍යයේ ශුද්ධාත්මයාණන් වෙත පිය මං කිරීම ද එවැන්නකි. මෙහි දී අපගේ අවධානය යොමු කළ යුතු පසුතලයක් තිබේ. එනම් සැබෑ තාරුණ්‍යය ශුද්ධාත්මයාණන්ට සම්බන්ධ වන්නේ කුමන කෝණයෙන් ඔස්සේ ද යන්නයි. මිනිස් ජීවිතය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සංකීර්ණය. ගැටලු සහිතය. නූල් බෝලයක් වැනිය.

එසේ වුවද අපට යොමු වන්නට ඇති දෘශ්‍යමාන, අචින්ත්‍ය, අකලංක කටු අකුලක සුවඳින් නැහැවුණු මලක් මෙන් සිත් සතන්, හදවත් පුබුදන සැබෑ තාරුණ්‍යය වූ ආත්මයාණන් පිළිගත යුතුය. උන්වහන්සේ ක්‍රියාවේ දෙවියන් වහන්සේ ය. විශ්වය ආරම්භයට පාදකවූ ආලෝකය (ශක්තිය) ලෙස සඳහන් කිරීමට පුළුවන. දෛනික ජීවිත කරදර, අසීරුතා මැද අපි සැම දෙනා දුර්මුඛ වෙමු. එය මිනිස් ස්වභාවයයි. ස්වභාවික අත්දැකීමකි.

එනමුදු එදා කිතු සමිඳුන් හට ශුද්ධවූ පේදුරුතුමා ප්‍රකාශ කළ "අප කා වෙත යන්නද සදාතන ජීවනයේ වචන ඇත්තේ ඔබවහන්සේ තුළය" යන උත්තරීතර වදන් වැල අප මනසට මෙහිලා ගොදුරු විය යුතුය. එමඟින් ද ප්‍රත්‍යක්ෂ වන්නේ සුසුමාණන් (ශුද්ධාත්මයාණන්) හා සබැඳි යථාර්ථයයි. මෙය අපිට බද්ධ වන ප්‍රමාණයට උන්වහන්සේට අයිති වෙමු. නතු වෙමු. මේ තුළින් අපගේ ස්වාධීනත්වයට කිසිදු අන්දමකින් හානියක් සිදු නොවේ.

එදා ග්‍රීක දාර්ශනිකයෙක් වන ඇරිස්ටෝටල් ප්‍රකාශ කළ අර්ථවත් වැකියක් සඳහන් කිරීම උචිතය. "යථාර්ථය ඔබ තුළ ක්‍රියාත්මක වීමට කැමැත්තක් තිබිය යුතුය" යනුවෙන් ඔහු ප්‍රකාශ කළේ ය. මෙය තර්ක බුද්ධියට, මිනිස් සීමා බන්ධන වලට යටත් නොවේ. ආත්මයාණන් වහන්සේ අප හදවත තුළ පදිංචි කර ගැනුමට ක්‍රියා කළ යුත්තේ මේ මොහොතේ පටන් ය. එය සුළඟ වැනිය. සුළඟ නොමැතිව මිනිසාට එක මොහොතක් හෝ සිටිය නොහැකිය. එලෙස ස්ප්‍රිතු සාන්තු වහන්සේ නොමැතිව අපට කිසිවක් කළ නොහැකිය.

✍ **මලින්ත බෝපෙආරච්චි**
දලුගම - කැලණිය

# ඇතුගල්පුර පදවි කතෝලික තරුණ රැළිය

**කුරුණෑගල රදගුරු වසමේ රිදී ජුබිලි වසර සහ ජාතික තරුණ ඉරුදින නිමිත්තෙන් වසර හතරකට පසු කුරුණෑගල පදවි කතෝලික තරුණ රැළිය පසුගියදා කුලියාපිටිය "සත්පහන" ශාලාවේ දී පැවැත්වුණි.**



තරුණ කටයුතු භාර, රත්නපුර රදගුරු අති උතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා සා.බෙ.නි. හිමිපාණන් විසින් පහන් දල්වන අයුරු..

රැළියේ ප්‍රධාන ආරාධිතයාණන් ලෙස පදවි එඬේරාණන් වූ අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා රාජගුරුප්‍රසාදින් වහන්සේ ද ගෞරවනීය ආරාධිතයාණන් ලෙස ශ්‍රී ලංකා කතෝලික රාජගුරු මණ්ඩලයේ තරුණ කටයුතු භාර, අති උතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා සහ විශ්‍රාමික රදගුරු අති උතුම් රේමන්ඩ් පීරිස් හිමිපාණෝ ද සහභාගි වූහ.

"සමිඳු සවියෙන් පිබිදෙන තාරුණ්‍ය" යන තේමාව යටතේ සංවිධානය කෙරුණු තරුණ රැළිය වර්ණවත් කරමින් තරුණ තරුණියෝ තම හැකියාවන් ඉදිරිපත් කළහ. කුරුණෑගල පදවිය වසර 5 ක් පැමිණි ගමන් මඟ සිය කතාවේ දී සිහිපත් කළ අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණෝ විශ්වාසයේ ගිනි සිළුව ඉදිරි පරම්පරාවලට ගෙන යාමේ වගකීම භාර ගැනීමට සිටින වත්මන් කතෝලික තරුණ පරපුර සමාජ විෂමතා හමුවේ ක්‍රිස්තු ආලෝකයෙන් සහ සමිඳු සවියෙන් බලගැන්වී පෙරට ඒමේ වැදගත්කම ද අප තරුණයන්ට කිතු සමිඳුන් හැර විකල්ප මාර්ගයක් නැති බව ද අවධාරණය කළහ.

ජාතික තරුණ ඉරුදිනට පෙර දිනයේ මෙවන් තරුණ දිනයක් සංවිධානය කිරීම ගැන කුරුණෑගල පදවි තරුණ කටයුතු අධ්‍යක්ෂ පියතුමාට සහ කතෝලික තරුණ සංගමයට සිය ප්‍රසාදය සහ ස්තූතිය පළ කරමින් කතා කළ ජාතික තරුණ කටයුතු භාර, රත්නපුර රදගුරු අති උතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා හිමිපාණෝ වත්මන් ලෝකයේ ත්‍රස්තවාදය, හිංසාව, ප්‍රචණ්ඩත්වය, මත්ද්‍රව්‍ය උවදුර ආදි සමාජ ආගමනයන් වෙත නැඹුරු වී කල්ලි ගැසෙන තරුණ කණ්ඩායම් ගැන විග්‍රහ කරමින් කතෝලික තරුණයන් ක්‍රිස්තුන් වහන්සේ ගිය අඩිපාරේ යමින් නොමඟ ගිය තරුණයන්ට ද හරි මඟ පෙන්වා සමාජයට ආදර්ශයක් වීමේ අවශ්‍යතාව පෙන්වා දුන්හ. මෙහිදී උපාධ්‍ය පියතුමන්ගේ අදහසක් මත තරුණ නිර්මාණ එකතුකොට "සමිඳු සවියෙන් පිබිදෙන තාරුණ්‍ය" නමින් නිර්මාණ සඟරාවක් එළිදැක්වුණු අතර එහි ප්‍රථම මංගල කලාපය සංස්කාරක අතින් පදවි එඬේරාණන් හට පිළිගැන්විණි.

තරුණ රැළිය වෙනුවෙන් පැවති තරග වලින් ශූරතාව හා අනුශූරතා දිනාගත් කණ්ඩායම්වලට ජයසංකේත පිරිනැමීම රදගුරු හිමිවරුන් අතින් සිදුවූහ.දිනයේ ප්‍රධාන දේශනය වූයේ "වත්මන් තරුණ පරපුර සහ කිතුනු සාරධර්ම" යන්නයි. මනෝ උපදේශක අරුණ මෙන්ඩිස් මහතා විසින් සිදුකළ දේශනයේ දී වත්මන් සමාජයේ කිතුනු තරුණයකුට පැමිණෙන අභියෝග ඔස්සේ කිතුනු සාරධර්ම ආරක්ෂා කළ යුත්තේ කෙසේදැයි ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය මඟින් පැහැදිලි කළේ ය.

පදවි තරුණ කටයුතු උපාධ්‍ය ගරු ආනන්ද වීරකෝන් පියතුමා සහ පදවි කතෝලික තරුණ සංගමය මඟින් මෙම තරුණ රැළිය සංවිධානය කෙරිණි. මෙහිදී වසර 25 ක කාලයක් රදගුරු වසමේ තරුණ උපාධ්‍ය පියතුමන්ලා ලෙස සේවය කළ ගරු පියවරුන්ගේ සේවය ඇගයීම ද විශේෂ සිද්ධියක් විය.




**තලංගම මීසමේ තරුණ සමිතිය පිහිටුවීම පසුගියදා සිදුකෙරිණි. මොවුහු එකතුව මෙදින දිව්‍ය පූජා යාගය සංවිධානය කළහ. තරුණ සමිතියේ පිරිස මෙහි අනුශාසක වැඩබලන මීසම් සේවක ගරු දිනේෂ් කීර්තිසිංහ පියතුමන් සමඟ යොවුන් ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු. (ඉනෝකා පෙරේරා)**



පල්ලන්සේන වික්ෂෝප මාතා දෙව්මැඳුරේ 125 වැනි ජයන්තිය වෙනුවෙන් දෙව්මැඳුර ඉදිරිපිටදී තරුණ පිරිස ඉදිකර තිබුනු දර්ශනීය තොරණ මෙහි දිස්වේ. **(එච්. ඒ. සිරිල් පෙරේරා )**

"2004 - 2005 කාලවකවානුවේදී ලංකාව පුරාම ඉතා කෙටි කාලයක් තුළ ව්‍යාප්ත වු ගෝල්ඩ් ක්වෙස්ට් ජාවාරම්කරුවන් මහජන මුදල් වංචනිකව එකතු කිරීමට ආකර්ෂණීය සංවාද මණ්ඩප පිටපළාත්වල හෝටල්වල සංවිධානය කළ අතර ඒ සැම දැනුවත් කිරීමේ වැඩසටහනක්ම මහබැංකුවේ ආශිර්වාදය සහිතව පවත්වාගෙන යන්නේ යැයි ආයෝජකයන්ට හඟවනු පිණිස ව්‍යාජ මහබැංකු අධිපතිවරයකු සැම සංවාදය කට රැගෙන ආවේය."



# ආකර්ෂණීය බව දවටා කරළියට එන පිරමීඩ වංචා

ශ්‍රීට වසර 7 කට පමණ ඉහතදී රට තුළ මහත් ආන්දෝලනයකට තුඩුදුන් ගෝල්ඩ් ක්වෙස්ට් වංචාවෙන් බොහෝදෙනකු පීඩාවින්දේ පිරමීඩ සහ එවැනි ආකාරයේ වංචනික කටයුතු පිළිබඳව දැනුවත් භාවයක් රට තුළ නොතිබුණු නිසයි. ආකර්ෂණීය අලෙවි උපායන් භාවිත කරමින් පාරිභෝගිකයන්ගේ මුදල් ගසාකන මෙබඳු ජාවාරම්වලට එරෙහිව නීති රීති දැඩි කෙරෙන්නේත් ගෝල්ඩ් ක්වෙස්ට් වැනි ජාවාරම්කාරි සමාගම්වල උපායමාර්ග නිසයි. පිරමීඩ වංචාවක මූලික ස්වරූපය හඳුනා ගැනීමේදී පෙනී යන්නේ එහිදී අලෙවි කෙරෙන භාණ්ඩය හෝ සේවාව කිහිපදෙනකුට අතින් අත යැමය. නොඑසේ නම් අවසන් පරිභෝජනය අරමුණුකර නොගෙන අලෙවි වන බවයි. අනෙක එක් අයකුගෙන් තවත් අයකු අතට මෙම භාණ්ඩය පත්වන්නේ ගුණෝත්තර ශ්‍රේණියක ස්වරූපයෙනි. ඒ සැම ගනුදෙනුවකදීම පළමු කාණ්ඩය අත්පත්කර ගත් පාර්ශ්වයට කොමිස් මුදලක් හිමිවේ. පාරිභෝගික පදනම වැඩිවත්ම පිරමිඩයේ ඉහළින් සිටින පුද්ගලයන්ගේ කොමිස් ආදායමද ඉහළ යයි.

### පිරමිඩ වංචාවන්ගේ ඉතිහාසය

පිරමිඩ වංචාවන් ගැන විමසා බැලීමේදී 20 වන සියවස මුල් භාගයේ ඉතාලියෙන් ඇමරිකා එක්සත් ජනපදයට සංක්‍රමණය වූ චාර්ල්ස් පොන්සිගේ අලෙවි උපාය මහා සිද්ධි අධ්‍යයනයකි. ජාත්‍යන්තර තැපැල් කූපනයන් ඔස්සේ ඔහු විසින් එකතු කර ගත් මුදල පිරමිඩ ජාවාරම්වල ආරම්භක අවස්ථාව ලෙස පැවසිය හැක. ජාත්‍යන්තර තැපැල් කූපන (International Reply Coupons) සඳහා ඇමරිකාවේ ගෙවන මුදල සහ ජාත්‍යන්තරව හෙවන මුදල ඇසුරින් ලාබ ඉපැයීම පොන්සිගේ ප්‍රධාන උපාය මාර්ගය විය. චාර්ල්ස් පොන්සි තම ඇමරිකානු ආයෝජකයන් පොළඹවා ගනු ලැබුවේ අඩු මිලට ඇමරිකාවේදී මිලදී ගන්නා ජාත්‍යන්තර තැපැල් කූපන ඩොලරය සඳහා ඉහළ වටිනාකමක් ලබාදෙන වෙළෙඳ පොළ තුළදී විකිණීමෙන් ඉහළ ආදායමක්ද ලබාගත හැකි බව ස්ථිර කරමින්ය. ඔහුගේ පැහැදිලි කිරීම්වලට අනුව ජාත්‍යන්තර තැපැල් කූපනයන්ගෙන් දින 45 කදී සියයට 50 ක ලාභයක්ද දින 90 කදී සියයට 90 ක ආදායමක් ලබාගත හැකියි. මෙසේ ආයෝජනය කළ මුදල දින 90 ක් තුළදී දෙගුණකර දෙන ශිෂ්ට සම්පන්න විධික්‍රමයක් තවත් නොවන බව වටහා ගත් ආයෝජකයෝ චාල්ස් පොන්සිගේ ආකර්ෂණීය අලෙවි උපායට රැවටී අතිවිශාල මුදලක් ඔහු අතට පත් කළෝය. පොන්සි තමන්ගේ ආයෝජකයන්ට කියූ ආකාරයටම මුදල් යොදවා ජාත්‍යන්තර තැපැල් කූපන මිලදී නොගත් අතර මුලින්ම මුදල් යෙදවූ පුද්ගලයන්ගේ ලාභය ගෙවීමට ඔහු එකතු කරගත් මුදල්වලින් කොටසක් යෙදවූ අතර ඉතිරිය තම සුඛ විහරණය සඳහා යොදා ගත්තේය. මෙහි ප්‍රතිඵලය ලෙස චාර්ල්ස් පොන්සිගේ සමාගම බංකොලොත්භාවයට පත් වූ අතර පොන්සි ඇමරිකානුවකු නොවූ බැවින් හෙතෙම නැවත ඉතාලියට පිටුවහල් කරන ලදී.

### ගෝල්ඩ් ක්වෙස්ට් වංචාව සහ මහබැංකුවේ ක්‍රියාමාර්ග

ශ්‍රී ලංකා මහබැංකුවේ සේවය කළ කීර්තිමත් නියෝජ්‍ය අධිපතිවරයකු වූ ඩබ්ලිව්. ඒ. විජයවර්ධන පිරමිඩ වංචාවන් පිළිබඳව සිදුකළ මහජන දේශනයකදී අපූර්ව හෙළිදරව්වක් කළේය. 2004 - 2005 කාලවකවානුවේදී ලංකාව පුරාම ඉතා කෙටි කාලයක් තුළ ව්‍යාප්ත වු ගෝල්ඩ් ක්වෙස්ට් ජාවාරම්කරුවන් මහජන මුදල් වංචනිකව එකතු කිරීමට ආකර්ෂණීය සංවාද මණ්ඩප පිටපළාත්වල හෝටල්වල සංවිධානය කළ අතර ඒ සැම දැනුවත් කිරීමේ වැඩසටහනක්ම මහබැංකුවේ ආශිර්වාදය සහිතව පවත්වාගෙන යන්නේ යැයි ආයෝජකයන්ට හඟවනු පිණිස ව්‍යාජ මහබැංකු අධිපතිවරයකු සැම සංවාදයකට රැගෙන ආවේය. අනුරාධපුරයේ පැවති එබඳු වැඩමුළුවකට ඩබ්ලිව්. ඒ. විජයවර්ධන මහතාද ආයෝජකයකු වෙසින් සහභාගි වූ අතර ගෝල්ඩ් ක්වෙස්ට් සමාගමේ වංචනිකයකු තමා මහබැංකුවේ නියෝජ්‍ය අධිපති බව විජේවර්ධන මහතා ඉදිරියේ පෙනීසිටියේය. මේ සිදුවීම හරහා මේ ක්‍රියාදාමයේ ව්‍යසනකාරී බව වටහාගත් විජේවර්ධන මහතා මහබැංකු නියෝජ්‍ය අධිපතිවරයා ලෙස තමන්ට පැවරී ඇති බලතල අනුව ගෝල්ඩ් ක්වෙස්ට් වංචාවට එරෙහිව උපරිම ලෙස ක්‍රියාකරන තැනක සිටි නිසා පමණක් නොව මුදල් අමාත්‍යාංශයේද සහාය ඇතිව 2005 වසරේදී බැංකු පනතට සංශෝධන ගෙන එමින් පිරමීඩ ස්වරූපයේ අලෙවි ජාවාරම් රට තුළ තහනම් කළේය.

### ආකර්ෂණීය අලෙවි උපායන් සහ ව්‍යාජ සංකල්ප

බහුවිධ අලෙවි ක්‍රම, ජාලගත අලෙවි ක්‍රම ආදි කවර නමකින් හැඳින්වුවද ඒ සැම අලෙවි විධික්‍රමයක්ම අවසන් වන්නේ පිරමිඩ ස්වරූපයේ මූල්‍ය ජාවාරමකිනි. මෙම අනීතික අලෙවි උපායන් ප්‍රචලිත කරන්නන් ඔවුන් අලෙවිකරන නිෂ්පාදනය පිළිබඳව සියලුදේ දන්නා අතර ඔවුන් සමඟ එකතුවන සාමාජිකයන් පවසන්නේ හැකිතරම් නිෂ්පාදනය ප්‍රචලිත කරමින් වැඩි වැඩියෙන් සමාජිකයන් එකතුකර ගන්නා ලෙසයි. ගෝල්ඩ් ක්වෙස්ට් සමාගම අලෙවිකරන රන් පවුම මිලදී ගන්නා මුදලට වඩා වටිනාකමින් යුක්තවන බවත් එය කලක් තබාගෙන රන්මිල ඉහළ ගිය අවස්ථාවකදී මුදල්කර ගැනීමෙන් ඉහල ලාභයක් අත්කර ගත හැකි බවත් පැවසුවද අවසානයේදී හෙළිදරව් වූයේ එහි අඩංගු රන් ප්‍රමාණය සැබෑ ආයෝජනයෙන් 1/3 කටත් අඩු බවයි. ගෝල්ඩ් ක්වෙස්ට් සඳහා වැඩිවශයෙන් ආකර්ෂණය වූයේ වෛද්‍ය, නීතිඥ, ඉංජිනේරු වැනි වෘත්තිකයන්ය. ඒ අනුව ගෝල්ඩ් ක්වෙස්ට්හි ආකර්ෂණය වූ අලෙවි උපායන් සිතාගත හැක. මීට අමතරව පුවත්පත් මගින්ද මේ සමාගම මෙතෙක් තිබූ ජනතා විරෝධය සමනය කිරීම සඳහා අපූර්ව උපායමාර්ගයක් අනුගමනය කළේය. ජාතික පුවත්පත් කිහිපයක ව්‍යාපාරික කතුවරුන් සහ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදින් කණ්ඩායමක් හොංකොං වෙත ගෙන ගොස් සත්කාර ලබාදුන් අතර ඊට කෘතගුණ දක්වනු පිණිස පිරමිඩ ආයෝජන පිළිබඳව වචනයකුදු නොලියා කුණු නැති හොංකොං පුරවරය සඳහා ලිපියක් ලියා ගෝල්ඩ් ක්වෙස්ට් සමාගමට සූජාතභාවයක් ලබාදීමට කටයුතු කළ විප්ලවවාදියකුගේ සිතුවිලි ලියා විදුදය සම්මාන ලැබූ දේශප්‍රේමී මාධ්‍යවේදියාගේ සටහන දැනුදු සිහියට නැගේ.

### ගෝල්ඩ් ක්වෙස්ට් සිට වෙස්ට් ලයිෆ් දක්වා

ගෝල්ඩ් ක්වෙස්ට් පිරමිඩ ජාවාරම්කරුවන්ගේ මූලික ඉලක්කය ආයෝජනය තුළින් කෙටිකාලීන ලාභ ඉපැයීම විය. ඒ සඳහා ආයෝජකයන්ට සිහින ලබාදෙමින් තම ආයෝජන ක්‍රමවේදයේ සූජාතභාවය පිළිබඳව දිගින් දිගටම පෙනී සිටියේය. ලංකාවට කලින්කලට පැමිණි පිරමිඩ ජාවාරම්කරුවන් තම අලෙවි උපාය මාර්ග කාලානුරූපිව වෙනස්කරගෙන ඇති බව පෙනීයයි. මීට කලකට ඉහතදී ක්‍රියාත්මක වු ටියැන්ස් සමාගම වඩා පෙන්වා දුන්නේ නිරෝගිභාවය සහ සමේ පැහැපත්භාවය ගැනය. ටියැන්ස් පිරමිඩ වංචාව ඔස්සේ වැඩි වශයෙන් ආකර්ෂණයකර ගත්තේ කාන්තාවන්ය. තැන්පතු මුදලක් සමාගමේ තබා එයට හිලව්වන ලෙස ටියැන්ස් රූපලාවන්‍ය උපකරණ සහ රුව වඩවන නිෂ්පාදන සාමාජිකයන්ට බෙදාදෙන ලදී. තැන්පතුව සාමාජික ගාස්තුවක් වූ අතර සමාගමෙන් ලබා ගන්නා නිෂ්පාදන සඳහා අත්පිට මුදල් ගෙවිය යුතු විය. සමාගමට අලුතින් බඳවා ගන්නා සාමාජිකයන් හරහා සාමාජිකයන් හඳුන්වාදෙන පුද්ගලයන්ට ඔවුන් විසින් අලෙවිකරන නිෂ්පාදනයෙන් කොමිස් මුදලක්ද, ලකුණු ප්‍රමාණයක්ද හිමිවේ. රට පුරා බාධාවකින් තොරව ටියැන්ස් විසින් එකතුකර ගත් මුදල රුපියල් කෝටි 3 කට ආසන්න බව ඒ පිළිබඳව පරීක්ෂණ පැවැත්වූ රහස් පොලිස් නිලධාරියකු ලියුම්කරු සමඟ පැවසුවේය. මාධ්‍ය මඟින් මේ ජාවාරම ගැන හෙළිදරව් කිරීමෙන් අනතුරුව ටියැන්ස් හි කොළඹ ක්‍රියාකාරකම් මඳකට නැවතුනත් පිට පළාත්වල මේ ජාවාරම තවදුරටත් පවතින බව දැනගන්නට තිබේ.

පිරමිඩ ස්වරූපයේ ජාවාරමක නියැලුණු 'වෙස්ට් ලයිෆ්' නම් වූ සමාගම මීට ඉහතදී අලෙවි කළේ ගෘහ විදුලි උපකරණ ජාලගත අලෙවිකරණය ලෙස හැඳින්වුවද සපුරාම පිරමිඩ ස්වරූපයේ වනාන්තරයක් වූ මෙහිදි විකුණන භාණ්ඩ සඳහා සමාගම වගකියන්නේ නැත. මෙයට විරෝධය එල්ලවීමත් සමගම වෙස්ට්ලයිෆ් උපක්‍රමය මාරුකරමින් සමාජයේ අතිශය සංවේදි මාධ්‍යයක් ඔස්සේ තම ජාවාරම්කාරි අලෙවි උපාය දියත් කළේය. එනම් ආගමට මුවාවී පිරමිඩ ජාවාරම දියත් කිරීමයි. කලින් භාණ්ඩ වෙනුවට දැන් වෙස්ට් ලයිෆ් අලෙවිකරන්නේ දඹදිව වන්දනා පැකේජයන්ය. මෙයත් කලින් මෙන්ම වැඩිපිරිසක් සහභාගි කරවීමේදී කොමිස් හා ලකුණු ලැබෙන්නකි. එයින්ද නොනැවතී තම සමාගම කෙරෙහි සමාජ මතය වෙනස්කිරීමට බෞද්ධ චිත්‍රපටද නිර්මාණය කළේය.

## මාසික ආර්ථික විමසුම



ඉදිරිපත් කිරීම
ප්‍රවීන ආර්ථික විශ්ලේෂක
වින්සන් මර්වින් ප්‍රනාන්දු

### ජනයාගේ ලෞකික ආශාවල තරම මනින දර්ශකය

පසුගිය ආර්ථික විමසුමෙන් අප කථා කළේ 'ආදම් සහ ඒවගෙන්' ඇරැඹි මිනිස් ජීවිත අද වන විට බිලියන 7 ඉක්ම වූ බවය. මේ කවර මිනිස් ජීවිතයක වුවද ප්‍රධාන ලෞකික ආශා තුනක් තිබේ: එකක් නම් ඉපදුනු හැම කෙනකුම පතන 'දීර්ඝායුෂ' යි. අසනීප වු විට වහාම අප බෙහෙත්හේත් ගන්නේ ඒ නිසාය. ඉපදුනු හැම කෙනකු ම දෙවනුවට අපේක්ෂා කරනුයේ කවර හෝ ඉගෙනීමක යෙදීමය. මන්ද හැම කෙනකුටම ජීවත් වීමට කවර හෝ 'දැනුමක් හෙවත් අධ්‍යාපනයක්' අවශ්‍ය නිසාය. ඉපදුනු දරුවාට අවුරුදු දෙක, තුනක් ගතවත්ම ළදරු පාසල් කරා යොමුකරන්නට දෙමාපියන් වෙහෙසෙන්නේ ඒ නිසාය. ඉපදි වැඩිවියට පත්වත්ම දෙමාපියන්ගේ රැකවරණයෙන් මිදි ස්වාධීනව නැගී සිටීමට එනම් හොඳ 'ජීවන තත්ත්වයක්' ළඟාකර ගැනීමට අපේක්ෂා කිරීම තෙවැනි අරමුණයි. මෙය වෙනත් ආකාරයකින් කියතොත් මුදල් ඉපැයීමට උත්සහ කිරීමය. මුදල් ඉපයීමට බැරි නම් මුදල් උපයන අයගෙන් සිඟා කන්නේද ඒ අරමුණ සාක්ෂාත් කර ගන්නටය.

රටක සංවර්ධනයේ සියළු මට්ටම්වලදි අත්‍යවශ්‍ය හැකියාවන් තුන ලෙස සලකන ඉහතින් දැක් වූ දීර්ඝායුෂ, අධ්‍යාපනය සහ ජීවන තත්ත්වය යන සංරචක තුන පදනම් කරගෙන රට රටවල් ජනයාගේ මානව සංවර්ධනයේ (Human Development) තරම මැනීමට මානව සංවර්ධන දර්ශකය (Human Development Index - HDI) නමින් දර්ශකයක් 1990 සිට සකස් කරයි. මෙම දර්ශකය සකස්කරන්නේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන (UNDP) ආයතනයයි. එම දර්ශකයේ සංරචක තුනක් තිබේ.

**1. උපතේදී ආයු අපෙක්ෂණය -** දීර්ඝායුෂ මැනීමට දායකවන සෞඛ්‍යය හා පෝෂණ තත්ත්වය මැනීමට මෙම විචල්‍යය යොදා ගනී. මෙහි උපරිම අගය අවුරුදු 83.2 ක් ලෙස සහ අවම අගය ලෙස අවුරුදු 20 ක් ලෙස යොදාගෙන ආයු අපේක්ෂණ දර්ශකය සකස් කරයි.

**2. දැනුම -** මෙය මැනීමට අධ්‍යාපනය ලද වසර සංඛ්‍යාවේ මධ්‍යයන අගය (උපරිම 13.2 අවමය 0), අධ්‍යාපනය ලැබීමට අපේක්ෂිත වසර සංඛ්‍යාව (උපරිම 20.6, අවම 0) සහ සංයුක්ත අධ්‍යාපන දර්ශකය (උපරිම 0.951 අවම 0) වශයෙන් උපදර්ශක 3 ක් යොදා ගනී.

**3. ජීවන තත්ත්වය -** මේ සඳහා ක්‍රය ශක්ති සමාජ ඒකපුද්ගල ආදායම (Purchasing Power Parity Per Capita Income) යොදා ගනී (උපරිම 108.3, අවම 0).

මේ එක් එක් අංශයට අදාළ එක් එක් රටේ සත්‍ය අගය යොදාගෙන පහත දැක්වෙන සූත්‍රයට අනුව මානව සංවර්ධන දර්ශකය සකස් කරගනී.

$$HDI = \frac{\text{සත්‍ය අගය - අවම අගය}}{\text{උපරිම අගය - අවම අගය}}$$

ඉහත සූත්‍රයට ආයු අංකනය, දැනුම, හා ආදායම් දර්ශක වෙනම සකස්කොට ඒ දර්ශන 3 එකතුකොට, 3 න් බෙදා සමස්ත HDI දර්ශකය සකස් කරගනු ලැබේ. මෙය සකස් කළ දර්ශකයන්ට අනුව ලෝකයේ රටවල ජීවත්වන බිලියන 7 ක ජනයාගේ මානව සංවර්ධන දර්ශක අගයන් ගණනය කොට එය ප්‍රකාශයට පත් කරයි. ඒ ගැන සොයා බැලීම වැදගත්ය.

ලෝකයේ මානව සංවර්ධනය අතින් ඉහළම රටටවල් 5 ලෙස සලකන්නේ පහත දැක්වෙන රටවල්ය.

**රට හා දර්ශක අගයන් මෙසේ දැක්වේ.**

| | | | |
|---|---|---|---|
| නෝර්වේ | 0.943 | ඕස්ට්‍රේලියාව | 0.929 |
| නෙදර්ලන්තය | 0.910 | ඇමරිකාව | 0.910 |
| නවසීලන්තය | 0.908 | | |

ලෝකයේ පහළම මානව සංවර්ධනයක් ඇති රටවල් ලෙස සලකනුයේ චැඩ්, මොසැම්බික්, බුරුන්ඩි, නයිගර්, කොංගෝ යන රටවල්ය. අප ජීවත්වන ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන දර්ශකය 0.691 කි. දකුණු ආසියාවේ රටවල් අතර මානව සංවර්ධන දර්ශකය ඉහළම රට ශ්‍රී ලංකාවයි. (වගුව බලන්න)

**රට හා දර්ශක අගයන් මෙසේ දැක්වේ.**

| | | | |
|---|---|---|---|
| ඉන්දියාව | 0.547 | පකිස්තානය | 0.504 |
| බංග්ලාදේශය | 0.500 | නේපාලය | 0.458 |
| මාලදිවයින | 0.661 | ශ්‍රී ලංකාව | 0.691 |

එහෙත් ආසියාවේ අනිකුත් රටවල් අතර එනම් මලයාසියාවට (0.761), සිංගප්පූරුවට (0.866), සාපේක්ෂව අඩු තැනක පසුවන අතර චීනයට (0.687) වඩා ඉහළින් සිටි. මානව සංවර්ධනය අතින් ශ්‍රී ලංකාව ලෝකයේ රටවල් අතර 97 වැනි රටයි.

මෙම දර්ශකයේ වැදගත්කම නම් 'සංවර්ධනය' (Development) යන වචනයේ අර්ථය කෙනකුට සල්ලි ගොඩාක් තිබෙන එකක් පමණක් නොව, සෞඛ්‍ය සම්පන්නව, හොඳ කෑම බීම සහිතව දිගු කාලයක් දුකක් නැතිව ජීවත් වීමට හැකිවීම සහ තමා ගැන, රට ගැන, ලෝකය ගැන හොඳ දැනුමක් සහිතව ජීවත් වීම යන කරුණ ද වැදගත් බව හුවා දැක්වීමය. එහෙත් ඒ කාරණා තුන පමණක් ලෞකික වශයෙන් ගත්තත් ප්‍රමාණවත් නොවේ. එමගින් මිනිසුන් අතර තිබෙන ඇති නැති පරතරය පෙන්නුම් කරන්නේ නැත. එමගින් දුප්පත්කමේ තරම දැක්වෙන්නේ නැත. රටක තිබෙන මානව අයිතින් සුරැකීම, ආරක්ෂාව, දේශපාලන නිදහස, ආර්ථික නිදහස, එකමුතුකම, සාමය, දැක්වෙන්නේ නැත. ඒ ඒ අංශවල ගුණාත්මක තත්ත්වය ගැන ද යමක් නොකියැවේ. ඒ නිසා රටක මානව සංවර්ධනයේ දියුණුව මැනීම සම්බන්ධයෙන් මානව සංවර්ධන දර්ශකය (HDI) හොඳම දර්ශකයක් ලෙස දැක්විය නොහැකිය.

අප මතු කළ අඩුපාඩුද මඟ හරවමින් දර්ශකය දියුණු කළත්, මිනිසාගේ 'මිනිස්කම' එයින් පිළිබිඹු වන්නේ නැත. ඒ සඳහා මිනිසා ආධ්‍යාත්මික වශයෙන්ද සංවර්ධනය වීම අවශ්‍ය වේ. මේ අනුව සල්ලි තිබුණත් කෙනකු රෝගි නම් වැඩක් නැත. සල්ලි හා නිරෝගිවත් බව තිබුණත් කෙනෙක් මෝඩනම් වැඩක් නැත. සල්ලි, නිරෝගිවත් බව හා උගත්කම තිබුණත් මනුෂ්‍යකම් නැත්නම් වැඩක් නැත. කෙනකුට ආගමික ජීවිතයක් අවශ්‍ය වන්නේ ඒ නිසාය.

දැල්වෙන පහන්

# ගරු ලීනස් කුරුකුලආරච්චි පියතුමා

මහනුවර අම්පිටිය ග්‍රාමයේදී ජනිත පින්බර පුත් කුමරුන් ලීනස් කුරුකුලආරච්චි නම් විය. තම ජීවිතයම එකම යාගයක් කළ මහා පූජකයාණන් වූ ක්‍රිස්තුතුමන්ගේ අනුගාමිකයකුව නොනැවතී උන්වහන්සේගේ 'අනුප්‍රාප්තිකයන්' සේ අද දක්වා පූජාවන්නට අත්පොත් තැබුවේ යන්තම් ළපැටි විය පසුකොට ළමා විය එළඹෙන විටය. පූජා උදව් දරුවන්සේ පූදසුන අබියසට පිවිසි උන්වහන්සේ මේ දක්වා පූදසුන අබියස අනේකාකාරයෙන් පූජා වන්නාහ.

දිවිමගේ හත්වැනි දශකය පසුකොට, අටවැනි දශකය වෙත පිළිපන් මෙම සභා පිතෘන් වහන්සේ කුරුණෑගල පදවිය තුළ දැනුමෙන්, බුද්ධියෙන්, ප්‍රඥාවෙන් හා බහුලවූ අත්දැකීම් මගින් මුහුකුරා ගිය ශ්‍රේෂ්ඨ පඬිවරයකු ලෙස හැඳින්වීම නිවැරදිය. විශ්ව කෝෂයක් බඳු උන්වහන්සේගේ ශක්තිය දෙවිඳුන් වෙතින් ලද සුවිශේෂි වූ තලෙන්තුවකි.

ගවේෂණාත්මක කටයුතු වල යෙදී අපගේ කිතුනු උරුමයන්හි යටගියාව සොයා ජනතාව අතට පත්කිරීමට වඩාත් කැමැත්තක් දක්වන ගරු ලීනස් කුරුකුලආරච්චි පියතුමන් විසින්, සංස්කරණය කරන ලදි. 'කතෝලික අපේ උරමැය' නම් ග්‍රන්ථයේ බොහෝදුරට අන්තර්ගත වන්නේ මේ අපූරු මතකයි.

1932 සැප්තැම්බර් 23 දින කුරුකුලආරච්චිගේ දොන් ජෝසප් සහ චාලට් වික්‍රමසිංහ යුවළට දාව උපත ලබා 1958.12.21 ද පූජක වරම් ලැබීය. හලාවත පදවියේ හා කුරුණෑගල පදවියේ මීසම් සේවාවෙ නියැලි එතුමාගේ පූජක දිවියේ රජත ජයන්තිය 1983 දී පොල්ගහවෙල දී සැමරීය.

කුරුණෑගල පදවියේ ලේඛකාධිකාරි ලෙස 1995 සිට කටයුතු කළ එතුමා විශ්‍රාම ලැබුවේ 2007 දීය. පූජක දිවියේ රජත ජයන්තිය 1983.12.21 සැමරූ එතුමා 'කතෝලික අපේ උරුමය' ඓතිහාසික ග්‍රන්ථය 2008 දෙසැම්බර් 20 එළිදැක්වීය.

### 'අපේකම' ට මුල්තැන

මේ ශ්‍රේෂ්ඨ සභා පිතෘන් වහන්සේ තුළින් විද්‍යමාන වන විශේෂත්වය 'අපේකම' ට මුල්තැන දීමය. පුහු ආටෝප ප්‍රතික්ෂේප කරමින්, සිංහල භාෂාව ඇතුළු සිංහල සංස්කෘතියේ සියලුම හර පද්ධතීන් අගයමින් සරළ චාම් දිවිපෙවෙත තුළින් ආදර්ශයක් සපයන්නේය.

උන්වහන්සේගේ මව, බොදුනු පාර්ශවයකින් පැවත ආ අයකු නිසා එම ගති පැවතුම් ඇතුළු ගැමි කම උන්වහන්සේගේ ජීවිතය තුළට කිඳා බැස ඇති බවක් හැඟේ. කිතුනුවන් වූවත් අප සිංහලයන් වශයෙන් ජීවත් විය යුතු බව එතුමාගේ මතයයි. එම මතයෙහි පිහිටා දුක - කඳුළ මැද සිනාවක් නගමින්, අභියෝග මැද යොවුන් වියේ පටන් මෙතෙක් ආ ගමන ඉතා දුර වූවත්, 'ආමග කෙටියි - යා යුතු මග දුරයි'

දේව ඇරයුමට සවන් දුන්
අපේ ඇත්තෝ

යනුවෙන් පවසන්නේ තමන් කළ සේවාවෙන් සෑහීමකට පත්නොවී, තවත් සුවිසල් කාර්යභාරයක් ඉදිරියේ ඉටුකිරීමට තිබෙන බවක් හඟවමිනි.

ප්‍රදේශයේ ඓතිහාසික අගයෙන් යුත් ස්ථාන, ඓතිහාසික නටබුන්, පැරණි වෙහෙර විහාර යනාදිය පිළිබඳව විශේෂ ඇල්මක් දක්වන උන්වහන්සේ, එතුළින් අප මුතුන් මිත්තන්ගේ ඩහදිය සුවඳ දැනෙන බවක් පවසති. ඒමත දිගහැරෙන 'අපේකම' උන්වහන්සේගේ සිතගත ඇදබැඳ ගත් සංස්කෘතික උරුමය වූවා නිසැකය. සසුන් සේවාවේදී ද උන්වහන්සේ වැඩි ඇල්මක් දැක්වූවේ බොදුනු - ගැමි පරිසරයන්හි පිහිටි මීසම් වල සේවාව සඳහාය.

උන්වහන්සේගේ සේවා කාලය දෙස ආපසු හැරී බලන විට. එය ඉතා අභියෝගාත්මක බව පෙනේ. විදුලිබලය, ජල පහසුකම්, සුව පහසු මීසම් ගෘහ යනාදිය එදා නොතිබිණි. කුප්පිලාම්පු දල්වාගෙන පාලු කාමරවල නැවතී, ඉතා දුෂ්කර ලෙස එදා උන්වහන්සේ සේවය ඇරඹූහ. මහගල්ගමුව, නිකවැරටිය, මහව යන දුෂ්කර පෙදෙස්වලදී පාපැදියෙන් හෝ පොදු ප්‍රවාහනය ගමන් බිමන් සඳහා යොදාගැනිණි. එවන් පසුබිමකින් ඇරඹි සසුන් සේවාව, අද වනවිට දීපව්‍යාප්තව පතළ කීර්ති කදම්භයක් ගෙන දීමට සමත් වී ඇත.

1987 දී හලාවත පදවියෙන් කුරුණෑගල වෙන්කිරීම ලංකා කිතුනු සාසන ඉතිහාසයෙහි සුවිශේෂි කඩඉමක් විය. එවකට හලාවත රදගුරු අතිඋතුම් ප්‍රැන්ක් මාකස් හිමිපාණන් විසින් පදවි බෙදීමේ මූලික කාර්යභාරය පවරන ලද්දේ ගරු ලීනස් කුරුකුලආරච්චි පියතුමන් වෙතය. 1984 දී ඒ සඳහා පත්කරන ලද ත්‍රිපුද්ගල කමිටුවේ ප්‍රධානියා වශයෙන්, හලාවත පදවිය පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් කර, ශුද්ධාසනයට ඉදිරිපත් කිරීම සඳහා වාර්තාවක් සකස් කිරීම උන්වහන්සේ අතින් සාර්ථක අන්දමින් සිදුවීමේ ප්‍රතිඵලයක් ලෙසින් කුරුණෑගල පදවිය බිහිවිය.

ගරු ලීනස් කුරුකුලආරච්චි පියතුමා සිය විශ්‍රාමික සමය ගතකරනු ලබන්නේ මැටියගනේ ඉපැරණි දේවස්ථානයට අනුබද්ධ මීසම් ගෘහයේය. පදවි ලේඛකාධිකාරි වශයෙන් දිගුකලක් රදගුරු මැඳුරේ සේවය කිරීමෙන් ලද අත්දැකීම් හා දැනුම් සම්භාරය සිය ඓතිහාසික ගවේෂණ කටයුතු සඳහා රුකුලක් කරගත් උන්වහන්සේ මේ වන විට කුරුණෑගල පදවියේ පමණක් නොව දිවයිනේ බොහෝමයක් දේවස්ථානවල ඓතිහාසික තොරතුරු රාශියක් රැස්කරගෙන ඇත්තාහ.

ඒවා අධීක්ෂණය කිරීම හා ගවේෂණය කිරීම සඳහා පූර්ණකාලීනව කැපවීමට එතුමාට හැකියාව ඇත. නෑදෑ හිතවතුන්ගේ සහයෝගය හා ඇසුර ලබමින්, අසනීප තත්ත්වයන්ටද මුහුණ දෙමින්, රදගුරු මැඳුර හා නිබඳව සබඳතාවය පවත්වාගෙන, ගෙනයන්නාවූ දිවිය, ඇත්තෙන්ම හුදකලා හෝ විශ්‍රාම දිවියක් ලෙස හැඳින්විය නොහැකිය.

හලාවත හා කුරුණෑගල පදවියේ අඩසිය වසක් ඉක්මවූ සේවාවක් සපුරන ලද අතිගරු ලීනස් කුරුකුලආරච්චි පියතුමන්, අසූවැනිවියට එළඹෙන මේ සුවිශේෂි මොහොතේ, උන්වහන්සේ වෙත දෙවිසමිඳුන්ගේ බලවත් ආශිර්වාදය හා රැකවරණය ලැබේවායි ප්‍රාර්ථනා කරමු.

**කුරුණෑගල පදවි ජනසන්නිවේදන පර්ෂදයේ**
**ජසින්තා සපරමාදු**

# කුරුණෑගල කතෝලික රදගුරු වසමේ විශ්වාසයේ වසර ප්‍රකාශ කිරීම ඔක්තෝබර් 14 ඉරිදා

කුරුණෑගල රදගුරු වසමේ විශ්වාසයේ වසර ප්‍රකාශ කිරීම 2012 ඔක්තෝබර් 14 වන ඉරුදින මීසම් මට්ටමින් සංවිධානය කර ඇත. ඒ වෙනුවෙන් අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ විශේෂ නිවේදනය පූජාප්‍රසාදීන් වහන්සේලා විසින් ඉරුදින දිව්‍ය පූජාවේදී කියවනු ලබනු ඇති අතර විශ්වාසයේ වසර අරබයා වැඩපිළිවෙළක් සහිත විශේෂ අනුශාසනා පත්‍රයක් ද එදින නිකුත් කෙරෙයි. උන්වහන්සේ විසින් නිකුත් කළ නිවේදනය පහත පරිදි වේ.

රදගුරු ච. ලේ. අංක 01/2012

ගෞරවණීය පූජාප්‍රසාදින් වහන්ස, ගරු පැවදි සොයුරු සොයුරියනි, ප්‍රේමවන්ත සැදැහැවත් සහෝදර සහෝදරියනි,

අප වත්මන් සභා පැවැත්මේ වැදගත් සංධිස්ථානයක් වන වසරක් වෙත ඔබේ අවධානය යොමු කරනු කැමැත්තෙමි. දෙවන වතිකාන ජගත් මන්ත්‍රණ සභාවේ පනස් වන ජුබිලි වසර වෙනුවෙන් ද, කතෝලික සභා ධර්මෝපදේශය බිහිවී විසි වසර සපිරීම නිමිත්තෙන් ද, අති උත්තම සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමාණන් විසින් 2012 ඔක්තෝබර් මස 11 වන දින සිට 2013 නොවැම්බර් මස 24 වන දින ක්‍රිස්තු රජාණන්ගේ මංගලෝත්සවය දක්වා ඉදිරි වසර 'විශ්වාසයේ වසර' යනුවෙන් නම් කර ඇත. එය සමස්ත ශුද්ධ වූ සභාවේම අවධානය දිනා ඇති අතර අප ශ්‍රී ලංකාවේ ද සෑම රදගුරු වසමකම ක්‍රියාත්මක වන බව දන්වා සිටිමි.

කුරුණෑගල අප, රදගුරු වසමක් ලෙස පදවි ධර්ම සේවා සමුළුව පවත්වා එහි නිගමන ක්‍රියාත්මක කරමින් සිටින මේ අවධියේ 'විශ්වාසයේ වසර' වෙස්වලාගත් ආශිර්වාදයක් සේ සලකමු. සෑම වසරකම ශුද්ධාසනය විසින් ප්‍රකාශ කරනු ලබන තේමාවක් පදනම් කොටගෙන පදවි ධර්මදානීය ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වන බැවින් මේ වසර තුළ විශ්වාසයෙන් ගැඹුරට දියත් කරන්නට මම ඔබ සැමට ආරාධනා කරමි.

මේ වරප්‍රසාදීය වසර අරභයා විශේෂ අනුශාසනා පත්‍රයක් ද මා විසින් නිකුත් කරනු ලැබ ඇත. විශ්වාසයේ ජීවිතයේ දියඹට ගමන් කරන්නට දහම් සේවා සමුළු නිගමන ද සැලකිල්ලට ගෙන මෙහෙයුම් නිර්ණායක කිහිපයක් ද එහි අඩංගු වන බැවින් ඔබගේ කුඩා කිතුනු සංසවල ඒවා සාකච්ඡා කරමින් ක්‍රියාවට නංවන්නැයි ආරාධනා කරමි.

කරුණු මෙසේ හෙයින් අවසන් කොට අප සසුනිසුරාණන් වන 16 වන බෙනඩික්ට් ශුද්ධෝත්තම පියාණන් අනුව යමින් 2012 ඔක්තෝබර් මස 11 දින සිට 2013 නොවැම්බර් මස 24 දින දක්වා වසර කුරුණෑගල අප කතෝලික රදගුරු වසම තුළ 'විශ්වාසයේ වසර' ලෙස ගෞරව බහුමානයෙන් යුතුව මෙසේ ප්‍රකාශ කර සිටිම්හ.

ලෝ මැවුම්කාර දෙවි පියාණන් ද, අප ගැලවුම්කාර දේව පුත්‍රයාණන් ද, ජීවදායක ශුද්ධාත්මයාණන් ද වන ශුද්ධ වූ ත්‍රිත්වයේ ඒක දේවෝත්තමයාණන් වහන්සේගේ අනුහසින් අප ක්‍රියාදාමයන් සාර්ථක වේවා! විශ්වාසයේ අග රැජිණිය වී දේව අභිමතයට පක්ෂපාතී වූ දේව මෑණියන්ගේ මැදිහත් පිහිට ඔබ මත ගලා ඒවා! අප පදවි ආරක්ෂිකා ශුද්ධවූ ආනා මෑණියන්ගේ පිහිටාධාරය ඔබ සැමට ලැබේවා!

**අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා**
කුරුණෑගල කතෝලික රදගුරු හිමි

# සිංහල සිනමාවේ කතෝලික රැජන රුක්මණී දේවි

රුක්මණී දේවිය අසමසම නිළි රාජිණියයි. ගීත කෝකිල ධේනුවයි. ඇය සාමාන්‍ය කලා කාරියක් නොවේ. ඇය සිංහල කාන්තාවක්ද නොවීය. ඈ උතුරේ ද්‍රවිඩ පවුලකට දාව නුවරඑළිය රම්බෝව උපන් දැරියකි. ඇගේ නම ඇයගේ අයදුම්පතේ සටහන් වනුයේ 'රුක්මණී රාසම්මා ඩේසි ඩැනියෙල්' නමිනි. පසුකලෙක එය 'රුක්මණී දේවිය' විය. අප සැමගේම සදාදරණීය වූ 'ඩේසි අක්කා' විය. වයස අවු. 13 සිට මිය යන තුරා රුක්මණී දේවිගේ හඬ අපේ හඬක් කියා සිංහලයෝ ආඩම්බරෙන් පැවසූහ. මෙරට ද්‍රවිඩ ජාතිකයන්ට පවා ඇය ද්‍රවිඩ කාන්තාවක් බව අමතක විය. ඇය සිංහල, ද්‍රවිඩ, ඉංග්‍රීසි, ප්‍රංශ, ඉතාලි, ස්පාඤ්ඤ යන භාෂා ගණනාවකින් ගීත දහස් ගණනක් ගැයුවාය.

රුක්මණී දේවිය යන නාමය හා දිව්‍ය අප්සරාවක් වැනි රූපය ශ්‍රී ලාංකික කලාකාමී රසික හදවත් තුළ යුගයෙන් යුගයට රැව්පිළිරැව් නැංවූවකි. ඇයගේ 'සිරි බුද්ධගයා විහාරේ', 'මැවිලා පෙනේවි රූපේ' වැනි ගීත අසා දෙසවන් සනසා නොගත් කිසිම රසිකයෙක් එදා මෙදා නැත. භෞතිකව ඇය මිය ගියත් ආධ්‍යාත්මිකව ඇය තවමත් අප අතර ජීවමානව ජීවත්වන්නීය. රංගනයට හෝ ගායනයට ඇයට අභියෝගයක් නොවීය. ඇය අභියෝගයට අභියෝගයක් විය. 'ගීතයක් ගායනා කරන කොට මගේ මුළු ආත්මයම ගීතයට එකතු වෙනවා වගේ.' එතකොට මුළු හදවතින්ම හඬ ගලාගෙන එනවා. (රුක්මණී දේවිගේ වචන 1978.11.15 'දෙසතිය සඟරාව') රුක්මණී දේවිය යනු පරම්පරා කිහිපයකම ජීවත්වූ ශ්‍රේෂ්ඨ කලා ශිල්පිනියකි. නටන්නට, ගයන්නට, වයන්නට, රඟන්නට පමණක් නොව භාෂා පහක් චතුර ලෙස කතා කිරීමේ සහජ කුසලතාවයකින් හෙබි සිංහල සිනමාවේ නිළි රැජිණ ඇයයි. ජනප්‍රිය භාවයත් නිසග කලා කුසලතාවයත් එක ලෙස වූ සුසංයෝගයක මහර්ඝ ප්‍රතිඵලයක් ලෙස ඇයව හඳුන්වා දීමට පුළුවන. තමා ජීවත් වූ යුගය තුළ තම රටේ චින්තනය කෙරෙහි යම් බලපෑමක් ඇති කළ හැකි කලා ශිල්පියෙකු මෙන් ශිල්පියෙක් වේ නම් ඔහු මෙන් ඇයද එම රටේ සදාකාලිකය. එහෙයින් රුක්මණී අපඅතර සදාකාලිකය. ඇගේ කලා ජීවිතයෙන් අපේ ජීවිත වෙතට එල්ල කෙරෙන ආලෝක ධාරාවන් තුළින් අපට පසක් කරගත් දේ ලියා නිම කළ නොහැකිය. තමා ප්‍රගුණ කළ ශිල්පයට අවංකව, මුළු හදවතින්ම කැපවූ ශිල්පිණියකි. ඇය බාලවියේ පටන්ම තමන්ගේ විෂය කෙරේ මහත් වූ භක්තියකින් හා උනන්දුවකින් යුක්තවූ ඇය සංගීතය, රඟපෑම වැනි ඇගේ වෘත්තිය කටයුතු මහත් පූජනීයත්වයෙන් සැලකුවාය. රුක්මණී දේවිය මිනිස් වෙසින් ආ දෙව් දුවක් හැටියට බොහෝ සම කළහ. ඇය කලාකරුවන් අතර ප්‍රකටය. කෙසේ වුවද පටු ජාති, කුල, ආගම් මේ හැම සීමාවක්ම ඉක්මවා ජයගත් කලා ශිල්පිණියකි ඇය. ඇගේ ගායනා ශෛලිය ඇයටම උරුමවූ ස්වාධීන ශෛලියක් ලෙස හැඳින්විය හැකිය. ඇගේ ගායනා කිතු සමයෙන් හික්මවනු ලැබූ ආධ්‍යාත්මයක් හෙළි කරන්නක් වූවා මිස ඉන්දිය ශෛලියෙන් උපන්නක් නොවේ. ඇය තුන් සිංහලයේම ශ්‍රී ලංකාව පුරාම එකසේ ජනප්‍රියත්වයට පත්වූයේ ඒ නිසාය. ඇය බිහිවූ සමාජ සංස්කෘතික පසුබිම තුළ තබා අගය කරන විට රුක්මණී මෙරට කලා ක්ෂේත්‍රයේ පහළ වූ විශිෂ්ටතම කලාකාරිණිය ලෙස හැඳින්විය හැකිය. 'ශ්‍රී ලංකාවේ පහළ වූ නිළියන් අතරින් යථාර්ථවාදී නිරූපණය අග්‍රගණ්‍ය නිළිය රුක්මණී දේවිය බවට සැකයක් නැත.



විවිධ සම්මතයන් හා විවිධ වර්ණයන් ප්‍රකාශ කිරීමට උචිත කටපාඩමක් ඇය සතුව තිබුණු බව මා අවබෝධ කරගත්තේ 'වෙස් මුහුණු' නාට්‍ය නිෂ්පාදනය කිරීමෙනි. අධ්‍යක්ෂවරයකු ලෙස නිළියකගෙන් ලබාගත හැකි උපරිම කුසලතා මට ලබාගත හැකි වූයේ රුක්මණී දේවියගෙන් පමණි. ඇය තරමටම රංග කුසලතා අනෙක් නිළිය අයිරාංගනී සේරසිංහයි. එහෙත් රුක්මණී දේවි විසින් ප්‍රගුණ කළ සංගීත ඥාණය නිසාවෙන් හඬ හැසිරවීම අතින් ඇය අයිරාංගනී සේරසිංහ අභිබවා සිටිනවා' (ධම්ම ජාගොඩ) කලාකරුවන් පරිණත භාවයට පත්වීමට මූලික වන කරුණු 3 ක් ඇත. සහජ කෞශල්‍යය, පොත පතින් හා අත්දැකීමෙන් ලබාගන්නා අවබෝධය, සතතාභ්‍යාසය. මෙම අංශ තුනම රුක්මණී දේවී ප්‍රගුණ කළ බව පැහැදිලි සත්‍යයකි. යහපත් ගුරු ඇසුරක් ලැබීම ඇයගේ වාසනාවකි. මොහොමඩ් ගවුස් හා එච්. ඩබ්. රූපසිංහ, සසාද් හුසේන් ආදී සංගීත වේදීන්ගේ මඟපෙන්වීම ඇයට මනා රුකුලක් විය. රුක්මණී දේවියගේ ගායනා කෞශල්‍යය සනාථ කළ එක් සාක්ෂියක් ලෙස 'නමෝ මරියනි' ගීතය දැක්විය හැකිය. එය ඕස්ට්‍රේලියානු ජාතික සංගීතවේදිනියක වන ප්‍රන්ස් බර්ට් ගේ ස්වර නිර්මාණයකි. එමෙන්ම, ඇය පිළිබඳව සඳහන් කළ යුතුම තවත් කරුණක් වන්නේ ඇය රඟපෑ සෑම චිත්‍රපටයකම ඇය වෙනුවෙන් පසුබිම් ගී ගැයුනේ ඇයගේම කට හඬින් බවයි. ඇයගේ ජීවිතයේ එක් අභිලාෂයක් වූයේ වියපත් වුවද ජරාජීර්ණ තත්ත්වයට පත් නොවී අවසන් හුස්ම පොද හෙළීමටය. එහෙත් ඇගේ ඒ ප්‍රාර්ථනය ඉටුකරගන්නට අවස්ථාව නොලැබිණි. සිනිඳු දැල් කඩකින් වසා තිබූ ඇගේ මුහුණේ ස්වාභාවික කාන්තිය රුදුරු අනතුර විසින් උදුරා ගෙන තිබිණි. වසර තිස් හතරක් ගෙවී ගියද තවත් සතර තිස් වසරක් ගෙවුනද රුක්මණී දේවියගේ වියෝව තවමත් දැනෙන්නේ සිහිනයක් ලෙසින්මය. මට නම් තවමත් එය ඇදහිය නොහැකිය. ඇයතරම් දක්ෂ නිළියක් නැවත බිහිවූයේ නැත. ඔබ අප සැමගෙන් සමුගත් බව කිසි දිනෙක සැබෑවක් නොව සිහිනයක්වම පවතීවා. මරණය නමැති වෙරළින් ගොඩබැස අප හදවත් ඉවුරේ සදාතනිකව නවාතැන් ගන්නට සුවඳක් වී සැමදා අපව සුවඳවත් කර ඒ සුවඳ කිසිවකුට කෙලෙසින්වත් සොරා ගැනීමට නොහැකි වනු ඇත. සිංහල සංගීතය යම්තාක් මේ සිරිලක තුළ නිම්නාද දේවිද, සිංහල චිත්‍රපට කලාව මේ දෙරණ තුළ පවතීවා. රුක්මණී දේවිය යන නාමය යුගයෙන් යුගයට ඉදිරියට ඇදී යනු ඇත. රුක්මණී දේවිය නොමැති තැන සිංහල සිනමාවක් නොමැත. සිංහල සංගීතයේද හඬ ඇසෙන්නේ නැත.

බෝලවත්ත දිසා නායක
**ගරු සිල්වෙස්ටර් විජයකුලසූරිය පියතුමා**

**විශ්වාසයේ වසරේ දී ... 1 පිටුවෙන්**

විශ්වාසයේ වසරේ ධර්මෝපදේශ වැඩසටහන් ශක්තිමත් කිරීමටත්, වැඩිහිටි ධර්මෝපදේශ වැඩසටහනක් ඇරැඹීමටත් නියමිතය. ආගමික අධ්‍යාපනය නොලබන දරු දැරියන් පිළිබඳ සමීක්ෂණයක් කිරීමටත්, ඉන් අනාවරණය වන තොරතුරු මත පිහිටා පිළියම් යෙදීමට නියමිතය. මූලධර්මවාදීන්ට හා කතෝලික විශ්වාසයේ සත්‍යතාවන්ට එරෙහි අයගේ ප්‍රහාරයන්ට පිළිතුරු සපයන වැඩපිළිවෙලක් සැකසේ. කතෝලික පවුල් සවි ගැන්වීම සඳහා විශේෂ වැඩසටහන් ද සකස්වේ.



**පමුණුගම ගොන්සාල්වෙස් විදුහලේ ආදි ශිෂ්‍යයකු හා පමුණුගම ප්‍රදේශයේ පුත්‍රයකු වන ශ්‍රී ලංකා යුද හමුදාවේ මේජර් ජෙනරාල් තනතුරට උසස්වීම් ලැබූ මේජර් ජෙනරාල් ඩබ්. ඩී. ප්‍රේමසිරි වික්‍රමසිංහ මහතාව පිළිගැනීමේ උපහාර උළෙලක් හා තුති පිදීමේ දිව්‍ය යාගයක් පමුණුගම දෙව්මැඳුරේ දී විදුහලේ ආදි ශිෂ්‍ය සංගමය මගින් සංවිධානය කළහ.**

තුතිපිදීමේ දිව්‍ය යාගය කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූහ. දිව්‍ය යාගයේ දී ප්‍රේමසිරි වික්‍රමසිංහ මහතා හා මහත්මිය පඬුරු පිදීම සේයාරුවෙන් දැක්වේ. පමුණුගම මීසම් සේවක හා විදුහල්පති ගරු ආනන්ද විතාන, ජේ. ඩී. ඇන්තනි, රවීන් පෙරේරා පියතුමන් දිව්‍ය යාගයට හවුල් වූහ. **(බෙන්ජමින් කිරිහෙට්ටි)**

## මතුගම මංගල උළෙළින් සැදැහැ සිත් ප්‍රබෝධවත් වේ

**මරියතුමිය තම කැඳවීම සමඟ විශාල අභියෝගයට මුහුණ දෙනවා. විවාහයට පෙර දරුවකු පිළිසිඳීම එකල සමාජ චාරිත්‍රයට විරුද්ධ දෙයක්. නමුත් මේ සියලු අභියෝග හමුවේ ඇය නොසැලී ජේසු කුමරුව මේ ලෝකෙට ජනිත කරනවා. ඇගේ දිවියේ තිබූ වටිනා ගුණාංග ඔබේ ජීවිතයට එකතු කරගන්න. මෙතුමියව ඔබගේ ජීවිතයේ පූර්වාදර්ශය කරගන්න යැයි මා අද මිදීමේ අප ස්වාමිඳුවගේ මංගල්‍යය සමරන ඔබට ඇරියුම් කරනවා.**

මොරටුව සා. සෙබස්තියන් විදුහලේ අධ්‍යක්ෂ ගරු බොනි ප්‍රනාන්දුපුල්ලේ පියතුමා මතුගම සා. මරියා දෙව්මැඳුරේ 103 වන වාර්ෂික මංගල්‍යයේ දී පැවසීය.

සැඳෑ මෙහෙය රදගුරු මඩුල්ලේ සහකාර ලේකම් ගරු ටෝනි මාටින් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. මෙවර මංගල්‍යය සඳහා ජනතාව වඩාත් ආධ්‍යාත්මිකව සූදානම් කිරීමට මීසම් සේවක ගරු දෙව්ශාන් අසංක පියතුමා කටයුතු කළේ ය. මංගල්‍යයට සූදානම් වීමේ වැඩසටහන් ලෙසින් විවාහක යුවළ සඳහා ගරු පැට්‍රික් පෙරේරා, ජනවන්දනාව පිළිබඳව ගරු ඉන්ද්‍රජිත් පෙරේරා පියතුමන් සහ තරුණ පිරිස සඳහා මහින්ද නාමල් මහතාගේ විශේෂ වැඩසටහන් පැවැත්වුණි. **(කුමර නයනජිත්)**



**උස්වැටකෙයියාව තල්දියවත්ත ප්‍රදේශයේ ධීවර ජනතාවට මෙම මුහුදේ දිය නෑමට පැමිණෙන අයගෙන් ඇතිවන පීඩන පිළිබඳව සාකච්ඡාවක් උස්වැටකෙයියාව මීසම් සේවක ගරු අයිවන් පීටර්ස් පියතුමාගේ හා නියෝජ්‍ය ඇමැති සරත් කුමාර ගුණරත්න, පමුණුගම පොලිස් ස්ථානාධිපති මහතුන්ගේ සහභාගිත්වයෙන් තල්දියවත්තේ දී පැවැත්වූහ.**

මෙම ප්‍රදේශයට පැමිණෙන අය මත්පැන් පානය කරමින් අශෝභන ලෙස හැසිරීම නිසා තල්දියවත්ත ජනතාවට ගැටලු රැසක් මතුවී ඇත. මේ අය මුහුදේ පමණක් නොව ගමම පාවිච්චි කරමින් ගමට මහත් තර්ජනයක් ද වී ඇත. මේ පිළිබඳව ප්‍රාදේශීය සභා මන්ත්‍රී ස්ටැන්ලි නෝබට්, ධීවර සමිති සභාපති කේ. අනුර පෙරේරා හා ගෘහණියන් පිරිසක් තමන්ට සිදුවී ඇති තර්ජන ගැටලු පිළිබඳව දැනුවත් කරන ලදි. මුහුද, පාර, ගම එකට ඇති හෙයින් මෙම ප්‍රශ්නය වඩාත් උග්‍ර වී ඇත. හමුදාව, නාවික හමුදාව, අදාළ උසස් නිලධාරින් ඉතා ඉක්මනින් කැඳවා මේ ගැන යම් ක්‍රියාමාර්ගයක් ගෙන තල්දියවත්ත ජනතාවට සහනයක් සැලසීමට පියවර ගැනීමට තීරණය විය. එහිදී ගරු අයිවන් පීටර්ස් පියතුමා සභාව ඇමතූ අයුරු සේයාරුවෙන් දැක්වේ.

## 2013 වසර සඳහා 6 වැනි ශ්‍රේණියට සිසුන් ඇතුළත් කරගැනීමේ විභාගය ශා. ජෝශප් විද්‍යාලය - කොළඹ 10

අයදුම්පත් නිකුත් කිරීම ඔක්තෝබර් මස 10, 11 සහ 12 යන දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා විද්‍යාලීය කාර්යාලයේ දී සිදුකෙරේ. විභාගය ඔක්තෝබර්මස 20 වැනි සෙනසුරාදා දින පැවැත්වෙන අතර එයට පෙනී සිටීමට ඉහත අයදුම්පත අනිවාර්ය වෙයි. අයදුම්පත් ලබා ගැනීමේ දී අයදුම්කරුගේ උප්පැන්න සහ ක්‍රිස්තියානි සහතික ඉදිරිපත් කළ යුතු බවද දන්වමි.

\- අධ්‍යක්ෂ පියතුමා -

## 2013 වසර සඳහා 6 වැනි ශ්‍රේණියට සිසුන් ඇතුළත් කරගැනීම සඳහා අයදුම්පත් නිකුත් කිරීම ශා. බෙනඩික් විද්‍යාලය - කොළඹ 13

2013 වසරේ 6 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා අයදුම්පත් නිකුත් කිරීම 2012 ඔක්තෝබර් මස 8, 9, 10, 11, සහ 12 යන දිනවල ප.ව. 1.30 සිට 3.30 දක්වා විදුහල් කාර්යාලයෙන් සිදුකෙරේ. අයදුම්පත් දෙමාපියන්ට පමණක් නිකුත් කරනු ඇත. ඒ සඳහා ★ දරුවාගේ උප්පැන්න සහතිකය ★ දරුවාගේ ක්‍රිස්තියානි සහතිකය, ★ කතෝලික පවුල් පොත ඉදිරිපත් කළ යුතුය.

\- අධ්‍යක්ෂ සහෝදරතුමා -

## සුබ උපන් දිනයක් වේවා! සඟ රැජිණියනි



**කඩලාන මීසම් සංඝය ආධ්‍යාත්මික නවෝදයක් තුළ ගොඩනඟන මීසම් සේවක ගරු ලලිත් පෙරේරා පියතුමන්ගේ අදහසක් අනුව දෙව්මවුන්ගේ උපන් දිනය දා කඩලාන මීසම් සංඝයම එකට එකතු වී මරිමවුන් හට තුති දෙන්නට පැවැති දිව්‍ය යාගයට විශාල පිරිසක් එක් වූහ.**

උපන් දින දිව්‍ය යාගයෙන් පසුව එම උත්සවය අප ජීවිත අවස්ථාවක් කරමින් උපන්දින කේක් කපමින් ගරු පියතුමන් උත්සවය අරුත්බර කළ අයුරු සේයාරුවෙන් දැක්වේ. දිව්‍ය යාගය ඉතා උසස් මට්ටමින් සංවිධානය කළ නිර්දෝෂ දේවමාතා සමිති සභාපති ඇතුළු නිලධාරින් ප්‍රදීපය කැමරාවට හසුවූ අයුරු. සහායක මීසම් සේවක ගරු මලින්ත චතුරංග පියතුමා ද උත්සව කටයුතු සංවිධානයට සහභාගි විය. **(සටහන - පී. රවින්ද්‍ර, ජේ. ඇන්ටනි ප්‍රනාන්දු, සේයා - මාරියස් කුරේ)**



හිටපු හමුදාපති ජනරාල් සරත් ෆොන්සේකා මහතා පසුගියදා රාගම තේවත්ත ලංකා අප ස්වාමිදුවගේ දෙව්මැඳුරේ ඉරිදා දිව්‍ය පූජාවට සහභාගි වීමෙන් අනතුරුව සිද්ධස්ථාන පාලක ප්‍රිය ජයමාන්න පියතුමා හමුවූ අයුරු, බස්නාහිර පළාත් සභා මන්ත්‍රී ඊ. සිරිකමල් ද සිල්වා මහතා ද ඡායාරූපයේ වෙයි.

## නාලවලාන ශු. මිඛායෙල් තුමන්ගේ දෙව්මැඳුරේ 132 වන වාර්ෂික මංගල්‍යය



**කුරුණෑගල පදවියේ නාලවලාන, ශු. මිඛායෙල් අග්‍රදූතයාණන්ගේ දෙව්මැඳුරේ වාර්ෂික මංගල මෙහෙය පසුගියදා කුරුණෑගල පදවි අනුනායක අතිගරු ඔස්ටින් මාකස් ප්‍රනාන්දු පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.**

සන්ධ්‍යා මෙහෙය කට්ටිමහන සිද්ධස්ථාන පාලක ගරු ටෙරන්ස් කන්නන්ගර පියතුමා පැවැත්විය. නාලවලාන මීසම් සේවක ගරු ලීනස් මැක්ලවුඩ් පියතුමාගේ මඟ පෙන්වීම යටතේ මීසම් සංඝය විසින් මෙම මංගල මහෝත්සවය සංවිධානය කර තිබිණි. පුත්තලම් දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හා ජ්‍යෙෂ්ඨ අමාත්‍ය මිල්රෝයි ප්‍රනාන්දු මහතා ද මීට එක් විය.

පඬුරු පෙරහරේ දී එළවළු වට්ටියක් පිදූ අයුරු **(සටහන එල්. කරුණාරත්න, සේයා - ජී. බී. එච්. ලිවේරා)**

## විශේෂ අවශ්‍යතා සහිත දරුවනට ඔබේ අතහිත ඕනෑ



**පසුගියදා ජාත්‍යන්තර ළමා දිනය සැමරුවෙමු. “ළමා ලෝකය ළමයින්ටමයි” මෙවර ළමා දිනයේ තේමාව විය. මේ වෙනුවෙන් විවිධ උත්සව වැඩසටහන් රැසක් ළමුන්ගේ ප්‍රමුඛතාවයෙන් දියත් කෙරිණි.**

අප සමාජයේ ජීවත් වන ළමුන් අතර සෙමින් මනස වැඩෙන දරුවන් බොහොමයක් වෙති. මොවුන් පිළිබඳව විශේෂ අවධානයක් යොමුවිය යුතුයි. මොවුන් විශේෂ අවශ්‍යතා සහිත දරුවෝ ලෙස හඳුන්වති. රටපුරා සිටින මෙවැනි දරුවෝ විවිධ ප්‍රදේශවල ඇති සුබසාධන මධ්‍යස්ථානයන්හි ඉගෙනුම ලබති. නමුත් මොවුන්ට වයස අවුරුදු 21 න් පසු ඉන් ඉවත් වීමට සිදුව ඇත. මීට පිළියමක් යෙදීමේ අරමුණින් හා මොවුන්ගේ අනාගතය සුබදායි කිරීමේ අරමුණින් යුතුව පසුගියදා මෙම ළමුන්ගේ දෙමාපියන් එකතුව මවුපිය සුබසාධක සංගමයක් කොටුගොඩ ලංසියාවත්තේ පිහිටි ගම් පුබුදුව මධ්‍යස්ථානයේ දී පැවැත්විණි. මේ සඳහා ගම් පුබුදුව මධ්‍යස්ථානය ලබා දීමට ඇන්තනි සිරිල් පියතුමා කටයුතු කළ බව සංගමයේ ලේකම් නෙලුනි රාජපක්ෂ මහත්මිය පැවසුවාය. වජිරා ඩයස් මහත්මිය මෙහිදී සභාව ඇමතූ අතර දරුවන්ගේ විශේෂ කුසලතා රංගනයක් ද අවසානයේ පැවැතිණි.

මෙම සුබ සාධක සංගමය මඟින් ඉදිරියේ දී මෙම ළමුන්ට වෘත්තීය පුහුණුවක් ලබා දීමට ද කටයුතු යොදමින් පවති. ජාති, ආගම් භේදයකින් තොරව විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ව මේ සඳහා යොමුකරවන ලෙස මෙම සුබ සාධක සංගමය සමාජයෙන් ඉල්ලා සිටී. මේ පිළිබඳව වැඩි විස්තර දුරකථන අංක 0713 248722 අමතා ලබා ගත හැකිය. **(කුමර නයනජිත්)**



**වත්තල සා. ආනා සමිතිය මඟින් ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් වෙනුවෙන් ආරම්භ කරන ලද ලංකා බැංකු රන් ගිණුම් සඳහා නියමිත පාස් පොත් බෙදා දීම වත්තල සා. ආනා දේවස්ථානයේ දී මීසම් සේවක ගරු බැසිල් වික්‍රමසිංහ පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ.**

උත්සවය අවසානයේ පියතුමා පාස්පොත් ලබාගත් දරුවන් තිදෙනකු සහ සමිති සාමාජිකයින් සමඟ එක්වී සතුට බෙදාගත් අයුරු.. **(නිමල් පෙරේරා)**



දුනකදෙනිය මීසමේ පොල්ගහඅගාර කානික්ක දේවමාතා දේවස්ථානයේ ඉදිකිරීම් කටයුතු සඳහා ‘කිතුනු මඟට සවියක්’ වැඩ සටහන යටතේ එක්සත් ජාතික පක්ෂ නියෝජ්‍ය නායක සජිත් ප්‍රේමදාස මහතා දුනකදෙනිය මීසම් සහයක ගරු ක්‍රිස්ටි කුමාර පියතුමාට රු. 50000/= ක මුදල් පරිත්‍යගයක් පිරිනැමූ අවස්ථාවයි මේ.

ශ්‍රියාංගණී පිලිපියා